# 2021

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT



## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
## தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை
## National Dangerous Drugs Control Board

NO 383, KOTTE ROAD,
RAJAGIRIYA.

+94 11 2868794 - 6

mail@nddcb.gov.lk

www.nddcb.gov.lk

MINISTRY OF PUBLIC SECURITY

# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2021

# පටුන

**පිටු අංකය**


1. හැඳින්වීම ........................................ 1
2. දැක්ම සහ මෙහෙවර ........................................ 2
3. සභාපතිනියගේ සමාලෝචනය ........................................ 3
4. මණ්ඩලයේ බලතල ........................................ 5
5. මණ්ඩලයේ සංයුතිය ........................................ 6
6. මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය ........................................ 8
7. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා ........................................ 13
8. සංස්ථා පාලනය ........................................ 14
9. මූල්‍ය හා කාර්යසාධනය විශ්ලේෂණය ........................................ 15
10. ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය ........................................ 16
11. කාර්ය මණ්ඩල පුහුණු වාර්තාව ........................................ 123
12. ආයතනික සමාජ වගකීම පිළිබඳ වාර්තාව ........................................ 127
13. විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව ........................................ 127
14. ආදායම් ප්‍රකාශය ........................................ 130
15. ශේෂ පත්‍රය ........................................ 131
16. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ........................................ 132
17. විගණකාධිපති වාර්තාව ........................................ 137
18. දස වසරක මූල්‍ය උද්ධෘතයන් ........................................ 145
19. තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ සාරාංශය ........................................ 147

ඇමුණුම I - ගිණුම්කරණ සටහන් ........................................ 151

# 01. හැඳින්වීම



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1986 අංක 41 හා 1990 අංක 21 දරන පනත්වලින් සංශෝධිත 1984 අංක 11 දරන අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර මෙම මණ්ඩලය රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

ඖෂධ අයුතු ලෙස භාවිතා කරන්නන්ට අදාළව වැළැක්වීමේ හා පාලනය කිරීමේ, ප්‍රතිකාර කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා සමාලෝචනය කිරීම හා එම ප්‍රතිපත්තියට අදාළව අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම භාර ප්‍රධාන ජාතික ආයතනය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වේ.

# 02. දැක්ම සහ මෙහෙවර

## දැක්ම

“මත්ද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම”

## මෙහෙවර

“අදාල සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා එලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම”

## 03. සභාපතිනියගේ සමාලෝචනය



රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධව වගකියන සහ වගවන ප්‍රධාන රාජ්‍ය ආයතනයයි. එය 1984 අංක 11 දරන අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවා ඇත. තිරසර සංවර්ධන ඉලක්කවලට අනුකූලව උපායමාර්ග හා ප්‍රතිපත්ති මඟින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා දරිද්‍රතාව අවම කිරීම, අපරාධ වැළැක්වීම සහ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීම මූලික අරමුණු කරගනිමින් මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම සඳහා දීප ව්‍යාප්තව තම සේවාවන් ක්‍රියාවට නංවනු ලැබේ. තවද මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව කාලානුරූපීව සමාලෝචනය කිරීම මෙන්ම ඒකාබද්ධ යාන්ත්‍රණයක් යටතේ ක්‍රියාත්මක වෙමින් මත්ද්‍රව්‍ය භාවිතය හා ඒ ආශ්‍රිත අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම සම්බන්ධයෙන් අප ආයතනය කටයුතු කරනු ලබයි. එමෙන්ම ශ්‍රී ලංකා රජය විසින් අත්සන් කරනු ලැබ ඇති එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් ප්‍රකාරව මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් ජාත්‍යන්තර හා කලාපීය සහයෝගීතාවය ලබාගනිමින් ගෝලීය මත්ද්‍රව්‍ය ගැටලුව පාලනයට අවැසි සහය ද දක්වනු ලබයි.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් වන රටක් බිහිකිරීමේ ජාතික දැක්ම යටතේ වසර 2030 වනවිට මත්ද්‍රව්‍ය සැපයුම පාලනය කිරීම හා මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම මඟින් ආරක්ෂක හා සෞඛ්‍ය සම්පන්න සමාජයක් ගොඩනැගීම රජයේ සමස්ත ඉලක්කය වේ. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් සහ ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමාගේ මාර්ගෝපදේශකත්වයෙන් මත්ද්‍රව්‍ය පාලනය, නිවාරණය, ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධ තම කාර්යයන් මැනවින් හඳුනාගනිමින් උක්ත අරමුණ වෙත ළඟාවීම සඳහා සිය සේවාවන් පුළුල් කරමින් නව්‍ය ප්‍රවේශයක් ඔස්සේ ඵලදායී සහ කාර්යක්ෂම කාර්යය කොටසක 2021 වසර තුළ ද නියැලෙන ලදී.

මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන ජාතික වැඩසටහන යාවත්කාලීන කරමින් මත්ද්‍රව්‍ය පරායත්තතාවයට ප්‍රතිකාර කිරීම සහ පසුරැකවරණ සේවාවන් සඳහා වන ගුණාත්මක ප්‍රමිතීන් පිළිබඳ නිවැරදි දැනුම කාර්ය මණ්ඩලයට ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් මෙම වසර තුළදී දියත් කරන ලදි.

එමෙන්ම ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවා සඳහා පවතින ඉල්ලුම හඳුනාගනිමින් ඒ අනුව ප්‍රතිකාර සේවාවන් පුළුල් කිරීම මේ වසරේදී ද සිදු කරන ලදි. එහි දී ජාත්‍යන්තර ප්‍රමිතිකරණයට අනුගතව ගුණාත්මක ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවක් ලබාදීම සඳහා ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම, නේවාසික ප්‍රතිකාර පහසුකම් ඉහළ නැංවීම, පසුරැකවරණ කටයුතු විධිමත් කිරීම හා 1927 දුරකථන මාර්ගික උපදේශන සේවාව යාවත්කාලීන කිරීම සිදුකරන ලදි.

මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික ප්‍රතිපත්තිමය ආකෘතිය මගින් අනාවරණය කර ඇති පරිදි සියලු ආකාරයේ මත්ද්‍රව්‍යයෙහි අහිතකර බව පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව දැනුවත් කිරීම සහ කුසලතා පාදක අධ්‍යාපනික පුහුණු වැඩසටහන් ඉතා ඵලදායි අයුරින් 2021 වසර තුළ දී ද අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් දියත් කරන ලදි.

රට තුළ පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද රාජ්‍ය කේන්ද්‍රීය ආයතනය ලෙස තම වගකීම නිසි අයුරින් ඉටු කිරීම උදෙසා අඛණ්ඩ සේවාවන් භෞතිකව සහ Zoom තාක්ෂණය ඔස්සේ කාර්යක්ෂමව සහ ඵලදායී අයුරින් ඉලක්ක කණ්ඩායම් වෙත සමීප කරවීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට 2021 වසරේදී ද හැකියාව ලද බව සතුටින් දන්වා සිටිමි.

ගෝලීය ගැටලුවක්ව පවතින මත්ද්‍රව්‍ය ගැටලුව ජාතික මට්ටමේ දී අවම කරමින් පුද්ගල, පවුල්, ප්‍රජා, සමාජ හා සෞඛ්‍ය තත්ත්වයන් දියුණු කිරීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍යය වන අතර ඒ සියල්ල මේ වසරේ දී පමණක් නොව ඉදිරියේදීත් සක්‍රීයව ක්‍රියාවට නැංවීම අපගේ අපේක්ෂාවයි.

විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු
සභාපතිනි
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

## 04. මණ්ඩලයේ බලතල

1984 අංක 11 දරන අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ, 7වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය සතු බලතල පහත පරිදි වේ.

අ) අන්තරායදයක ඖෂධ අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීමට සහ පාලනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, ඒ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ ඒ ප්‍රතිපත්තිය පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම ;

ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස සාධාරණව අවශ්‍ය විය හැකි තොරතුරු සහ විස්තර පුද්ගලයන්ගෙන්, සංවිධානවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින් සහ රාජ්‍ය සංස්ථාවලින් ඉල්ලා සිටීම ;

එසේ වුවද මේ ඡේදයේ විධිවිධාන යටතේ ලබාගන්නා ලද යම් තොරතුරක් හෝ විස්තරයක් සාමාජිකයකු විසින් හෙළිදරව් කිරීම, අධිකරණයක් විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් අනුව කටයුතු කිරීම සඳහා වූ අවස්ථාවක හෝ මිස කරනු නොලැබිය යුතුය ;

ඇ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග සහ ප්‍රදාන ලබා ගැනීම ;

ඈ) අන්තරාදයක ඖෂධ වැළැක්වීමෙහි සහ පාලනයෙහි නිරත නියෝජිතායතනවල කටයුතු ඒකාබද්ධ කිරීම ;

ඉ) ඖෂධවලට වහල් වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ක්‍රියාමාර්ග නංවාලීම සහ ඖෂධ අයුතු ලෙස භාවිත කිරීම හා වැළැක්වීමේ ජාතික අධ්‍යාපන වැඩ පිළිවෙලවල් ළමයින් සහ වැඩිහිටියන් සඳහා පවත්වා ගෙන යාම ;

ඊ) අන්තරාදායක ඖෂධ අයුතු ලෙස භාවිත කිරීමේ පැවැත්ම, හේතුසාධක සහ නීතිමය, වෛද්‍ය, සමාජ, සංස්කෘතික සහ ආර්ථික බලපෑම් පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයන භාර ගැනීම හා පවත්වාගෙන යාම ; සහ

උ) ඖෂධ පාලන කටයුතුවලට සම්බන්ධ ජාතික, ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සහ නියෝජිතායතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම ;

ඌ) චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් අත්කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ උකස් දීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

## 05. මණ්ඩලයේ සංයුතිය

1986 අංක 41 දරන පනතින් සංශෝධනය වූ 1984 අංක 11 දරන අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 3(1) වගන්තිය පරිදි මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

අ. අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු එක් සාමාජිකයෙකුගෙන් සහ වෙනත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් ;

ආ. අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඇ. පොලිස්පතිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඈ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඉ. ප්‍රධාන රේගු අයකැමිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඊ. ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

උ. ආයුර්වේද කොමසාරිස්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

සහ

* භාණ්ඩාගාර නියෝජිතයෙකු ද මණ්ඩලයේ රැස්වීම සඳහා සහභාගී වේ.

**මාණ්ඩලීය සාමාජිකයන් - 2021**

01. විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය
සභාපතිනිය
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
383, කෝට්ටේ පාර,
රාජගිරිය

02. මහාචාර්ය අනුලා විජේසුන්දර මහත්මිය
142/2 ඒ,
විජයකුමාරතුංග මාවත,
කොළඹ 05
(පත්කළ සාමාජික)

06. විශේෂඥ වෛද්‍ය වින්දා‍යා කුමාරපේලි
මහත්මිය
අධ්‍යක්ෂ,
බෝ නොවන රෝග ඒකකය
සෞඛ්‍ය අමාත්‍යාංශය
කොළඹ 10
(නිල බලයෙන් පත් වූ සාමාජික)

07. ජී.ඩබ්.පී. විජේවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ,
සමාජ ආරක්ෂණ ඒකකය
ශ්‍රී ලංකා රේගුව
40, කෙලින් වීදිය, කොළඹ 11
(නිල බලයෙන් පත් වූ සාමාජික)

03. නීතිඥ ගනේෂ් ධර්මවර්ධන මහතා
මහාභාරකරු
මහා භාරකාර දෙපාර්තමේන්තුව
නො. 02, බුලර්ස් ලේන්,
කොළඹ 07
(පත්කළ සාමාජික)

08. ගෞරි රමානා මහත්මිය
රජයේ රස පරීක්ෂක
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
31, ඉසුරු මාවත, පැලවත්ත,
බත්තරමුල්ල
(නිල බලයෙන් පත් වූ සාමාජික)

04. එච්.යූ. ප්‍රේමතිලක මහතා
අතිරේක ලේකම් (ආයතන අංශය)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
බත්තරමුල්ල
(නිල බලයෙන් පත් වූ සාමාජික)

09. ආචාර්ය ධම්මික අබේගුණවර්ධන මහතා
ආයුර්වේද කොමසාරිස්
ආයුර්වේද දෙපාර්තමේන්තුව
පරණ කොට්ටාව පාර,
නාවින්න, මහරගම
(නිල බලයෙන් පත් වූ සාමාජික)

05. නීතිඥ අජිත් රෝහන මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
(අපරාධ හා සංවිධානාත්මක අපරාධ)
නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
බත්තරමුල්ල
(නිල බලයෙන් පත් වූ සාමාජික)

10. සී.ඩබ්.කේ. ධර්මසේන මහතා
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01
(භාණ්ඩාගාර නියෝජිත)

**කාර්ය මණ්ඩලය**

2021.12.31 දිනට මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 374ක් වන අතර, එදිනට සේවයේ සිටින සේවක සංඛ්‍යාව 240ක් වේ.

**ලිපිනය/ තොරතුරු ලබාගැනීම සඳහා**

| | | |
|---|---|---|
| ලිපිනය | : | අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය |
| දුරකතන අංකය | : | 011 2868794 - 6 |
| ෆැක්ස් | : | 011 2868791/2, 011 2869805 |
| විද්‍යුත් තැපැල | : | mail@nddcb.gov.lk |
| ජාල අඩවිය | : | www.nddcb.gov.lk |
| විද්‍යුත් ජාල | : | facebooknddcb.gov.lk |

**විගණනය**

විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව

**නිල බැංකුව**

ලංකා බැංකුව

# 06. මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය



| Grade | Code | Designation |
|---|---|---|
| HM2-1 | DG | අධ්‍යක්ෂ ජනරාල් 01 |
| HM1-1 | D(A) | අධ්‍යක්ෂ- පරිපාලන 01 |
| | D(F) | අධ්‍යක්ෂ- මූල්‍ය 01 |
| | D(TR) | අධ්‍යක්ෂ- ප්‍රතිකාර හා පුනරුත්ථාපන හා බාහිරසේවා 01 |
| | D(R) | අධ්‍යක්ෂ- පර්යේෂණ 01 |
| | D(PET) | අධ්‍යක්ෂ- නිවාරක, අධ්‍යාපන හා පුහුණු 01 |
| JM 1-1 | AO | පරිපාලන නිළධාරී 01 |
| | M- T&M | කළමනාකරු -ප්‍රවාහන හා නඩත්තු 01 |
| | HRM | කළමණාකරු - මානව සම්පත් 01 |
| | M - IT | කළමණාකරු - තොරතුරු තාක්ෂණ 01 |
| | FO | මූල්‍ය නිළධාරී 01 |
| | M | කළමනාකරු - මධ්‍යස්ථාන 06 |
| | C | උපදේශන නිළධාරී - මධ්‍යස්ථාන 16 |
| | IO | විමර්ශන නිළධාරී - (ප්‍රතිකාර) 03 |
| | OR | බාහිරසේවා නිළධාරී 07 |
| | RO | පර්යේෂණ නිළධාරී 10 |
| | SO | විද්‍යාත්මක නිළධාරී 17 |
| | DE&IO | මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු 10 |
| | LB | පුස්තකාලයාධිපති 01 |
| | ALO | සහකාර නීති නිලධාරී 01 |
| MA2-1 (තාක්ෂණික) | BK | පොත් තබන්නා 01 |
| | N | හෙද නිලධාරී 05 |
| | CA | උපදේශන සහකාර (මධ්‍යස්ථාන) 91 |
| | ORA | බාහිර සේවා සහකාර 08 |
| | RA | පර්යේෂණ සහකාර 07 |
| | ITA | තොරතුරු තාක්ෂණික සහකාර 02 |
| | LT | රසායනාගාර තාක්ෂණ ශිල්පී 04 |
| | DE&IA | මත්ද්‍රව්‍ය අධ්‍යාපන තොරතුරු සහකාර 09 |

2021.12.31 දිනට කාර්ය මණ්ඩලය 240 කි.

| Grade | Code | Designation |
|---|---|---|
| MM 1-1 | BS/LO- | මාණ්ඩලික ලේකම්/ නීති නිළධාරී 01 |
| | IA- | අභ්‍යන්තර විගණක 01 |
| | DD/AD (A) | සහකාර අධ්‍යක්ෂ- පරිපාලන 01 |
| | DD/AD (F) | සහකාර අධ්‍යක්ෂ- මූල්‍ය 01 |
| | DD/AD (T&R) | සහකාර අධ්‍යක්ෂ- ප්‍රතිකාර හා පුනරුත්ථාපන 01 |
| | DD/AD (O) | සහකාර අධ්‍යක්ෂ- බාහිරසේවා 01 |
| | DD/AD (DPTC) | සහකාර අධ්‍යක්ෂ- තාමෝදිස්ට හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 01 |
| | DD/AD (R) | සහකාර අධ්‍යක්ෂ- පර්යේෂණ 01 |
| | DD/AD (SR) | සහකාර අධ්‍යක්ෂ- විද්‍යාත්මක පර්යේෂණ 01 |
| | DD/AD (PE&T) | සහකාර අධ්‍යක්ෂ- නිවාරක, අධ්‍යාපන හා පුහුණු 01 |
| | DD/AD (Precursor) | සහකාර අධ්‍යක්ෂ- පූරෝගාමී රසායන 01 |
| MA 5-2 | AC | සහකාර උපදේශක 26 |
| | AOO | සහකාර බාහිර සේවා නිලධාරී 22 |
| | ARO | සහකාර පර්යේෂණ නිලධාරී 08 |
| | CA/P | පද්ධති විශ්ලේෂක හා වැඩසටහන් සම්පාදක 02 |
| | ASO | සහකාර විද්‍යාත්මක නිලධාරී 04 |
| | ADE&IO | සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරී 12 |
| *PA MA 1-1 (තාක්ෂණික නොවන) | MA | කළමනාකරණ සහකාර 1 |
| MA 1-1 (තාක්ෂණික නොවන) | MA | කළමනාකරණ සහකාර 36 |
| PL 3 | DR | රියදුරු 18 |
| PL 2 | LA | පුස්තකාල සහකාර 01 |
| PL-1 | OA | කාර්යාල සහායක 19 |

**මණ්ඩලයේ විධායක කාර්ය මණ්ඩලය**

| අංකය | නම | තනතුර | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| 1. | විශේෂඥ වෛද්‍ය ලක්නාත් වෙලගෙදර මහතා | සභාපති 2021.06.07 වන දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත. | එම්.එස්.සී (සෞඛ්‍ය සේවා පරිපාලන) (MSc - Health care Administration)<br>- ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය මූලික අධ්‍යයන රුසියාව |
| | | | සෞඛ්‍ය සේවා පරිපාලන |
| | | | එම්.ඩී (MD)<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| | | | එම්.බී.බී.එස් (MBBS)<br>- පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 2. | විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය | සභාපතිනි 2021.06.09 වන දින පත් කර ඇත. | එම්.බී.බී.එස් (MBBS)<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| | | | D.Path |
| | | | MD (Histopath) |
| 3. | එස්.එම්.බී. නන්දා කුමාරිහාමි මහත්මිය | අධ්‍යක්ෂ (පර්යේෂණ) | දර්ශනපති උපාධිය (MPhil) සමාජ විද්‍යාව<br>- කැළණිය විශ්වවිද්‍යාලය |
| | | අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරි ආවරණ) 2020.02.19 වන දින සිට 2021.03.30 දක්වා | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MSSC) උපාධිය<br>- කැළණිය විශ්වවිද්‍යාලය |
| | | අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරි ඉටුකරන) 2021.03.31 වන දින පත්කර ඇත. | සමාජ විද්‍යාව හා මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය<br>- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | | උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br>- ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 4. | ඩී.එස්. සමරවික්‍රම මහතා | අධ්‍යක්ෂ - මූල්‍ය (වැඩබලන) 2021.06.30 වන දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත. | - |
| 5. | එල්.ඩී.එස්. පෙරේරා මහත්මිය | අධ්‍යක්ෂ - මූල්‍ය (වැඩබලන) 2021.08.02 වන දින පත්කර ඇත. | - |
| 6. | මාලිකා කරවිට මෙනවිය | අධ්‍යක්ෂ - පරිපාලන (වැඩබලන) 2021.08.02 වන දින පත්කර ඇත. 2021.12.31 වන | රාජ්‍ය පරිපාලන පිළිබඳ පශ්චාත් උපාධිය<br>- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | | ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය<br>- සබරගමුව විශ්වවිද්‍යාලය |

| | | | |
|---|---|---|---|
| | | දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත. | රාජ්‍ය තාන්ත්‍රික හා ලෝක කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව<br>- බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනය |
| 7. | කණිෂ්ක කුමාර ද සිල්වා මහතා | අධ්‍යක්ෂ (පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන) (පනතට අනුව පත්කරන) 2021.05.03 වන දින පත්කර ඇත. | - |
| 8. | ටී.ඩබ්. පේමසිරි මහතා | අධ්‍යක්ෂ - ප්‍රතිකාර පුනරුත්ථාපන හා බාහිරසේවා | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය<br>- කැළණිය විශ්වවිද්‍යාලය |
| | | | වාණිජවේදී උපාධිය<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| | | | සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව<br>- ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| | | | ඉංග්‍රීසි ඩිප්ලෝමාව<br>- බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය |
| 9. | එස්.ටී. වැරණියගොඩ මහත්මිය | මණ්ඩලීය ලේකම්/ නීති නිලධාරී | නීතිවේදී උපාධිය<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| | | | නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය<br>- පුනේ විශ්වවිද්‍යාලය (ඉන්දියාව) |
| 10. | ඩී.පී.එම්. ගමගේ මහත්මිය | අභ්‍යන්තර විගණක | සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරි<br>- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| | | | විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිය<br>- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | | AAT(SL)<br>- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ශිල්පීය ආයතනය |
| 11. | එම්.ඒ.ඩබ්. මාරසිංහ මහතා | සහකාර අධ්‍යක්ෂ - බාහිරසේවා | මනෝ විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br>- මනෝ විද්‍යා අධ්‍යයන ආයතනය |
| | | | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව<br>- මනෝවිද්‍යා අධ්‍යයන ආයතනය |
| 12. | ඒ.ඩබ්.ඒ. කුමාරි මහත්මිය | සහකාර අධ්‍යක්ෂ - පරිපාලන | ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය<br>- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | | විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධිය<br>- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | | මත්ද්‍රව්‍ය දුර්භාවිත පිළිබඳ කළමනාකරණ ඩිප්ලෝමාව<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| 13. | ප්‍රදීප් කුමාර කොහොලානේගෙදර මහතා | සහකාර අධ්‍යක්ෂ - නිවාරක අධ්‍යාපන හා පුහුණු | ජාත්‍යන්තර කටයුතු අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය<br>- උප්සලා විශ්වවිද්‍යාලය (ස්වීඩනය) |

| | | | |
|---|---|---|---|
| | | | ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| | | | උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDC) |
| | | | මත්ද්‍රව්‍ය උපදේශනය පිළිබඳ ජාත්‍යන්තර සහතිකය<br>- එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව කොළඹ ක්‍රමය |
| 14. | ඩී.පී.පී. වීරසිංහ මහත්මිය | සහකාර අධ්‍යක්ෂ - විද්‍යාත්මක පර්යේෂණ | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>- දිල්ලි විශ්වවිද්‍යාලය (ඉන්දියා) |
| | | | විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය<br>- පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 15. | ජී.ආර්. ගුණවර්ධන මහතා | සහකාර අධ්‍යක්ෂ - නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය<br>- කැළණිය විශ්වවිද්‍යාලය |
| | | | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය<br>- කැළණිය විශ්වවිද්‍යාලය |
| 16. | ටී.කේ.ආර්. දිසානායක මහත්මිය | සහකාර අධ්‍යක්ෂ - පුරෝගාමී රසායන | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| 17. | කේ.ඩී.ඩබ්. සජානි මහත්මිය | සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය 2021.06.30 වන දින සේවයෙන් ඉල්ලා අස්වි ඇත. | වාණිජවේදී උපාධිය<br>- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | | පරිගණක ආශ්‍රිත ගණකාධිකාරී ඩිප්ලෝමාව<br>- Londontec City Campus |
| | | | පදනම් සහ කළමනාකරණ මට්ටම<br>- CIMA (UK) |
| 18. | ඒ.ටී. දර්ශන මහතා | සහකාර අධ්‍යක්ෂ - පර්යේෂණ 2021.03.31 වන දින පත් කර ඇත. | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය<br>- කැළණිය විශ්වවිද්‍යාලය |
| | | | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| | | | මත්ද්‍රව්‍ය දුර්භාවිත පිළිබඳ කළමනාකරණ ඩිප්ලෝමාව<br>- කොළඹ විශ්වවිද්‍යාලය |
| 19. | එස්.එම්.අයි.එල් සමරකෝන් මහතා | සහකාර අධ්‍යක්ෂ - ප්‍රතිකාර හා පුනරුත්ථාපන 2021.03.31 වන දින පත් කර ඇත. 2021.12.31 වන දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත. | ශාස්ත්‍රවේදී විශේෂ (මනෝ විද්‍යාව) උපාධිය<br>- පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| | | | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව<br>- මනෝ විද්‍යා අධ්‍යයන ආයතනය |

## 07. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා

2021 වර්ෂයේ දී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 97,887කි. එය 2020 වර්ෂය හා සසඳන කළ 0.4%ක වැඩිවීමකි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් හෙරොයින් වැරදි සඳහා 52%ක් ද, ගංජා ආශ්‍රිත වැරදි සඳහා 34%ක් ද සහ මෙතැම්පිටමින් වැරදි සඳහා 14%ක් ද වේ.

**ගංජා**

ශ්‍රී ලංකාව තුළ බහුලව භාවිත වන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ගංජා වන අතර 2021 වර්ෂයේ පුද්ගලයින් 33,297 දෙනෙක් ගංජා ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වී ඇත. 2021 වර්ෂයේ දිවයින පුරා අත්අඩංගුවට පත්ව ඇති ගංජා ප්‍රමාණය කිලෝග්‍රෑම් 13,232 ග්‍රෑම් 596ක් වේ.

**හෙරොයින්**

හෙරොයින් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් හෙරොයින් භාවිත කරන්නන් වන අතර පෞද්ගලික පරිහරණය සඳහා ළඟ තබා ගැනීමේ වරද යටතේ අත්අඩංගුවට පත්ව ඇත. 2021 වර්ෂයේ කිලෝග්‍රෑම් 1,630 ග්‍රෑම් 103ක් නීතියේ රැහැනට හසුවී ඇති අතර පුද්ගලයන් 50,412ක් අත්අඩංගුවට පත්වී ඇත. හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 2020 වර්ෂය හා සසඳන කල 2021 වර්ෂයේ දී 2%කින් අඩුවී ඇත.

**මෙතැම්පිටමින්**

2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ දී මෙතැම්පිටමින් සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාව සහ අත්අඩංගුවට පත් මෙතැම්පිටමින් ප්‍රමාණය වැඩිවී ඇත. 2021 වර්ෂයේ දී මෙතැම්පිටමින් කිලෝ 377ක් සහ ග්‍රෑම් 294ක් සමඟ පුද්ගලයින් 13,695 දෙනෙක් නීතිය ක්‍රියාත්මක කරන අංශවල අත්අඩංගුවට පත්ව ඇත. පසුගිය වසර දෙක ඇතුළත මෙතැම්පිටමින් භාවිතය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව අත්අඩංගුවට පත්වීම් පිළිබඳ වාර්තා තුළින් පැහැදිලි වේ.

**හෂීස්**

ගංජා ආශ්‍රිත නිෂ්පාදනයක් වන හෂීස් භාවිතය ශ්‍රී ලංකාවේ ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. 2021 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන දත්ත අනුව හෂීස් සම්බන්ධ සිද්ධීන් 49ක් වාර්තා වී ඇති අතර පුද්ගලයින් 47 දෙනෙක් අත්අඩංගුවට පත්ව ඇත. 2021 වර්ෂයේ හෂීස් කිලෝ 93 ග්‍රෑම් 883ක් අත්අඩංගුවට ගෙන ඇත.

**ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන්**

ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් සඳහා නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලංකාවේ 2007 අංක 54 දරන පනත යටතේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් සඳහා අනිවාර්ය ප්‍රතිකාර පහසුකම් හඳුන්වා දී ඇත. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා නේවාසික

ප්‍රතිකාර මධ්‍යස්ථාන 4ක් ක්‍රියාත්මක කරන අතර මෙම මධ්‍යස්ථාන කොළඹ (තලංගම), නුවර, ගාල්ල, ඌරාපොල (නිට්ටඹුව) යන ස්ථානවල පිහිටා ඇත. මීට අමතරව බාහිරසේවා වැඩසටහන් ද ක්‍රියාත්මක වේ.

මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානයන් හි මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිකාර වැඩසටහන්වල පුද්ගලික හා පවුල් උපදේශනය, විෂ හරණ ප්‍රතිකාර, ශාරීරික ක්‍රියාකාරකම්, මානසික සුවතා, ගෘහස්ථ හා බාහිර ක්‍රියාකාරකම්, මනෝ චිකිත්සක ප්‍රතිකාර, අධ්‍යාපනික, වෘත්තිය පුහුණු සහ කුසලතා සංවර්ධන වැඩසටහන් ද අන්තර්ගත වේ.

2021 වර්ෂයේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ සේවාලාභීන් 1,703 දෙනෙක් ප්‍රතිකාර සේවාවන් ලබාගෙන ඇත. එම සේවාලාභීන්ගෙන් 751 (44%) දෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන් ද, 111 (08%) බන්ධනාගාර ප්‍රතිකාර වැඩසටහනින් ද, 249 (15%) රාජ්‍ය නොවන සංවිධානවලින් ද, 592 (35%) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් ද ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබා ගෙන ඇති අතර එම සේවාලාභීන්ගෙන් බහුතරයක් (32%)ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් ආයතනගත වූවන් ය. ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන්ගෙන් 52%ක් අවුරුදු 20-29 වයස් ඛාණ්ඩයට අයත් පුද්ගලයින් වෙති. 2020 වර්ෂය හා සැසඳීමේදී 2021 වර්ෂය තුළ ප්‍රතිකාර සඳහා යොමු වූ සේවාලාභීන් සංඛ්‍යාව 3.2% කින් වැඩි වී ඇත.

## 08. සංස්ථා පාලනය

අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 6(3) වගන්තියට අනුව මණ්ඩලය අවම වශයෙන් මසකට එක් වරක් හෝ රැස් විය යුතුය.

### අනු කමිටු

1984 අංක 11 දරන අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 8වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පවරනු ලැබිය හැකි බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම භාර කරනු ලැබිය යුතු යම් අනුකාරක සභා මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකිය.

මේ ආකාරයට පත්කරන ලද පහත අනු කමිටු 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක විය.

1. 2008 අංක 1 දරන මාදක සහ මනෝවර්ථක ඖෂධ නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ අනු කමිටුව

2. 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ අනු කමිටුව

3. 1984 අංක 11 දරන අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත සංශෝධනය කිරීම සඳහා වූ අනු කමිටුව

4. "කංසා" ශ්‍රී ලංකාව තුළ වගා කිරීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ සළකා බැලීම සඳහා වූ විද්වත් අනු කමිටුව

## 09. මූල්‍ය හා කාර්යසාධන විශ්ලේෂණය

| | 2021 (රු. මිලියන) | 2020 (රු. මිලියන) | වෙනස (රු. මිලියන) | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| රජයේ පුනරාවර්ථන ප්‍රධාන | 243.94 | 249.46 | 5.52 | 2% | අඩුවීම |
| වෙනත් ආදායම් (සටහන 2) | 41.57 | 9.83 | 31.73 | 323% | වැඩිවීම |
| මුලු වියදම | 270.49 | 272.03 | 1.54 | 0.57% | අඩුවීම |

මෙම වැඩිවීමට හේතුව වනුයේ නවදිගන්ත මධ්‍යස්ථානයට පරිත්‍යාග ලෙස ලද ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම වෙනත් ආදායම් යටතට ඇතුළත් කිරීමෙනි.

## 10. ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය

### 10.1 නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය

**"අපි ගුණාත්මක අධ්‍යාපනය හා පුහුණුව තුළින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය අවම සහ නිවාරණය වූ ආරක්ෂාකාරී පරිසරයක් නිර්මාණය කරගැනීම සඳහා මිනිසුන් බලගන්වන්නෙමු"**

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය සහ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ ව්‍යාප්තිය අවම කිරීම සහ මත්ද්‍රව්‍ය මඟින් ඇති වන හානිය අවම කිරීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම ඉටුකරලීම සඳහා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය තම සක්‍රීය දායකත්වය ලබා දෙයි.

දිවයින තුළ පවතින මත්ද්‍රව්‍ය ගැටලුව සඳහා විසඳුම් සෙවීමේදී තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි අවධානය යොමුකරමින් මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම සඳහා තුලනාත්මක සහ පුළුල් ප්‍රවේශයන් සහිත වැඩසටහන් ක්‍රියාවට නැංවීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සිදු කරනු ලබයි.

සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක සහ ගුණාත්මක නිවාරක අධ්‍යාපනයක් ලබාදීම උදෙසා අධ්‍යාපන අංශය නිරතුරුව ජාතික හා අන්තර්ජාතික ආයතන සහ ශාස්ත්‍රීය ප්‍රජාව සමඟ සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වේ. ඒ අනුව මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්ෂේත්‍ර 06ක් ඔස්සේ දීප ව්‍යාප්තව ක්‍රියාවට නැංවීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සිදු කරනු ලබයි.

එම ක්ෂේත්‍ර නම් :

- පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ හා පුහුණු වැඩසටහන්
- තරුණ ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්
- පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්
- විශාල වැඩබිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්
- මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්
- පාරිසරික පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

මත්ද්‍රව්‍ය දුර්භාවිතය අවම කිරීම උදෙසා බහුවිධ පරිසරය තුළ ජීවත්වන පාසල් සිසුන්, යෞවනයන්, විශ්වවිද්‍යාලීය සිසුන්, රාජ්‍ය නොවන ආයතන නිලධාරීන් හා පෞද්ගලික ආයතනවල සේවක සේවිකාවන් සහ සියලු ආයතන සඳහා නිර්මාණාත්මක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා පවතින කාලීන අවශ්‍යතාවය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් හඳුනාගෙන ඇත.

එම අවශ්‍යතාවය සපුරමින් සමාජය තුළ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව අධ්‍යාපනය හා දැනුවත් බව ඉහළ නැංවීම සඳහා මනා පුහුණුවක් ලද වෘත්තීය කාර්ය මණ්ඩලයක් විසින් මනෝවිද්‍යාත්මක

ඉගෙනුම් න්‍යාය පදනම් වූ විෂය මාලාවක් පදනම් කරගනිමින් සියලුම වැඩසටහන් මෙහෙයවනු ලබයි.

කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ නිවාරණ වැඩසටහන් වෙත විශාල අභියෝගයක් එල්ල වූ නමුත් එය ජය ගැනීම උදෙසා මාර්ගගත ක්‍රමය ඔස්සේ වැඩසටහන් දියත් කිරීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්විය. ප්‍රධාන නිවාරක ක්ෂේත්‍ර 06 සමඟ බැඳි උප අංශ 26 ඔස්සේ ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනය ආවරණය වන පරිදි අප විසින් වසර ආරම්භයේ දී සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව වෙත ළඟාවීමට නොහැකි වුව ද, සැලකිය යුතු කාර්යය කොටසක් අප විසින් මෙම වසර තුළ සිදුකර ඇත.

# මත්ද්‍රව්‍ය නිවාරණ ක්ෂේත්‍ර

- **01. පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය**
  - 1.1 පාසල් සිසුන් දැනුවත් කිරීම
  - 1.2 ජාත්‍යන්තර පාසල් සිසුන් දැනුවත් කිරීම
  - 1.3 දෙමාපියන් දැනුවත් කිරීම
  - 1.4 ගුරුවරුන් පුහුණු කිරීම
  - 1.5 ගුරුවරුන් දැනුවත් කිරීම
  - 1.6 දහම් පාසල් සිසුන් දැනුවත් කිරීම
- **02. තරුණ ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණය**
  - 2.1 තරුණ ප්‍රජාව දැනුවත් කිරීම
  - 2.2 විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම
  - 2.3 තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන්
- **03. පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය**
  - 3.1 පවුල් පාදක කරගත් නිවාරණ වැඩසටහන්
  - 3.2 පවුල් පාදක කරගත් කුසලතා සංවර්ධන වැඩසටහන්
  - 3.3 පවුල් සඳහා උපදේශන වැඩසටහන්
- **04. විශාල වැඩබිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය**
  - 4.1 නීතිය බලගැන්වීමේ ආයතන දැනුවත් කිරීම
  - 4.2 රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම
  - 4.3 රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම
  - 4.4 විශාල වැඩබිම් ආශ්‍රිත නිවාරණ වැඩසටහන්
  - 4.5 සෞඛ්‍ය අංශය ආශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහන්
  - 4.6 වතු ප්‍රජාව දැනුවත් කිරීම
- **05. මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය**
  - 5.1 අධ්‍යාපනික ප්‍රදර්ශන
  - 5.2 පුවත්පත් සහ මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම
  - 5.3 ගුවන් විදුලිය ආශ්‍රිත මැදිහත්වීම
  - 5.4 රූපවාහිනී මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම
  - 5.5 සමාජ මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම
  - 5.6 මාධ්‍ය නිෂ්පාදන කටයුතු
- **06. පාරිසරික පාදක මත්ද්‍රව්‍ය නිවාරණය**
  - 6.1 මත්ද්‍රව්‍ය නිවාරණය ආශ්‍රිත ප්‍රජාව බලගැන්වීමේ වැඩසටහන්
  - 6.2 මත්ද්‍රව්‍ය නිවාරණය ආශ්‍රිත ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන්

### 10.1.1 පාසල් සිසුන් පාදක කොට ගත් මැදිහත්වීම් සිදුකිරීම

මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා සහ වටිනාකම්, පාසල් ප්‍රජාව තුළ සංවර්ධනය කරමින් සෞඛ්‍යමත් හා ආරක්ෂිත දරු පරපුරක් බිහිකිරීම අරමුණු නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සිසු ශික්ෂා, ගුරු ශික්ෂා, දෙගුරු ශික්ෂා සහ ශික්ෂා ප්‍රතිපත්තිය ලෙස ශික්ෂා පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන ප්‍රධාන ධාරාවන් 04ක් ඔස්සේ ක්‍රියාවට නංවන ලදි.

ඒ අනුව පාසල් සිසුන් වෙනුවෙන් අවදානම් සහගත චර්යාවන් සඳහා පොළඹවන සමාජ මනෝවිද්‍යාත්මක සාධක ආමන්ත්‍රණය කරමින් මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම උදෙසා 2021 වසර තුළ ද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. අභියෝගාත්මක අවස්ථා ධනාත්මකව පාලනය කිරීමට හැකි වන ජීවන කුසලතා වර්ධනය කරමින් සිසුන් තුළ විශ්වාසය ගොඩනැංවීම උක්ත වැඩසටහන්වල අරමුණ විය.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|
| පාසල් සිසුන් දැනුවත් කිරීම | 239 | 39,837 |
| ජාත්‍යන්තර පාසල් සිසුන් දැනුවත් කිරීම | 03 | 183 |

### 10.1.2 දෙමාපියන් දැනුවත් කිරීම

මත්ද්‍රව්‍ය නිවාරණයේ දී වඩා ඵලදායි ප්‍රවේශයක් වන්නේ කුඩා දරුවන්ගේ මත්ද්‍රව්‍ය කෙරෙහි ඇති නැඹුරුව අවම කිරීම සඳහා ගත යුතු පියවර පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමයි. පවුල, දරුවන් සහ නව යෞවනයන් සඳහා ඉතා ප්‍රබලව බලපානු ලබන ආරක්ෂක සාධකයකි. එම පවුලම දුර්වල දෙමාපිය රැකවරණය, පවුල් ගැටලු, නොසලකා හැරීම් සහ අපචාර ආදී පවුල තුළ පැන නගින සෘණාත්මක තත්ත්වයන් මත අවදානම් සාධකයක් ලෙස වර්ධනය වීමේ හැකියාව පවතී. මෙම ප්‍රවණතා හඳුනාගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2021 වසරේ දී වැඩසටහන් 117ක් පවත්වමින් දෙමාපියන් 3,187ක් ආමන්ත්‍රණය කර ඇත.

### 10.1.3 ගුරුවරුන් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්

පර්යේෂණවලින් අනාවරණය වී ඇති පරිදි මත්ද්‍රව්‍ය නිවාරණයේ සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම සඳහා පාසල් සිසුන්ගේ පුද්ගල හා සමාජ කුසලතා වර්ධනයට වැඩි අවධානයක් දිය යුතුව ඇත. මෙම කාර්යය සඳහා වඩාත් සාර්ථක දායකත්වය ලබාදිය හැකි පිරිස ලෙස පාසල් ගුරුවරුන් හඳුනාගත හැකිවේ.

මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ ගුරුවරුන් සතු දැනුම වර්ධනය කරමින් සහ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කරමින් මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණුකරුවන් ලෙස ඔවුන් පුහුණු කිරීමේ වැඩසටහන් 2021 වසර තුළ ක්‍රියාත්මක කරන ලදි.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| ගුරු පුහුණු වැඩසටහන් | 06 | 390 |

### 10.1.4 ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්

පංති කාමර කළමනාකරණය කරමින් පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පහත පරිදි 2021 වසර තුළ දී සිදු කරන ලදි.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 19 | 793 |




මීගමුව අධ්‍යාපන කලාපයට අදාළ පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ අවස්ථාව

### 10.1.5. දහම් පාසල් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

මත්ද්‍රව්‍යයෙන් නිදහස් සදාචාර සම්පන්න තරුණ පරපුරක් බිහිකිරීමේ අරමුණ පෙරදැරි කරගනිමින් 2021 වසරේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් පහත සඳහන් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| දහම් පාසල් සිසුන් | 58 | 1,955 |

### 10.2 තරුණ ප්‍රජාව සඳහා මැදිහත්වීම

තරුණ පරපුර රටක ජීවනාලිය වන අතර ඔවුන් එම රටේ වර්තමානයේ හා අනාගතයේ ශක්තිමත් පවුර ද වේ. එබැවින් ඔවුන්ගේ ශක්තීන් හා කුසලතා සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් ප්‍රායෝගික හා සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක වැඩපිළිවෙලක් දියත් කිරීම ජාතික අවශ්‍යතාවයකි. එම කර්තව්‍යය අවබෝධ කරගත් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සෑම වසරකම තාරුණ්‍ය ඉලක්ක කරගනිමින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කර ගැනීම සඳහාත්, ඔවුන්ට ගැළපෙන මඟපෙන්වීම් හා අගය කිරීම් ලබාදීම සඳහාත් දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

### 10.2.1 තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්

තරුණ ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණයේ දී, තරුණ ප්‍රජාවගේ මත්ද්‍රව්‍ය භාවිතය සඳහා බලපානු ලබන අවදානම් සාධක මෙන් ම ආරක්ෂාකාරී සාධක හඳුනාගැනීම සහ එම කරුණු අරමුණු කරගනිමින් ප්‍රවේශයන් සිදුකිරීම අතිශයින්ම වැදගත් වනු ඇත. ඒ අනුව අවදානම් සාධක අවම කිරීමටත් ආරක්ෂාකාරී සාධක වර්ධනය කිරීමටත් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදි.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| තරුණ ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් | 170 | 7,991 |

### 10.2.2 තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන්

තරුණ කණ්ඩායම් ඉලක්ක කරගත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සිදුකිරීම වඩා සාර්ථක ප්‍රතිඵල ගෙනදෙන ක්‍රමවේදයක් බව ලොව පුරා ව්‍යාප්ති සාක්ෂි දරනු ලබයි. එමෙන්ම සම වයස් කණ්ඩායම්වලට වඩාත් සමීපව ආමන්ත්‍රණය කිරීමේ හැකියාව තරුණ ප්‍රජාව සතුවන බැවින් ඔවුන් මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණුකරුවන් ලෙස පුහුණුකිරීමේ සහ දැනුවත් කිරීමේ අරමුණ සහිතව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| තරුණ ප්‍රජා පුහුණු කිරීමේ වැඩසටහන් | 07 | 298 |



රාජගිරිය වෘත්තීය පුහුණු අධිකාරියේ සිසුන් දැනුවත් කිරීම

### 10.2.3 විශ්වවිද්‍යාල සිසුන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

විශ්වවිද්‍යාල සිසුන් තුළ මත්ද්‍රව්‍යයට එරෙහිව ධනාත්මක සෞඛ්‍ය පුරුදු සහ පුද්ගල සංවර්ධනය ඉලක්ක කරමින් කුසලතා ඔප්නැංවීමේ වැඩසටහන් මාලාවක් නිර්මාණය කරන ලදි. එහි අරමුණ වන්නේ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා අවශ්‍ය කුසලතා සහ ශක්‍යතා වර්ධනය කරමින් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් මත්ද්‍රව්‍ය නිවාරණ සඳහා සවිබල ගැන්වීමයි. මේ අනුව යමින් 2021 වසර තුළ ද විශ්වවිද්‍යාල සිසුන් සඳහා වැඩසටහන් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 14 | 952 |

### 10.3 පවුල් පාදක මැදිහත්වීම් සිදුකිරීම

සමාජයේ ක්‍රියාකාරී කුඩාම ඒකකය පවුල වන අතර එහි පුද්ගල සමාජානුයෝජනය මහා සමාජයට මහත් බලපෑමක් සිදු කරන බව සමාජ හා මනෝවිද්‍යාවේ මනා ලෙස පෙන්වා දෙන සිද්ධාන්තයකි. පර්යේෂණ වාර්තාවන්ට අනුව පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීමට පවුල නැමැති සාධකය දිගුකාලීන ලෙස බලපෑමක් සිදුකරයි. එසේම මත්ද්‍රව්‍ය හා අනෙකුත් අපගාමී චර්යාවන්ගෙන් ඈත්ව නිවැරදි චර්යාවකින් යුත් පුද්ගලයෙකු බිහිකිරීම සඳහා ද පවුල ප්‍රධාන සාධකයක් වනු ඇත. පවුල තුළ පවතින අවදානම් චර්යා වළකාලමින් ධනාත්මක සාධකයන් වර්ධනය කිරීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වේ. එමෙන්ම කුසලතා පාදක පවුල් පුහුණු වැඩසටහන තුළින්

ආරක්ෂාකාරී, ධනාත්මක පවුල් සාධකයන් වර්ධනය කිරීම සිදුවනු ඇත. ඒ අනුව කුසලතා පාදක පවුල් පුහුණු වැඩසටහන පහත සඳහන් උප කොටස් 03ක් ඔස්සේ ක්‍රියාවට නංවනු ලැබේ.

- දෙමාපිය කුසලතා සංවර්ධන දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන්
- දරුවන් සඳහා වූ පුද්ගල සහ සමාජීය කුසලතා සංවර්ධන දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන්
- පවුල් අභ්‍යාස සැසි

### 10.3.1 පවුල් පාදක මැදිහත්වීම්

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| පවුල් පාදක මැදිහත්වීම් | 42 | 1,725 |

### 10.3.2 පවුල් පාදක කුසලතා සංවර්ධන වැඩසටහන

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| පවුල් පාදක කුසලතා සංවර්ධන වැඩසටහන | 02 | 145 |

### 10.3.3 උපදේශන වැඩසටහන්

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| උපදේශන වැඩසටහන් | 138 | 187 |

### 10.4 විශාල වැඩබිම් පාදක කරගත් මත්ද්‍රව්‍ය නිවාරණය

රටක ආර්ථිකය සඳහා දැවැන්ත සේවාවක් වැඩබිම් මඟින් සිදුවන අතර සේව්‍ය, සේවක දෙපිරිස ම මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබාගැනීමට බාධාවක් වන බව නිවාරක අංශය මඟින් මනා ලෙස හඳුනාගෙන ඇත. එබැවින් සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක වැඩසටහන් වැඩබිම් වෙත ලබා දීම සිදු කළ යුතුය.

ඒ අනුව, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම, නීතිය බලගන්වන ආයතන දැනුවත් කිරීම සහ පුහුණු කිරීම, විශාල වැඩබිම් ආශ්‍රිත දැනුවත් කිරීම, සෞඛ්‍ය ක්ෂේත්‍ර දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙන්ම වතු ආශ්‍රිත සේවකයන් දැනුවත් කිරීම ලෙස අනුආංශික වැඩසටහන් දීපව්‍යාප්තව සිදුකරන ලදී.

### 10.4.1 නීතිය බලාත්මක කරන නිලධාරීන් සඳහා වැඩසටහන්

මත්ද්‍රව්‍ය නිවාරණයේ සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට නම් මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම සඳහා මෙන්ම මත්ද්‍රව්‍ය සැපයුම අවම කිරීම සඳහා ද වන උපායමාර්ග සමානව ක්‍රියාත්මක කළ යුතු බව පර්යේෂණයන් විසින් තහවුරු කර ඇත. වඩා සාර්ථක සේවයක් ලබාදීම සඳහා නව මනෝවර්තක මත්ද්‍රව්‍ය වර්ග සහ ප්‍රවණතා පිළිබඳ දැනුම නීතිය බලාත්මක කරන ආයතනවල රාජකාරි කටයුතුවල නියුතු නිලධාරීන්ට අනිවාර්ය සාධකයකි. මෙම අවශ්‍යතාවය සැපිරීමේ අරමුණෙන් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මෙම වසර තුළ පහත පරිදි වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|
| නීතිය බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 32 | 3,797 |




පුහුණු වැඩමුළුවේ සමාරම්භක මොහොතට එක් වූ සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය හට සමරු ඵලක පිළිගන්වා පුනරුත්ථාපන ජනරාල් කොමසාරිස් කාර්යාංශයේ පුනරුත්ථාපන කොමසාරිස් මේජර් ජනරාල් දර්ශන හෙට්ටිආරච්චි මහතා විසින් පිළිගත් අවස්ථාව





පුනරුත්ථාපන ජනරාල් කොමසාරිස් කාර්යාංශ නිලධාරි පුහුණු වැඩමුළුවේ ක්‍රියාකාරකම් සඳහා නිලධාරින් සම්බන්ධ වන අවස්ථාව

### 10.4.2 රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය අංශයට වඩා ප්‍රබල භූමිකාවක් හිමිවන අතර දිවයිනෙහි සෑම ස්ථානයකටම ප්‍රවේශ විය හැකි පරිපාලන ආකෘතියක් රාජ්‍ය අංශය සතුය. මෙම පරිපාලන ක්‍රමවේදය මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යය සඳහා යොදාගැනීමේ අරමුණෙන් දිවයින පුරා විසිර සිටින ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් ඇතුලු අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම වසර තුළ ද ක්‍රියාවට නංවන ලදි.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 149 | 8,736 |

2021 වසර තුළ ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 150ක් වූ අතර එමඟින් රාජ්‍ය නිලධාරීන් 12000ක් ආවරණය කිරීමට අපේක්ෂා කරන ලදි. වසර අවසන් වන විට වැඩසටහන් 149ක් පවත්වමින් රාජ්‍ය නිලධාරීන් 8736 දෙනෙකු ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් වී ඇත.

### 10.4.3 රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම | 51 | 2,474 |

එමෙන්ම මෙම වසර තුළ ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 50ක් වූ අතර එමඟින් රාජ්‍ය නිලධාරීන් 3000ක් ආවරණය කිරීමට අපේක්ෂා කරන ලදි. වසර අවසන් වන විට පුහුණු වැඩසටහන් 51ක් පවත්වමින් රාජ්‍ය නිලධාරීන් 2,474 දෙනෙකු ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් වී ඇත.

### 10.4.4 විශාල වැඩබිම් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

විශාල වැඩබිම් තුළ සේවය කරන සේවකයින් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමේ වැඩි අවධානමක් පවතී. සේවා ස්ථාන තුළ පවතින අධික කාර්යබහුලත්වය තම පවුලේ සාමාජිකයින් හා සමීපතමයන් සමඟ ධනාත්මක සබඳතා ගොඩනඟා ගැනීමට බාධාවක් වී ඇත. මෙවැනි කරුණු මඟින් ඇති කරනු ලබන අධික මානසික ආතතිය පුද්ගලයන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමට හේතු විය හැකිය.

මෙම ගැටලුකාරී තත්ත්වයට ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් පසුගිය වසර තුළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පහත පරිදි ක්‍රියාත්මක කරන ලදි.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| විශාල වැඩබිම් සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් | 21 | 5,674 |

### 10.4.5 සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වැඩසටහන්

රටක මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයට හිමිවන්නේ සුවිශේෂී කාර්යභාරයකි. ඒ අනුව ප්‍රාථමික, ද්විතියික හා තෘතියික යන නිවාරණ ප්‍රවේශයන් සාර්ථකව සිදුකිරීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මැදිහත්වීම තීරණාත්මක වූවකි. මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යය සඳහා සාර්ථක දායකත්වයක් ලබාගැනීමේ අරමුණු සහිතව මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව වෛද්‍යවරුන්, මනෝ වෛද්‍යවරුන්, හෙදියන් සහ සෞඛ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් ක්‍රියාවට නැංවේ.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 05 | 182 |

## 10.5 මාධ්‍ය පාදක මැදිහත්වීම් සිදු කිරීම

ජනමාධ්‍ය, ජනතාව වෙත පණිවුඩ හා තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ ගාමක බලවේගය වන අතර විශාල කණ්ඩායමක් එකවර ආමන්ත්‍රණය කිරීමේ හැකියාව පවතී. එම අවස්ථාව ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගනිමින් පවතින කොවිඩ් වසංගත තත්ත්වය තුළ වුවද අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සේවාවන් ජනතාව වෙත රැගෙනයාමට හැකියාව උදා විය. එමෙන්ම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ධාරා ඔස්සේ නිවාරක අධ්‍යාපනික පුහුණු වැඩසටහන් සමාජගත කිරීමට මෙවර ද වැඩි ඉඩකඩක් ලැබුණි.

| වැඩසටහන | ප්‍රමාණය | පාඨකයින් ප්‍රමාණය |
|---|---|---|
| පුවත්පත් හා මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම් (ප්‍රවෘත්ති/ විශේෂාංග ලිපි) | 44 | 461,500 |
| ගුවන් විදුලි ප්‍රවෘත්ති හා විශේෂාංග | 109 | 984,660 |
| රූපවාහිනි ප්‍රවෘත්ති/ විශේෂාංග හා වැඩසටහන් | 117 | 948,192 |
| සමාජ මාධ්‍ය | 253 | 7,132 |







සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය සහ මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරී චාමර කරුණාරත්න මහතා සහභාගී වූ වී.එෆ්.එම්. ගුවන් විදුලි වැඩසටහන්




මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු
නිලධාරී චාමර කරුණාරත්න
මහතා සහභාගී
වූ ලක්විරු ගුවන්විදුලි සිත් පහන්
වැට වැඩසටහන




ජයමඟ රූපවාහිනී ප්‍රභාතය
වැඩසටහන සඳහා සහකාර
උපදේශක භාග්‍යා අබේසිංහ
මහත්මියගේ සහභාගීත්වය



දිනමිණ පුවත්පතේ පල වූ විශේෂාංගය

**10.6 පාරිසරික පාදක මත්ද්‍රව්‍ය නිවාරණය**

මත්ද්‍රව්‍ය නිවාරණයේ ප්‍රධාන අංගයක් ලෙස ප්‍රතිපත්ති සම්පාදනය පෙන්වාදිය හැකිය. 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත ප්‍රකාරව අවශ්‍ය මැදිහත්වීම් සහ බලගැන්වීම් සිදුකිරීමටත් අවශ්‍ය නෛතික රාමුව ඇති කිරීමටත් මෙම ප්‍රතිපත්ති ඉවහල් වනු ඇත.

මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම සහ සැපයුම අඩාල කිරීමට අදාළව පාරිසරික පාදක නිවාරණ මැදිහත්වීම් ලොව භාවිත කරනු ලබන වඩා ඵලදායී විද්‍යාත්මක වූ නිවාරණ ප්‍රවේශයකි. ඒ අනුව නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් මතින් නිදහස් ආදර්ශ පාරිසරික තත්ත්වයන් ඇති කිරීම උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තම සක්‍රීය මැදිහත්වීම සිදුකරනු ලබයි.

මත්ද්‍රව්‍ය ඉල්ලුම හා සැපයුම අධෛර්යමත් කරන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පළමුව නීතිය ක්‍රියාත්මක කරන ආයතන බලාත්මක කිරීමත් දෙවනුව ප්‍රජාව බලාත්මක කිරීමත් සිදුවේ. ප්‍රජා නායකයින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් මේ වසර තුළ ද පහත පරිදි ක්‍රියාවට නංවන ලදි.

**10.6.1 ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්**

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රජාව දැනුවත් කිරීම් වැඩසටහන් | 93 | 11,841 |

**10.6.2 ප්‍රජා පුහුණු වැඩසටහන**

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රජා පුහුණු වැඩසටහන් | 05 | 210 |

**විශේෂිත වැඩසටහන්**

**"කුසලතා පරිපූර්ණ දැයේ දූ දරුවන් වෙනුවෙන් තිළිණ කළ වටිනා අවස්ථාවක්...!"**

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් සෑම වර්ෂයකම ජුනි මස 26 වන දින "මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනය" ලෙස නම්කර ඇත. මෙම දිනය තේමා කරගනිමින් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය නිවාරණය ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ජාතික කේන්ද්‍රීය ආයතනය වශයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සෑම වසරක දී ම විවිධ වැඩසටහන් සංවිධානය කරමින් මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා ප්‍රජාව සවිබල ගැන්වීම සිදුකරනු ලබයි.

මෙම වසරේ රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද දුරස්ථ ක්‍රමවේදය අනුගමනය කරමින් (Zoom) තාක්ෂණය ඔස්සේ ඉලක්කගත කණ්ඩායම් සඳහා වැඩසටහන් දියත් කරන ලදි. ඒ යටතේ දිවයිනේ සියලු පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනුම කුසලතා වර්ධනය කිරීම සඳහා මෙන්ම මත් උවදුර පිටුදැකීම උදෙසා දරුවන් තුළ ආකල්පමය බලගැන්වීම අරමුණු කරගනිමින් දීප ව්‍යාප්තව භාෂා ත්‍රිත්වයෙන්ම චිත්‍ර හා රචනා තරඟාවලියක් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව සැලසුම් කරන ලදි.

2021 මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව, ශික්ෂා පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන යටතේ පැවැත්වූ මෙම චිත්‍ර සහ රචනා තරඟාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවය ගරු ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එච්. යූ. ප්‍රේමතිලක මහතා, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් කසුණි ලියනගේ මිය, සහකාර ලේකම් මල්ෂා මුණසිංහ මිය, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන්ත විජේසේකර මහතා, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපතිනි චම්පිකා අමරසේකර මිය, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ ශ්‍රී ලංකා නියෝජිත අනූෂා මුණසිංහ මිය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් රැසකගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පවත්වන ලදි.

මෙම තරඟාවලිය සඳහා මුලු දිවයිනම නියෝජනය කරමින් පාසල් දරුවන් 1000කට ආසන්න පිරිසකගේ චිත්‍ර හා 500කට ආසන්න පිරිසකගේ රචනා නිර්මාණ ඉදිරිපත් වී තිබුණි. පුරා තෙදිනක් තුළ අදාල විෂයභාර පාසල් ගුරුභවතුන් 09 දෙනෙකුගෙන් යුතු කමිටුවකින් තෝරා පත්කරගනු ලැබූ තරඟාවලියේ ජයග්‍රාහකයන් වෙනුවෙන් මෙන්ම නිර්මාණ ඉදිරිපත්කර තිබූ සියලුදෙනා වෙනුවෙන් ත්‍යාග, සැනසිලි ත්‍යාග හා සහතිකපත්‍ර පිරිනමන ලද අතර අනුග්‍රාහක භවතුන් කිහිපදෙනෙකුගේ තිළිණපත් පිරිනැමීම ද සිදුවිය. මෙම අවස්ථාවේදී අදාල ජයග්‍රහණ ලද දූ දරුවන් වෙනුවෙන් අනුග්‍රාහක සමාජ සත්කාරයක් ලෙසින්, පාසල් අධ්‍යාපනය අවසන් වනතෙක් අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීමට ද තීරණය වීම දූ දරුවන් ලද මහඟු අවස්ථාවකි.



ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා චිත්‍ර ප්‍රදර්ශනය නරඹන අවස්ථාව





ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා සමරුඵලක හා සහතික පත් බෙදා දෙන අවස්ථාව



අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එච්. යූ. ප්‍රේමතිලක මහතා සමරුඵලක හා සහතික පත් බෙදා දෙන අවස්ථාව

**මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව**

මත්ද්‍රව්‍ය නිවාරණය සිදුකිරීම සාක්ෂි මත පාදක වූ විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුකූලව සිදු නොවීමෙන් මත්ද්‍රව්‍ය ප්‍රචාරණය සිදු වූ අවස්ථා දක්නට ලැබිණ. ඊට හේතු වශයෙන් වර්තමානයේ විවිධ ක්ෂේත්‍රවල කටයුතු කරන සම්පත්දායකයින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් දීපව්‍යාප්තව සිදුකිරීම හඳුනාගත හැකිය. මෙම වාතාවරණය මනා ලෙස අවබෝධ කරගත් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව 2021 වසරේ හඳුන්වාදෙන ලදී.

මත්ද්‍රව්‍ය නිවාරණ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් සහිත දේශකයන් සම්බන්ධ කරගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පළමු පාඨමාලාව ඉතා සාර්ථකව නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.



සභාපතිතුමිය විසින් පාඨමාලාව සම්පූර්ණ කරන ලද අයදුම්කරුවෙකු වෙත සහතිකපත් ප්‍රදානය කරන අවස්ථාව



පාඨමාලාව පිළිබඳ අදහස් දක්වන පාඨමාලාව සම්පූර්ණ කරන ලද අයදුම්කරුවෙකු

**නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ 2020/2021 වර්ෂයන් හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම**

| වර්ෂය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| 2020 | 28.87% | 64.45% |
| 2021 | 55.06% | 14.61% |

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ 2020 වර්ෂයේ භෞතික ප්‍රගතිය 28.87%ක් වන අතර 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 55.06% ක් වේ. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 64.45%ක් වන අතර එය 2021 වර්ෂයේ දී දර්ශකයක් ලෙස 14.61%කි. 2020 වර්ෂය තුළ රට පුරා උද්ගතව තිබූ සෞඛ්‍යමය ගැටලු සහිත වාතාවරණය හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම ට අනුව යෝජිත ඉලක්ක ගත වැඩසටහන් වෙත ළඟා වීමට නොහැකි වුවද සැලකිය යුතු කාර්යය කොටසක් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සිදුකර ඇත.

වසර ගණනාවකට පසුව 2020 වර්ෂය ඉතාම පහළ භෞතික ප්‍රගතියක් වාර්තා කරන්නට හේතු වූයේ 2019 වර්ෂයේ උද්ගත වූ කොවිඩ් වසංගතය, මුල් කාලය තුළ වාර්තා වූ පාස්කු ප්‍රහාරය හා පසුව ඉන්ධන අර්බුදය හමුවේ රටෙහි ස්ථායීබවට දිගින් දිගටම බාධා වීමයි. මෙහිදී අන්තර් කාල පරිච්ඡේද තුළ විටින් විට විවෘත වූ අවස්ථාවල කරන ලද වැඩසටහන් වලට අනුව මෙම ප්‍රගතිය වාර්තා කිරීමට හැකි වීම ද සැලකිය යුත්තකි.

2020, 2021 යන වර්ෂවල සාමාන්‍ය ලෙස නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය ඉදිරිපත් කරන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වෙනසකින් තොරවම ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව කිසිදු වෙනස්කමකින් තොරව ළඟාවීමට හැකි වූ වැඩසටහන් සංඛ්‍යාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනුව මෙහි

ගණනය කරලීම් සිදුකර ඇත. මෙය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිමැවුමේ සංඛ්‍යාලේඛන හා සසඳන කල ද ඉතා ම පැහැදිලිය. රටේ සෑම ආයතනයක ම ගණනය කිරීම් දෙස බලන කල මේ අගයන් පැහැදිලිව ම පහළ ගොස් ඇත.

කෙසේ වුවත් 2021 වර්ෂය උපාය මාර්ගික ලෙස වැඩසටහන් වෙනස් කිරීමක් නොකර කටයුතු කරන ලද්දේ හැකි තරම් විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය වෙත පිවිසෙමින් වැඩසටහන් ව්‍යාප්ත කරලීමට කටයුතු කළ බැවිනි. ඒ අනුව දිවයිනේ සෑම රූපවාහිනී නාලිකාවක්ම, ගුවන් විදුලි නාලිකාවක්ම හා පුවත් පත්වල ලිපි පල කිරීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් ආරම්භ කරන ලදී. අවසානයේ 28.87%ක් පැවති 2020 ප්‍රගතිය 2021 වර්ෂයේදී 55.06% තෙක් ඉහළ නංවා ගැනීමට හැකිවිය.

කෙසේ වුවත් මෙහි දැක්වෙන මූල්‍ය ප්‍රගතිය යනු නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2020 ආරම්භයේ ඇස්තමේන්තු කළ වියදමට සාපේක්ෂ වූ මූල්‍ය අගය නොවේ. 2020, 2021 ආරම්භයේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට වෙන් කළ මුදල වූයේ පිළිවෙළින් මිලියන 03 බැගිනි. නමුත් අදාල වර්ෂවල නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට හිමි වූයේ මිලියන 1.5ක මුදලක් පමණක් වන අතර 2021 වර්ෂයේ සත්‍ය වෙන් කිරීම වූයේ ලක්ෂ 08ක මුදලක් පමණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය ලෙස දක්වන්නේ සත්‍ය වශයෙන් ලද මුදලට සාපේක්ෂව ලද වියදම්වල අනුපාතය වේ.

## 10.2 පර්යේෂණ අංශය

1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ වගන්ති අංක 07 (ඊ) ප්‍රකාරව අන්තරායකර ඖෂධ දුර්භාවිතය ව්‍යාප්තිය, හේතු සාධක සහ ඒ හා බැඳුණු නෛතික, වෛද්‍ය විද්‍යාත්මක, සමාජයීය, සංස්කෘතික හා ආර්ථික කරුණු පිළිබඳ වූ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම සම්බන්ධයෙන් වගකීම පර්යේෂණ අංශයට පැවරී ඇත.

සාක්ෂි මත පදනම් වූ කරුණු සහ තොරතුරු ප්‍රවර්ධනය කරමින් මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය අවම කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන හානිය අවම කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විද්‍යාත්මක සාක්ෂි සහ අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම පර්යේෂණ අංශය විසින් සිදුකරනු ලබයි.

පර්යේෂණ අංශය විසින් ප්‍රධාන උපායමාර්ග හයක් (06) යටතේ 2021 වර්ෂය තුල සිදු කරන ලද කාර්යයන් පහත ගොනු කර ඇත.

1. පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණ පැවැත්වීම
2. පර්යේෂණ ප්‍රකාශන
3. පුහුණු වැඩමුළු හා පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම
4. අන්තර්ජාතික ආයතන සමග තොරතුරු හුවමාරුව
5. දත්ත පද්ධති කළමනාකරණය
6. ප්‍රවණතා විශ්ලේෂණය

### 10.2.1 පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ

### I. දුම රහිත දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය - 2021

දුම රහිත දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය සම්බන්ධ වර්තමාන ප්‍රවණතා අධ්‍යයනය කිරීමේ අරමුණින් මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයන භාවිතකරමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. මධ්‍යස්ථානගතව ප්‍රතිකාර ලබන සේවාලාභීන් 60 දෙනෙක් නියැදිය වශයෙන් යොදා ගෙන ඇත. මෙම අධ්‍යයනය ඇසුරින් පර්යේෂණ පත්‍රිකා 04ක් ජාතික මට්ටමේ පර්යේෂණ සැසියක දී ඉදිරිපත් කර ඇති අතර අවසන් වාර්තාව පර්යේෂණ ලිපි එකතුවට අන්තර්ගතකර ඇත.

**අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු**

අධ්‍යයන අනාවරණවලට අනුව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වර්ග දොරටු රසාගඳයක් (දොරටු මත්ද්‍රව්‍ය) වශයෙන් ක්‍රියාත්මක වන අතර දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වර්ග භාවිතා කරන්නන්ගේ මුල්ම භාවිතයේ අවම වයස අවුරුදු 10 වන අතරම පසුකාලීනව ප්‍රබල මත්ද්‍රව්‍ය කෙරෙහි නැඹුරුවීමට ද මෙය ප්‍රබල හේතුවක් බවට පත්ව ඇත. එසේම, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වර්ග අතරින් දුම රහිත දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනවල භාවිතය ඉහළ යමින් පවතින අතරම ඒ සම්බන්ධ වැඩි අවදානම් කණ්ඩායම ලෙස වයස අවුරුදු 10 සිට ඉහළට පාසල් ප්‍රජාව හඳුනාගත හැකිවේ.

නියැදියට අයත් තුල් භාවිත කරන පුද්ගලයින් දිනකට 3 වතාවක් සාමාන්‍යයෙන් තුල් භාවිත කරන අතර එය වාර 30ක් දක්වා වූ උපරිමයක් වෙත ලඟා වූ අවස්ථා ඇත. සමස්ත නියැදිය තුළ නියෝජනය වූ සියලු පුද්ගලයින් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කර ඇති අතර එම පිරිසෙන් 98% (48)ක් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බව ද අධ්‍යයනය තුලින් අනාවරණය විය.

එසේම සුවිශේෂී තත්ත්වයක් ලෙස, වයස 19 - 25 අතර වයස් කාණ්ඩයේ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වර්ග භාවිතා කරන්නන් බහුතරය වෙනත් මත්ද්‍රව්‍ය වර්ග භාවිතයට ද නැඹුරු වී සිටීම හඳුනාගත හැකි විය. තවද, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනවල වාණිජ ඉල්ලුම ද ඉහළ යමින් පවතින අතර මත්වීම පිණිස දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වර්ග භාවිතා කරන්නන්ගේ ප්‍රමාණය ද ඉහළ යමින් පවතී. අධ්‍යයන අනාවරණ අනුව අද්‍යතන ශ්‍රී ලාංකික සමාජයේ මත්ද්‍රව්‍ය ගැටලුව තුළ අවධානය ලබාදිය යුතු අතිශය වැදගත් පැතිකඩක් ලෙස දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය හඳුනාගත හැකි වේ. එමෙන්ම දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව ජාතික නිවාරණ වැඩසටහන්වල කාලීන අවශ්‍යතාවයක් පවතින බව ද තවදුරටත් තහවුරු විය.

## II. මෙතැම්පිටමින් (අයිස්) භාවිතයේ ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය

මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා සමාජ විද්‍යාත්මක පැතිකඩ, භාවිතයේ පැතිකඩ හා චර්යාත්මක ලක්ෂණ පිළිබඳ හඳුනාගැනීමේ මූලික අරමුණ ඇතිව පර්යේෂණ අංශය විසින් මෙම අධ්‍යයනය සිදුකරන ලදි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිත කර ඇති අතර දත්ත රැස්කිරීමේ දී හිමබෝල නියැදීම් ක්‍රමය අනුව මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින් 50 දෙනෙකු සමීක්ෂණ නියැදිය සඳහා ඇතුළත් කරගෙන ඇත. මෙතැම්පිටමින් සඳහා ඇති ඇබ්බැහිකාරීත්වය මිනුම් කිරීම සඳහා APA අනාවරණ පරීක්ෂාව යොදාගෙන ඇත.

### අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු

මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින් මෙතැම්පිටමින්වලට අමතරව හෙරොයින්, ඖෂධමය පෙති වර්ග අනිසි භාවිතය, ගංජා, මද්‍යසාර, සිගරට්, ඇම්පිටමින් කාණ්ඩයේ උත්තේජක, මත්ද්‍රව්‍ය ලෙස භාවිත කර ඇත. පුද්ගලයින් සාමාන්‍යයෙන් වයස අවුරුදු 19 දී ප්‍රථම වරට මෙතැම්පිටමින් භාවිතයට යොමුවී ඇති අතර මෙතැම්පිටමින් භාවිත කිරීමේ දී 72%ක බහුතරයක් චයිනීස් ක්‍රමයෙන් ද ඇතැම්විට දුම්පානය හා නාසයෙන් ඉරීම මඟින් සහ ඉතා සුලු පිරිසක් එන්නත් කර ගැනීමක් ද දැකිය හැකිය. මෙතැම්පිටමින් භාවිතය කෙරෙහි 92%ක බහුතරයක් මිතුරු කණ්ඩායම් මඟින් යොමු වී ඇත. වයස අවුරුදු 19 - 26 වයස් කාණ්ඩයේ තරුණ පිරිස් අතර මෙතැම්පිටමින් භාවිතයේ ඉහළ ප්‍රවණතාවයක් දැකිය හැකි වේ.

මෙතැම්පිටමින් භාවිතා කළ පුද්ගලයින් කෙටිකාලීනව ශාරීරික හා මානසික වශයෙන් මුහුණදුන් වෙනස්කම් අතර බහුතරයකට නින්ද නොයාම දැක්විය හැකිය. තවද ආහාර අරුචිය, දත්මිටිකෑම, දත් එකට එක එකමත තදවීම, ශරීර උෂ්ණත්වය ඉහළ යාම ආදිය දැක්විය හැකිය. දිගුකාලීන වෙනස්කම් සැලකීමේ දී ශරීරය කෙට්ටුවීම, අමතකවීම්, මානසික විකෘතිභාවය හා ප්‍රචණ්ඩකාරී ස්වභාවයන් ඇතිවීම, දත් දිරායාම, භ්‍රාන්තිකාරක හැඟීම් ඇති වීම හා පපුවේ වේදනාව ආදිය

දැක්විය හැකිය. නියැදියෙහි පුද්ගලයන්ගෙන් 34%ක් දිනපතා මෙතැම්පිටමින් භාවිත කරනු ලබයි. මේ සඳහා පුද්ගලයෙකුට සාමාන්‍යයෙන් දිනකට රුපියල් 3,000/=ක මුදලක් වැය වේ. මෙතැම්පිටමින් පැකට්ටුවක වීජී මට්ටමේ සාමාන්‍ය මිල රුපියල් 2,500/=ක් වන අතර පැකට්ටුවක අන්තර්ගත සාමාන්‍ය මෙතැම්පිටමින් ප්‍රමාණය මිලිග්‍රෑම් 300ක් වේ.

මෙතැම්පිටමින් භාවිතය සම්බන්ධ අනාවරණ පරීක්ෂාව තුළින් පුද්ගලයින් 64%ක් ඉහළ ඇබ්බ්හිකාරී තත්ත්වයන් පෙන්නුම් කළ අතර මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයන්ගෙන් අති බහුතරයකට තමාව පාලනය කර ගැනීමට නොහැකිවීම, මෙතැම්පිටමින් සම්බන්ධ අවශ්‍යතාවය ක්‍රමයෙන් වැඩිවීම හා ඒ සම්බන්ධව අවධානය යොමුකිරීමට සිදුවීම මඟින් ඔවුන්ගේ ඇබ්බැහිකාරීත්වය ඉහළ බව තහවුරු විය. මෙතැම්පිටමින් භාවිතය සම්බන්ධයෙන් 20%ක් පමණ ප්‍රතිකාර සඳහා යොමු වී ඇති අතර, 90%ක් ප්‍රතිකාර සඳහා යොමු වීමට ඉහළ කැමැත්තකින් පසුවන බව ද තවදුරටත් තහවුරු විය.

## III. අධි මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ මිත්‍යාමත, විශ්වාස සහ සංජානනයන් පිළිබඳ මහජන මත විමසුම් සමීක්ෂණය

මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ මහජනතාව අතර පවතින දුර්මත, විශ්වාස සහ සංජානනයන් හඳුනාගැනීම සහ අනාගත ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාකාරකම්වල දී අවශ්‍ය තොරතුරු රැස්කරගැනීම අරමුණු කරගනිමින් මෙම සමීක්ෂණය සිදුකරන ලදි. සමීක්ෂණ ක්‍රමය (Survey Method) පදනම් කරගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පුද්ගල ආකල්ප හා මත සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් මෙහිදී අවධානය යොමු කරන ලද බැවින් මෙය මත විමසුම් සමීක්ෂණයක් ලෙස සිදු කරන ලදි. මාර්ගගත ක්‍රමවේදය හරහා Google ෆෝරමයක් යොදා ගනිමින් වයස අවුරුදු 15 - 64 අතර ජනගහනයෙන් ස්වේච්ඡාවෙන් පිළිතුරු ලබා ගැනීම සිදු කරන ලදි.

### අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු

අධ්‍යයනය සඳහා සහභාගි වූ සමස්ත නියැදිය 175කි. එයින් කාන්තා නියෝජනය 69ක් (39.4%) වන අතර පිරිමි නියෝජනය 106 (60.6%) කි. ශ්‍රී ලංකාව තුළ සියලුම ආකාරයේ මත්ද්‍රව්‍ය භාවිතය තහනම් කිරීමට 75.5%ක ප්‍රතිශතයක් එකඟත්වය ප්‍රකාශ කර ඇත. කංසා මත්ද්‍රව්‍යයක් හා දැඩි ඇබ්බැහිකාරී මත්ද්‍රව්‍යයක් ලෙසට බහුතර පිළිගැනීමක් පැවතිය ද තවදුරටත් කංසා මත්ද්‍රව්‍යයක් ලෙස නොසිතන බවට 31.4%ක ප්‍රතිශතයක් ප්‍රතිචාර දක්වා තිබුණි. කංසා නීතිගත නොකළ යුතු බවට බහුතර පිළිගැනීමක් නිරීක්ෂණය විය. මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා අදාළ තත්ත්වයන් පිළිබඳ පෙරට වඩා මහජනයා සවිඥානික වුවද තවදුරටත් අවධානය යොමුකළ යුතුව පවතින බව නිගමනය කළ හැකිය.

## IV. සතිමත්භාවය (Mindfullness) ප්‍රතිකාර ප්‍රවේශයෙහි ඵලදායීබව තක්සේරු කිරීමේ අධ්‍යයනය

නව ප්‍රතිකාර හා පුනරුත්ථාපන ප්‍රවේශයක් ලෙස සතිමත්භාවය (Mindfullness) හඳුන්වාදීමේ ප්‍රධාන පරමාර්ථය ඇතිව නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සේවාලාභීන් 30 දෙනෙකු යොදාගෙන මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි. ජාතික මාදක රසායනාගාරය සහ සතිපාසල පදනම සමඟ එක්ව මෙම අධ්‍යයනය සිදුකරන ලද අතර එහි අනාවරණ 2021 එක්සත් ජාතීන්ගේ

මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) සහ මාදක ඖෂධ පිළිබඳ කොමිසමේ 64වන සැසිවාරයට සමගාමීව පැවති සම්මන්ත්‍රණය සඳහා ඉදිරිපත් කරන ලදි.

**අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු**

මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ සේවාලාභීන්ගෙන්, මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ භාවිත අත්දැකීම් හා භාවිතයට ඇති ආසාව පිළිබඳ පූර්ව පරීක්ෂණයේ සහ පසු පරීක්ෂණයේ දී ලබා ගත් දත්ත සංසන්දනය කිරීමේදී, සතිමත්භාවය පුහුණු කිරීමෙන් පසුව බහුතර සේවාලාභීන් පිරිසක් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඔවුන් තුළ තිබූ ආසාව සහ එම අත්දැකීම් සම්බන්ධයෙන් තිබූ රසවත්භාවය ඔවුන් තුළින් ඉවත් කරගෙන තිබිණ. එමෙන්ම විවිධත්වයෙන් යුතු අවස්ථා ගණනාවකදී සතිමත්භාවය ප්‍රවේශය පුහුණු කිරීමෙන් පසුව සේවාලාභීන් තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඇති වන කැමැත්තේ තීව්‍රතාවය පැහැදිලි වශයෙන්ම අවම වී තිබිණ.

උපරිම වශයෙන් මත්ද්‍රව්‍යයට කැමැත්ත ඇතිවන අවස්ථාවේ එම කැමැත්තේ මත්ද්‍රව්‍ය සම්බන්ධ ආකර්ෂණය/බැඳීම ද අවම කිරීමට බහුතර සේවාලාභීන් සංඛ්‍යාවකට සතිමත්භාවය ප්‍රවේශය හේතු වී තිබිණ. පූර්ව සහ පසු පරීක්ෂණවල දත්ත සංසන්දනය කිරීමේ දී, සතිමත්භාවය ප්‍රවේශය පුහුණු කිරීම මඟින් මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමෙන් අනතුරුව දැනෙන විරමණ ලක්ෂණ වෙත සේවාලාභීන් තුළ ඇතිවන බිය සහිත ස්වභාවය නැති කිරීමට අවශ්‍ය මානසික ශක්තිමත්භාවය සකස් කිරීමට සැළකිය යුතු බලපෑමක් සිදු කර තිබිණ. සතිමත්භාවය ප්‍රවේශය පුහුණු කිරීම මඟින් බහුතර සේවාලාභින් සංඛ්‍යාවක් තුළ ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් බැහැරව ගිය පසු කිසියම් පුද්ගලයෙකු විසින් තමන්ට කුමන හෝ මත්ද්‍රව්‍යයක් ලබා දුන් විට එය ප්‍රතික්ෂේප කිරීම සඳහා අවශ්‍ය හැකියාව මෙන්ම ඍජුව තීරණ ගැනීමේ හැකියාව ද වැඩි දියුණු කිරීමට හැකි වී තිබිණ.

## V. ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ප්‍රමිතීන් පිළිබඳ තක්සේරුකරණ අධ්‍යයනය

රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රතිකාර සේවාවන් සපයන ආයතන විසින් 2007 අංක 54 දරන ප්‍රතිකාර හා පුනරුත්ථාපන පනත ප්‍රකාරව අපේක්ෂිත අවම ප්‍රමිතීන් සහ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) විසින් නිර්දේශිත ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත. සියලු රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රතිකාර මධ්‍යස්ථාන නියැඳිය වශයෙන් යොදාගෙන ඇත. අවසන් තක්සේරුකරණ වාර්තාව සකස් කරමින් පවතී.

## VI. අධි අවදානම් කණ්ඩායම් අතර අලුතින් උද්ගතවන මත්ද්‍රව්‍ය භාවිත රටාවන් සහ චර්යාවන් සම්බන්ධ හරස්කඩ අධ්‍යයනය (කොළඹ සහ තදාසන්න ප්‍රදේශ ඇසුරින්)

මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සහ ඒඩ්ස් රෝගය සම්බන්ධයෙන් හඳුනාගත් අධි අවදානම් කණ්ඩායම් (High Risk Groups) ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය හා බැඳි චර්යා රටා සම්බන්ධයෙන් අධ්‍යයනය කර අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත. දත්ත රැස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

### VII. මත්ද්‍රව්‍ය භාවිතය නිවාරණය හා පාලනය සම්බන්ධ ගැටලු හා අභියෝග පිළිබඳ තක්සේරුකරණ අධ්‍යයනය

මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය සම්බන්ධයෙන් ඉල්ලුම අවම කිරීම හා සැපයුම පාලනය කිරීම සම්බන්ධයෙන් විවිධ දිශානතීන් ඔස්සේ කටයුතු කරන ආයතන අතර අන්තර් සම්බන්ධතාවය සහ ප්‍රායෝගිකව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු හඳුනාගැනීම සඳහා මෙම තක්සේරුකරණය ක්‍රියාත්මක කරනු ලබයි. දත්ත රැස්කිරීමේ කටයුතු සිදුකරමින් පවති.

### 10.2.2 පර්යේෂණ ප්‍රකාශන

### I. මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2021




2020 වර්ෂය සහ ඊට පෙර වර්ෂ 04කට අදාළ මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ විවිධ නිර්ණායක යටතේ දත්ත ඇතුළත් කර මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත සම්පාදනය කර ඇත. ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතන, ප්‍රතිකාර සේවාවන් සපයනු ලබන ආයතන සහ මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධයෙන් විවිධ නිර්ණායකවලට අදාළ දත්ත විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර ඇත.

කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය සහ මත්ද්‍රව්‍ය භාවිතය මෙන්ම ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ කාලීන ප්‍රවණතා සම්බන්ධ දත්ත මෙම තොරතුරු අත්පොතෙහි අන්තර්ගත කර ඇත. පහත නිර්ණායක ඔස්සේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ දත්ත විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර ඇත. 2021 වර්ෂය තුළ දී, මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත් 1500ක් සහ සීඩී 500ක් මුද්‍රණය කර ඇත.

- මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්
- මත්ද්‍රව්‍යවල මිල ගණන් සහ ශුද්ධතාව
- වෛද්‍යමය අරමුණු සඳහා ගංජා නීත්‍යානුකූල පරිභෝජනය
- මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා බන්ධනාගාරගතවීම්
- ප්‍රතිකාර සඳහා ඇතුළත්වීම්
- මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් රෝහල්ගත වූ පුද්ගලයින්ගේ තොරතුරු
- HIV සහ ඒඩ්ස් සම්බන්ධ තොරතුරු
- පූර්ව රසායන ආනයනය සහ අපනයනය පිළිබඳ තොරතුරු
- මද්‍යසාර සහ දුම්කොළ ආශ්‍රිත තොරතුරු
- මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ

## II. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ "Newsletter" කාර්තුමය සඟරාව




අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙන්ම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සේවාවන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මෙම කාර්තුමය සඟරාව ප්‍රකාශයට පත්කරනු ලබයි. ආයතනයේ සේවාවන් ප්‍රවර්ධනය කරමින් තවදුරටත් සාමාන්‍ය ජනතාවගේ අවධානය මත්ද්‍රව්‍ය නිවාරණ හා පාලන යාන්ත්‍රණය වෙත ලබාගැනීම මෙහි ප්‍රමුඛ අරමුණ වේ. 2021 වර්ෂය තුළ 28 වන කලාපය (ජනවාරි - ජූනි) සහ 29 වන කලාපය (ජූලි - සැප්තැම්බර්) ප්‍රකාශයට පත්කර අදාළ ආයතන වෙත යොමුකරන ලද අතර 30 වන කලාපය (ඔක්තෝබර් - දෙසැම්බර්) සම්පාදනය කරමින් පවතියි.

## III. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව - VI

පර්යේෂණ අංශය විසින් පසුගිය වර්ෂවල සිදුකරනු ලැබූ පර්යේෂණ හා සමීක්ෂණවල වාර්තා අන්තර්ගත කර "ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව - VI" සම්පාදනය කරනු ලැබූ අතර පහත වාර්තා ඇතුළත් කරමින් 2021 වර්ෂයට අදාළ ප්‍රකාශනය මුද්‍රණ ආයතන වෙත යොමු කර ඇත.

- මෙතැම්පිටමින් (අයිස්) භාවිතයේ ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය
- විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණය
- තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය
- දුම රහිත දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය
- මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් නැවත භාවිතයට යොමුවීම සඳහා බලපාන සාධක හඳුනාගැනීම සහ ප්‍රතිකාර ක්‍රියාවලියේ ප්‍රතිඵලදායක බව පිළිබඳ කඩිනම් සමීක්ෂණය

## IV. ශාස්ත්‍රීය ලිපි සම්පාදනය

- මත්ද්‍රව්‍ය අනිසි භාවිතය සහ ගැබිනි මව්වරුන්
- මත්ද්‍රව්‍ය භාවිතය සහ වැඩිහිටි පුද්ගලයින්
- ළමුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත අවදානම් සාධක
- මත්ද්‍රව්‍ය භාවිතය හා මානසික සෞඛ්‍ය

### 10.2.3 පුහුණු වැඩමුළු හා පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම

#### I. පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමේ සැසි

පර්යේෂණ අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණවල අනාවරණ සහ ඒ ආශ්‍රිත නිර්දේශ සම්බන්ධයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සියලුම තාක්ෂණික නිලධාරීන් සහ බාහිර පාර්ශව දැනුවත් කිරීමේ මූලික පරමාර්ථය ඇතිව පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමේ වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2021 වර්ෂය තුළ පහත මාතෘකා යටතේ අදාළ මාර්ගගත සැසි පවත්වා ඇත.

- තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ
- අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ මූලික අනාවරණ
- ශ්‍රී ලංකාවේ මෙතැම්පිටමින් (අයිස්) භාවිතය ආශ්‍රිත ප්‍රවණතා
- මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් නැවත භාවිතයට යොමුවීම සඳහා බලපාන සාධක හඳුනාගැනීම සහ ප්‍රතිකාර ක්‍රියාවලියේ ප්‍රතිඵලදායක බව
- කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිත ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය
- කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව ප්‍රවණතා










#### II. මූලික සංඛ්‍යාන ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන

පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ සම්බන්ධයෙන් සහ වෙනත් විශ්ලේෂණාත්මක වාර්තා ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය වන සංඛ්‍යානමය ක්‍රම ශිල්ප සම්බන්ධ ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් පර්යේෂණ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදි. ආයතනයේ තාක්ෂණික අංශවල නිලධාරීන් ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදි.

## III. ජාතික හා අන්තර්ජාතික පර්යේෂණ සැසි සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම

පර්යේෂණ අංශය විසින් සිදු කරන ලද පර්යේෂණවල අනාවරණ ජාතික මට්ටමින් සහ අන්තර් ජාතික මට්ටමින් පවත්වනු ලබන පර්යේෂණ සැසි සඳහා ඉදිරිපත් කිරීම සිදු කරන ලදි. 2021 වසර තුළ පහත සඳහන් පර්යේෂණ පත්‍රිකා පර්යේෂණ සැසි සඳහා ඉදිරිපත් කරන ලදි.

| අනු අංකය | පර්යේෂණ සැසිය | ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාව |
|---|---|---|
| 1 | **දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික පර්යේෂණ සැසිය 2021 - (දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය)** | • දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන දොරටු රසාගඳයක් ලෙස භාවිතවීම හා ඒ ආශ්‍රිත ප්‍රවණතා<br>• මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවන පුද්ගලයින් භාවිත කරන ප්‍රාථමික මත්ද්‍රව්‍ය වර්ග හා ඒ ආශ්‍රිත කාලීන වෙනස්කම්<br>• හෙරොයින් භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයන්ගේ තුල් භාවිතය ආශ්‍රිත ප්‍රවණතා හා ආර්ථික පිරිවැය<br>• ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල සේවයෙහි නියුතු කම්කරුවන් අතර දුම්කොළ සහ මද්‍යසාර භාවිතය (කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින්) |
| 2 | **බහුවිධ ප්‍රවේශය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය - 2021 (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)** | • තරුණියින්ගේ සහ නව යොවුන්වියේ පසුවන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ<br>• මෙතැම්පිටමින් (අයිස්) භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ පුද්ගල චර්යාමය සහ සෞඛ්‍ය ගැටලු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්<br>• ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත ප්‍රවණතා සහ රටා |

## IV. පුහුණු වැඩසටහන් සහ වැඩමුළු සඳහා සහභාගීත්වය

- UNODC විසින් සංවිධානය කරන ලද ගංජා සහ ගංජා නිෂ්පාදන නියාමනය පිළිබඳ වැඩමුළුව
- ශ්‍රී ලංකා පවුල් සෞඛ්‍ය කාර්යාංශය විසින් සංවිධානය කරන ලද නව යොවුන්විය සහ තරුණ සෞඛ්‍ය පිළිබඳ තෙදින වැඩමුළුව

**V. මත්ද්‍රව්‍ය උපදේශන සහතිකපත් පාඨමාලාව**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සෙසු තාක්ෂණික අංශවල සහයෝගය ඇතිව පර්යේෂණ අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද මත්ද්‍රව්‍ය උපදේශන සහතිකපත් පාඨමාලාව පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ කණ්ඩායම් දෙකක් සඳහා පමණක් පවත්වා ඇත.

| පාඨමාලාව | පැවති කාල පරාසය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 65 කණ්ඩායම | ජනවාරි 16 සිට පෙබරවාරි 27 දක්වා | 30 |
| 66 කණ්ඩායම | මාර්තු 13 සිට අප්‍රේල් 24 දක්වා | 59 |
| **එකතුව** | | **89** |

**VI. රජයේ බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ බඳවාගත් මත්ද්‍රව්‍ය නිවාරණ සහායකයින් පුහුණු කිරීම**

- මත්ද්‍රව්‍ය භාවිතයේ කාලීන ප්‍රවණතා, පර්යේෂණවලට අදාළ දත්ත රැස්කිරීම, දත්ත වාර්තා කරගැනීම සහ සිතියම්කරණය සම්බන්ධයෙන් අදාළ විෂයමාලාව යටතේ පුහුණු සැසි සඳහා සම්පත් දායකත්වය දැක්වීම.

**VII. පර්යේෂණ පුහුණු සැසි**

බාහිරසේවා අංශයේ සහ උතුරු මැද පළාත් සභාවේ ඉල්ලීමක් පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලුගොල්ලෑව ග්‍රාම නිලධාරී වසමේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධ සමීක්ෂණයට අදාළව ක්ෂේත්‍ර සමීක්ෂකයින් පුහුණු කිරීම සහ අවශ්‍ය ප්‍රශ්නාවලි ආකෘති පත්‍ර සකස් කර යොමු කරන ලදි.

**10.2.4 අන්තර්ජාතික සහයෝගීතාවය**

**I. අන්තර් ජාතික මාදක පාලක මණ්ඩලය (INCB) සමඟ දත්ත හුවමාරු කිරීම**

ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තබා ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන සම්මුතීන්වල අන්තර්ගත වගන්ති සහ ඊට අනුෂාංගිකව පැන නගින කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අදාළ තොරතුරු සහ දත්ත මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව INCB වෙත යොමු කරනු ලබයි.

මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විවිධ ආයතන සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය දත්ත කාලීනව යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

**ත්‍රෛමාසිකව යොමු කරන ලද දත්ත වාර්තා**

- මාදක ඖෂධ ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය A) 4 වන කාර්තුව 2020 සහ 1 වන කාර්තුව 2021, 2 වන කාර්තුව 2021, 3 වන කාර්තුව 2021

- 1971 සම්මුතීන් ලැයිස්තු 2හි සඳහන් මනෝවර්තක ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය **A/P**) 4 වන කාර්තුව 2020 සහ 1 වන කාර්තුව 2021, 2 වන කාර්තුව 2021, 3 වන කාර්තුව 2021

**වාර්ෂිකව යොමු කරන ලද දත්ත වාර්තා**

- මාදක ඖෂධ පිළිබඳ අවශ්‍යතා ඇස්තමේන්තු (පෝරමය B)
- 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතීන් ලැයිස්තු 2හි අඩංගු වෛද්‍යමය හා විද්‍යාත්මක අවශ්‍යතා සඳහා වන ඖෂධ වර්ග (පෝරමය B/P)
- මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය නිෂ්පාදනය, පරිභෝජනය, ගබඩා කිරීම හා වැටලීම් පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය C)
- මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය P)
- වාර්ෂික වාර්තා ප්‍රශ්නාවලිය (පෝරමය E)

## II. ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සැසි සඳහා දායකත්වය දැක්වීම

- 2021.12.10 වන දින පැවති එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් සංවිධානය කරන ලද ඉල්ලුම අවම කිරීම සම්බන්ධ සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වූ අතර එහිදී ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් කාලීන තොරතුරු ඇතුලත් ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදි.

- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය සහ මාදක ඖෂධ පිළිබඳ කොමිසමේ (CND) 63 වන සැසි වාරයේ නැවත රැස්වීම (reconvened session) සඳහා සහභාගි වීම.

- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය සහ මාදක ඖෂධ පිළිබඳ කොමිසමේ (CND) 64 වන සැසි වාරය සඳහා සහභාගි වීම.

### 10.2.5 දත්ත පද්ධති කළමනාකරණය

**මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය (Drug Abuse Monitoring System - DAMS)**




මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත්වන පුද්ගලයින්ගේ සහ මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර සේවාවන්වලට ඇතුළත් වන සේවාලාභීන්ගේ දත්ත වාර්තා කිරීමේ සහ එම දත්ත මත පදනම්ව විශ්ලේෂණාත්මක වාර්තා ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම දත්ත පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. මාර්ගගත දත්ත පද්ධතියට සියලුම පොලිස් ස්ථාන සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන (රාජ්‍ය/ රාජ්‍ය

නොවන/ බන්ධනාගාර) මඟින් දත්ත වාර්තා කිරීම සිදුවේ. මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිකාර සඳහා ඇතුළත් වන සේවාලාභීන්ගේ තොරතුරු සෑම කාර්තුවකට වරක් විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කරනු ලබයි. ඒ අනුව 2021 වර්ෂය තුළ දී වාර්තා 04ක් ප්‍රකාශයට පත් කර ඇත.

- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූ සේවාලාභීන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 120 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූ සේවාලාභීන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 121 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූ සේවාලාභීන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 122 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූ සේවාලාභීන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 123 වෙළුම

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට වාර්තා වූ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත් වූ පුද්ගලයින්ගේ තොරතුරු ඇතුළත් අර්ධ වාර්ෂික වාර්තාවක් (මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 61 වෙළුම) සහ වාර්ෂික වාර්තාව (මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 62 වෙළුම) 2021 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කර ඇත.

**මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම**

| 2021-01-01 සිට 2021-12-31 දක්වා | |
|---|---|
| පොලිස් ස්ථානවලින් වාර්තා කරන ලද අත්අඩංගුවට පත් පුද්ගලයින් සංඛ්‍යාව | 35,238 |
| ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් වාර්තා කරන ලද සේවාලාභීන් සංඛ්‍යාව | 1,557 |

දත්ත පද්ධතිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සඳහා 2021 වර්ෂය තුළ පහත කාර්යයන් සිදුකර ඇත.

- දත්ත වාර්තා කිරීමේ පත්‍රිකා මුද්‍රණය කර පොලිස් ස්ථාන සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම
- ප්‍රතිකාර මධ්‍යස්ථානවල නිලධාරීන් සඳහා දත්ත වාර්තා කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික පුහුණුව ලබා දීම
- දත්ත පද්ධතිය සම්බන්ධ තාක්ෂණික ගැටලු මතුවන අවස්ථාවල අදාළ මැදිහත්වීම් සිදුකර ගැටලු නිරාකරණය කර ගැනීමට සහාය දැක්වීම

### 10.2.6 ප්‍රවණතා විශ්ලේෂණය

2021 වර්ෂයේ දී පහත සඳහන් විශ්ලේෂණාත්මක වාර්තා සම්පාදනය කරන ලදි.

- මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට පත්වීම් පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාව
- නව මනෝකාරක මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සම්බන්ධයෙන් (දේශීය හා ගෝලීය) විශ්ලේෂණාත්මක වාර්තාව (ද්විතීයික මූලාශ්‍ර ඇසුරින්)
- හෙරොයින් භාවිතය සම්බන්ධ කෙටි සංඛ්‍යාලේඛන වාර්තාව
- ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන්ට ඇතුළත්වීම් පිළිබඳ කෙටි සංඛ්‍යාලේඛන වාර්තාව
- මත්ද්‍රව්‍ය භාවිතය සහ කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය සම්බන්ධ විශ්ලේෂණාත්මක වාර්තාව

### 10.2.7 සැලසුම් සකස් කිරීම සහ ප්‍රගති වාර්තා සම්පාදනය

සැලසුම් සකස් කිරීම සහ ප්‍රගති වාර්තා සම්පාදනය සම්බන්ධයෙන් 2021 වර්ෂයේ දී පහත සඳහන් කාර්යයන් පර්යේෂණ අංශය විසින් සිදු කරන ලදි.

I. මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ සහ යෝජනා යොමු කිරීම

II. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 1984 අංක 11 දරන පනත 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය පිළිබඳ පනත සංශෝධනය සම්බන්ධයෙන් යෝජනා ලබා දීම

III. මත්ද්‍රව්‍ය උපදේශනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවට අදාළ විෂයමාලා සකස් කිරීමට දායකත්වය දැක්වීම

IV. පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සකස් කිරීම සම්බන්ධයෙන් මැදිහත්වීම සහ දායකත්වය දැක්වීම

V. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පස් අවුරුදු සංයුක්ත සැලැස්ම සම්පාදනය සම්බන්ධයෙන් සියලු තාක්ෂණික අංශ සම්බන්ධීකරණය සහ සියලු තාක්ෂණික අංශවල ක්‍රියාකාරකම් ඇතුළත් කර අවසන් වාර්තාව සකස් කිරීම

VI. කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් සියලු තාක්ෂණික අංශ සහ මූල්‍ය අංශය සම්බන්ධීකරණය කිරීම සහ ප්‍රගති වාර්තා සකස් කර රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කිරීම

VII. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තිය ප්‍රකාරව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන්ට අදාළ ප්‍රගති වාර්තාව සකස් කිරීම සහ ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කිරීම

**10.2.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) 2021 වාර්ෂික මූල්‍යාධාර වැඩසටහන යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර කාර්ය මණ්ඩලයේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහාත්, මත්ද්‍රව්‍ය භාවිත කර රිය ධාවනය සම්බන්ධයෙන් අවශ්‍ය නීති රෙගුලාසි සකස් කිරීම සඳහාත් ඒ සම්බන්ධ අනාවරණ පරීක්ෂණ සිදුකිරීමට අදාළව පොලිස් නිලධාරීන් සහ වෛද්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහාත් වූ ව්‍යාපෘති යෝජනා අදාළ තාක්ෂණික අංශවලින් ලබා ගැනීම

- ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශිත භාරදීමේ ආකෘතීන් (submission formats) අනුව නැවත සකස් කර අදාල කාල වාකවානුව තුළ භාරදීම
- මූල්‍යාධාර ලබාගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ගිවිසුම් අත්සන් කිරීමට සහ මුදල් යොමු කරගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම සිදුකිරීම
- පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ දී අවශ්‍ය වන ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහ වැඩසටහන් සැලසුම් කිරීමට සහාය දැක්වීම
- අවසන් මූල්‍ය වාර්තා සහ තාක්ෂණික වාර්තා ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත යොමු කිරීමට අවශ්‍ය මැදිහත්වීම සිදුකිරීම

**10.2.9 2021 මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව පැවැත් වූ පාසැල් චිත්‍ර සහ රචනා තරඟාවලිය**

- අනෙකුත් අංශවල නිලධාරීන්ගේ දායකත්වය ඇතිව චිත්‍ර සහ රචනා මාතෘකා සකස් කිරීම සහ අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කිරීම
- මාර්ගගත ක්‍රමය හරහා ලද නිර්මාණාත්මක චිත්‍ර සහ රචනා පසුව කාණ්ඩ කිරීම
- සාධනීය මට්ටමේ පැවති රචනා සංගෘහිත කර රචනා සංග්‍රහයක් සම්පාදනය කිරීම

**පර්යේෂණ අංශයේ 2020/21 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම**

| වර්ෂය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| 2020 | 53.05% | 66.5% |
| 2021 | 77% | 45% |

ඉහත වගුවෙහි සඳහන් පරිදි 2020 වර්ෂයේ භෞතික ප්‍රගතිය 53.05% වූ අතර 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 77%ක් විය. රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් නිම කිරීමට නොහැකි වීම මත 2020 වර්ෂයේ භෞතික ප්‍රගතිය 53.05%ක් දක්වා පහත අගයක් ගනු ලැබිණ. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 66.5%ක් වූ අතර 2021 වර්ෂයේ 45%ක් විය. 2021 වර්ෂයේ දී බහුතර වැඩසටහන් ප්‍රමාණයක් මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කරන ලද අතර පර්යේෂණ අනාවරණ සහ තොරතුරු ඇතුළත් ප්‍රකාශන අන්තර්ජාලයේ පළ කිරීමත් සමග ඒ සඳහා මුදල් අවම වශයෙන් වැය විය.

## 10.3 ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය

මණ්ඩලයේ සේවාවන් අතර ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය ද සුවිශේෂි ස්ථානයක් හිමිකර ගනී. මෙම අංශය මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා උපදේශන, ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබා දේ. මෙම වර්ෂයේදී ද මණ්ඩලයේ ස්ථාපිත පුනරුත්ථාපන මධ්‍යස්ථාන මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නිසා විවිධ ප්‍රශ්නවලට මුහුණ දුන් පුද්ගලයින් එම ගැටලුවලින් මුදවා ගැනීම, ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සහනයක් ලබා දීම, ඔවුන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම, අධ්‍යාත්මික සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය ආදී ගුණාත්මක වෙනස්කම් මඟින් ප්‍රතිකාර ක්‍රියාවලිය පෝෂණය කරන ලදි. එමෙන්ම දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය නිවාරණ සහ බාහිරසේවා ක්‍රියාකාරකම් මඟින් සිදුකරන ලද ප්‍රජාව දැනුවත් කිරීම ආශ්‍රිතව ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් සඳහා අවශ්‍ය දායකත්වය ද මෙම අංශය මඟින් ලබාදෙන ලදි. මෙම වසරේ පැවැති කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලට ලියාපදිංචි වන සේවාලාභීන් අඩු වී ඇත.

ප්‍රතිකාර මධ්‍යස්ථානවලට සේවාලාභීන් ඇතුළත් කර ගැනීමේදී පසුගිය වසරේ අනුගමනය කල වර්ගීකරණයම මෙම වසරේ ද අනුගමනය කරන ලදි.

ඒ අනුව,



මධ්‍යම පළාත් යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය
මහනුවර (වයස අවුː 21 ට අඩු සේවාලාභීන්)



නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන
මධ්‍යස්ථානය - නිට්ටඹුව
(අවුː 21 - 32 අතර සේවාලාභීන්)



බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන
මධ්‍යස්ථානය - කොස්වත්ත
(අවුː 32 ට වැඩි සේවාලාභීන්)



දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන
මධ්‍යස්ථානය - ගාල්ල
(අවුː 32 ට වැඩි සේවාලාභීන්)

### 10.3.1 ප්‍රතිකාර වැඩසටහන සඳහා ඇතුළත් කරගැනීම

ඉහත වර්ගීකරණයට අනුව සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් ඇතුළත් කරගත් අතර සුපුරුදු පරිදි මෙම වසරේ ද,

- සිය කැමැත්තෙන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුළත්වීම්
- භාරකරුවන්ගේ ඉල්ලීම් මත ඇතුළත් කිරීම්
- අධිකරණය සහ ප්‍රජා විශෝධන ආයතන මඟින් ඇතුළත් කිරීම්
- වෙනත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීම් මඟින් ඇතුළත් කිරීම්
- බාහිරසේවා මඟින් ඇතුළත් කරගැනීම් සිදුකරන ලදි.

ඉහත සියලු ඇතුළත් කිරීම් අපගේ පළපුරුදු උපදේශකවරුන්ගේ මැදිහත්වීම මත සිදුකල අතර පූර්ව උපදේශන සැසි, අනාවරණ පරීක්ෂණ උපයෝගී කර ගනිමින් සේවාලාභීන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත් කර ගන්නා ලදි.

### ප්‍රතිකාර වැඩසටහනෙහි කාලසීමාව

මණ්ඩලයේ සාමාන්‍ය ප්‍රතිකාර වැඩසටහන මාස 03කි. එහෙත් මෙම වසරේ ඔක්තෝබර් මස සිට මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල නේවාසික ප්‍රතිකාර කාලය මාස 06ක් වන අතර අනතුරුව ඔවුන් බාහිරසේවා සහ ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් සඳහා අනුයුක්ත කර ඇත. කිසියම් සේවාලාභියෙක් නේවාසික ප්‍රතිකාර වැඩසටහන සාර්ථක අයුරින් නිම කළහොත් නේවාසික ප්‍රතිකාර වැඩසටහනින් සමුගත හැකිය. එහෙත් උපදේශකවරයාගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ ප්‍රගති තක්සේරුව අනුව ඔහු තවදුරටත් පුද්ගල සංවර්ධනය කල යුතු අයෙකු නම් ඔහුගේ ප්‍රතිකාර කාලය දීර්ඝ කරනු ලබයි.

### ප්‍රතිකාර වැඩසටහන

නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුළත් කරගත් පසු සෑම මධ්‍යස්ථානයකම ඒ ඒ සේවාලාභියාට අනුරූප වන අයුරින් ප්‍රතිකාර සැලැස්මකට අනුව ප්‍රතිකාර සේවය ලබා දෙන ලදි. විශේෂයෙන්ම සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම මනෝ චිකිත්සක ප්‍රතිකාර ක්‍රමය උපයෝගි කරගනිමින් ඔවුන්ට අදාළ සේවාවන් සපයන ලදි. මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන්ගේ ගැටලු හඳුනාගැනීම, ගැටලු නිර්වචනය කරගැනීම හා ගැටලු විශ්ලේෂණය තුළින් ඔවුන්ට ගැලපෙන ප්‍රතිකාර සැලැස්ම නිර්මාණය කරයි. උපදේශකවරුන්, සහකාර උපදේශකවරුන්ගේ මැදිහත්වීම් යටතේ උපදේශන සහකාරවරුන්ගේ ද සහය ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී පුද්ගල උපදේශනය, කණ්ඩායම් උපදේශනය, පවුල් උපදේශනය, වෘත්තීය මාර්ගෝපදේශනය ක්‍රියාවට නංවයි. එමෙන්ම ආත්ම අභිමානය ඇති කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම්, අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා වූ උපදේශනය, පරිසර රසවින්දනය ආශ්‍රිත ක්‍රියාකාරකම්, වින්දනාත්මක ගුණාංග සංවර්ධනය වැනි සේවාලාභියා සතු වූ විවිධ ගුණාංගයන් දියුණු කරලීමේ අරමුණෙන් වූ ප්‍රතිකාර සැලැස්මක් උපයෝගී කරගැනීම මඟින් අදාළ සේවාවන් ලබාදෙන ලදි.

**දෛනික වැඩසටහන**

සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම නේවාසික සේවාලාභීන් සඳහා පොදු දෛනික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. පෙ:ව 5.30 සිට රාත්‍රි 10.00 දක්වා ක්‍රියාත්මකවන මෙම වැඩසටහන උදාහමුව, භාවනා වැඩසටහන්, එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩා වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, වෘත්තීය පුහුණු වැඩසටහන්, නිශ්ශබ්ද කාලය, විනෝදාත්මක වැඩසටහන්, පුද්ගල සහ කණ්ඩායම් උපදේශන සැසි, සැඳෑ හමුව වැනි විවිධ ක්‍රියාකාරකම් මෙහි අන්තර්ගතව ඇත.

**අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන**

මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් තුළින් ගිලිහී ගිය අධ්‍යාත්මික චර්යාවන් යළිත් පෝෂණය කිරීමේ අරමුණින් ප්‍රතිකාර මධ්‍යස්ථානයන්හි අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. සෑම පුර පසළොස්වක පොහොය දිනකම සෑම මධ්‍යස්ථානයකම නේවාසික සේවාලාභීන් සිල් සමාදම් කරවීම, ඔවුන් ධර්ම දේශනා සඳහා සවන් දීමට යොමු කිරීම, මධ්‍යස්ථානවල වෙසක් කාඩ් සහ වෙසක් කූඩු නිර්මාණය, සේවාලාභීන් දානමය පිංකම් සඳහා යොමු කිරීම, පොසොන් උත්සවය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඒ අතර වේ. 2021 වසර තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද සේවාලාභීන් සර්ව ආගමික වැඩසටහන්වලට සම්බන්ධ වන ලදි.



සිල් වැඩසටහන - නවදිගන්ත මධ්‍යස්ථානය



සිල් වැඩසටහන - තලංගම මධ්‍යස්ථානය



සදහම් යාත්‍රා වැඩසටහන - ගාල්ල මධ්‍යස්ථානය



සිල් වැඩසටහන - මහනුවර මධ්‍යස්ථානය

**වෘත්තීය පුහුණු වැඩසටහන්**

මෙම වසරේ ද ප්‍රතිකාර මධ්‍යස්ථානයන්හි සේවාලාභීන් විවිධ වූ වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් සිදු කරන ලදි. දෛනික ප්‍රතිකාර වැඩසටහන ක්‍රියාත්මක වන අතරතුර සේවාලාභීන්ගේ දායකත්වය මත වසර පුරාම මෙම වැඩසටහන ක්‍රියාවට නංවන ලදි.

**මධ්‍යස්ථාන තුළ ක්‍රියාත්මක කල පුහුණු වැඩසටහන්**

| මධ්‍යස්ථානය | වැඩසටහන් |
|---|---|
| යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය මහනුවර | ලියුම් කවර සැකසීම, කෘෂි කටයුතු, ඇන්තුරියම් වගාව, ඕකිඩ් වගාව |
| තලංගම මධ්‍යස්ථානය | ලියුම් කවර සැකසීම, සුබ පැතුම්පත් නිර්මාණය |
| නවදිගන්ත මධ්‍යස්ථානය | ලියුම් කවර සැකසීම, ඉදල් සැකසීම, කෘෂි කටයුතු (පොල්, ගම්මිරිස්, මඤ්ඤොක්කා) |
| ගාල්ල මධ්‍යස්ථානය | ලියුම් කවර සැකසීම, කෘෂි කටයුතු, මල් වගා කටයුතු, ඉන්ටලොක් ගල් සැකසීම, සිමෙන්ති බංකු සෑදීම |

**විශේෂිත වැඩසටහන්**

ප්‍රතිකාර සහ දෛනික වැඩසටහනට අමතරව සෑම මධ්‍යස්ථානයකම සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා වසර තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක විය. රචනා, චිත්‍ර, මසකට වරක් පැවැත්වෙන පැදුරු සාජ්ජය වැනි සුවිශේෂි වැඩසටහන් මෙයට අයත් ය. ආගමික උත්සව, ක්‍රීඩා තරග, බැති ගී ප්‍රසංග, වසර අවසාන ප්‍රාසාංගික වැඩසටහන්, අභිප්‍රේරණ වැඩසටහන් ද ඒ අතර වේ.



නත්තල් උත්සවයට සමගාමී වූ ගීතිකා වැඩසටහන
නවදිගන්ත මධ්‍යස්ථානය



ළමා දින විශේෂ වැඩසටහන
නුවර මධ්‍යස්ථානය

**ආදායම් උත්පාදනය**

මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල මෙම වසරේ ද ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ග දෙකක් දක්නට ලැබිණි. නවදිගන්තය සහ මහනුවර මධ්‍යස්ථානවල පොල් වගාව තුළින් ලබාගන්නා ලද ආදායම් සහ මධ්‍යස්ථානවල ගෙවීම් පදනම මත ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ සේවාලාභීන්ගෙන් ලැබූ ආදායම් වශයෙනි.

**උපදේශන සහ ප්‍රතිකාර සේවා සැපයීම**

අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ ප්‍රධාන කාර්යාලය මඟින් උපදේශන සේවා, සේවාලාභීන් 2,730 දෙනෙක් සඳහා සපයා ඇති අතර මධ්‍යස්ථාන නේවාසික ප්‍රතිකාරයට ඇතුලත් කරගත් සමස්ත සේවාලාභීන් සංඛ්‍යාව 840කි.

### 10.3.2 බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - තලංගම

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 40කට නේවාසික ප්‍රතිකාරය ලබාදිය හැකිය. මධ්‍යස්ථාන ප්‍රතිකාර වැඩසටහන අංශ 3කින් සමන්විත වේ. එනම් සාමාන්‍ය අංශය, ගෙවීම් අංශය, කාන්තා අංශය වශයෙනි. මධ්‍යස්ථානය මඟින් 2021 වසරේ සේවාලාභීන් 1,068 දෙනෙක් සඳහා උපදේශන කටයුතු සිදුකර තිබූ අතර ඉන් සේවාලාභීන් 180 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදි. සාමාන්‍ය අංශය මඟින් සේවාලාභීන් 137 දෙනෙක් සඳහා ද, ගෙවීම් අංශය මඟින් සේවාලාභීන් 41 දෙනෙක් සඳහා ද, කාන්තා අංශය සඳහා ද නේවාසික පහසුකම් ලබා දෙන ලදි.

| උපදේශන/ නේවාසික ප්‍රතිකාර සේවාවන් | සේවා ලැබූ සංඛ්‍යාව |
|---|---|
| උපදේශන | 1,068 |
| නේවාසික ප්‍රතිකාර | 180 |

මෙම වසරේ සිට සේවාලාභීන්ගේ නේවාසික ප්‍රතිකාර ධාරිතාවය ඉහළ නැංවීම සඳහා තලංගම මධ්‍යස්ථානය නවීකරණය කරන ලදි. එමෙන්ම ජාතික මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණය පුහුණු කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදි.

**මෙම මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කල විශේෂිත වැඩසටහන්**

- සදහම් යාත්‍රා ආගමික වැඩසටහන සහ සෑම පුර පසළොස්වක පොහොය දිනකම සිල්සමාදන් වැඩසටහන්, ධර්ම දේශනා සහ ධර්ම සාකච්ඡා පැවැත්වීම
- විශ්වවිද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩසටහන්
- ක්‍රිකට් තරඟාවලි පැවැත්වීම, කැරම්, වොලිබෝල්, දාම්, බැඩ්මින්ටන්, ක්‍රිකට් ක්‍රීඩා කටයුතු
- මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනික වැඩසටහන්
- සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා පැදුරු සාජ්ජය පැවැත්වීම, "නාදනු" ප්‍රසංගය වැනි සංගීත වැඩසටහන් පැවැත්වීම
- කාර්ය මණ්ඩල පුහුණු සැසි, ලිංගාශ්‍රිත රෝග, කොවිඩ් - 19 සහ ක්ෂය රෝග පිළිබඳ විශේෂ දේශන
- වෙසක් උත්සවය ආශ්‍රිත ආගමික ක්‍රියාකාරකම්, වෙසක් කූඩු නිර්මාණ
- සිංහල අලුත් අවුරුදු උත්සවය
- කාන්තාවන් සඳහා උපදේශන සහ ප්‍රතිකාර සේවා පවත්වා ගෙන යාම
- ඩෙංගු මර්ධන වැඩසටහන් සහ ශ්‍රමදාන
- නවක සංවර්ධන නිලධාරීන් පුහුණු වැඩසටහන්
- ලෝක ළමා දිනයට සමගාමීව විශේෂිත වැඩසටහන
- නත්තල් උත්සවය, වසර අවසන් සාදය (31 වන දින රාත්‍රිය)



විශේෂ වැඩසටහන් - තලංගම මධ්‍යස්ථානය

### 10.3.3 මධ්‍යම පළාත් (යොවුන්) ප්‍රතිකාර මධ්‍යස්ථානය - මහනුවර

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 35 දෙනෙකුට එකවර සේවය ලබා දිය හැකිය. මෙම වසරේ මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 155 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ලබා දී තිබූ අතර ඉන් සේවාලාභීන් 125 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදි.

| උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා | සේවා ලැබූ සංඛ්‍යාව |
|---|---|
| උපදේශන | 155 |
| නේවාසික ප්‍රතිකාර | 125 |

**මධ්‍යම පළාත් (යොවුන්) ප්‍රතිකාර මධ්‍යස්ථානය මඟින් පහත සඳහන් සුවිශේෂී වැඩසටහන් මෙම වසර තුල ක්‍රියාත්මක කරන ලදි.**

- සේවාලාභීන්ගේ චින්තන හැකියාවන් සංවර්ධනය සඳහා "ක්ෂේම භූමි" සමිතිය පැවැත්වීම
- සදහම් යාත්‍රා ආගමික වැඩසටහන, සිල් සමාදන් වීමේ වැඩසටහන, ධර්ම දේශනා පැවැත්වීම
- ඔවුන්ගේ දැනුම සහ කුසලතා සංවර්ධන ක්‍රියාවලිය යටතේ විවාද තරඟාවලි, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, රචනා තරඟ, චිත්‍ර තරඟ, අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා සූදානම් කරවීම මෙන්ම ඉංග්‍රීසි පන්ති පැවැත්වීම.
- පවුල් සබඳතා ගොඩනැඟීම සඳහා සෑම මසකට වරක් දෙමාපිය හමු පැවැත්වීම, රසාස්වාදය දියුණු කරවීම උදෙසා චිත්‍රපටි නැරඹීම, පැදුරු සාජ්ජය පැවැත්වීම, "හැකි නම් අඳින්න" වැනි කණ්ඩායම් ක්‍රියාකාරකම්, සැඳෑ හමු, විවිධ නාට්‍ය රඟ දැක්වීම්, කෙටි කථා, ගීත ගායනා වැනි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
- සිංහල අලුත් අවුරුදු උත්සවය සැමරීම, ඒ සඳහා විවිධ ජන ක්‍රීඩා පැවැත්වීම, වෙසක් උත්සවය සඳහා ආගමික වැඩසටහන් පැවැත්වීම, වෙසක් කූඩු නිර්මාණ කටයුතු
- දීපවාලී දින විශේෂ වැඩසටහන
- වොලිබෝල්, ක්‍රිකට්, කැරම්, දාම්, චෙස් තරඟාවලි පැවැත්වීම
- මාසිකව කාර්ය මණ්ඩල හා ප්‍රතිකාර හමු පැවැත්වීම

- 5S වැඩසටහන
- පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් - පළාත් කමිටු රැස්වීම
- සේනපුර ප්‍රතිකාර මධ්‍යස්ථානයේ උපදේශන වැඩසටහන්
- මාතලේ මහරෝහලේ මත්ද්‍රව්‍ය උපදේශන ලබා දීම
- විවිධ සෞඛ්‍ය වැඩසටහන් - ඩෙංගු මර්ධන ශ්‍රමදාන, රෝග නිවාරණය පිළිබඳ පුහුණු වැඩසටහන්, විෂබීජහරණ වැඩසටහන
- ලෝක ළමා දිනයට සමගාමීව විශේෂිත ක්‍රියාකාරකම්
- වෘත්තීය පුහුණුව වශයෙන් ලියුම් කවර, ඕකිඩ් වගාව ආශ්‍රිත ක්‍රියාකාරකම්, කෘෂිකාර්මික කටයුතු, වෘත්තීය මාර්ගෝපදේශන, සුබපැතුම් කාඩ්පත් නිර්මාණ
- වසර අවසානයේ නත්තල් උත්සවය සහ දෙසැම්බර් 31 වන දින වර්ණ රාත්‍රිය පැවැත්වීම
- නැටුම්, සංගීත සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම දරුවන්ට ලබාදීම
- නව පත්වීම් ලද සංවර්ධන නිලධාරීන්, මත්ද්‍රව්‍ය නිවාරණ සහයකයින් පුහුණු කිරීමේ වැඩසටහනට සම්පත් දායකත්වය ලබා දීම
- මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජකාරී කටයුතු සිදු කිරීම



කොවිඩ් 19 නිවාරණ වැඩසටහන



ලෝක ළමා දින වැඩසටහන

### 10.3.4 දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - ගාල්ල

මෙම මධ්‍යස්ථානය මගින් ද එකවර සේවාලාභීන් 40කට සේවය සැපයිය හැකිය. ඒ අනුව දෛනිකව මෙම වසර තුළ සේවාලාභීන් 123 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ද සේවාලාභීන් 116 දෙනෙක් නේවාසික ප්‍රතිකාර කටයුතු සඳහා ද ඇතුලත් කරගෙන තිබුණි.

| උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා | සේවා ලැබූ සංඛ්‍යාව |
|---|---|
| උපදේශන | 123 |
| නේවාසික ප්‍රතිකාර | 116 |

**මෙම මධ්‍යස්ථානය මඟින් ද නේවාසික සේවාලාභීන් සඳහා පහත සඳහන් වැඩසටහන් වසර තුළ ක්‍රියාත්මක කරන ලදි.**

- ඩෙංගු මර්දන වැඩසටහන්, ආයුර්වේද සෞඛ්‍ය සායන, කායික හා මානසික සෞඛ්‍ය ආශ්‍රිත දේශන, මධ්‍යස්ථානය තුළ ශ්‍රමදාන කටයුතු
- සදහම් යාත්‍රා, මාස්පතා සිල් සමාදන් වැඩසටහන්, වෙසක් සහ පොසොන් උත්සව ආශ්‍රිත ක්‍රියාකාරකම්
- වෙසක් කූඩු නිර්මාණය
- මාසිකව කාර්ය මණ්ඩල සහ ප්‍රතිකාර හමු පැවැත්වීම
- කෘෂිකාර්මික වැඩසටහන්, ඖෂධ වගාව, වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම
- මත්ද්‍රව්‍ය නිවාරණ සහයක සහ සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩල පුහුණු සැසි පැවැත්වීම
- යෝගා වැඩසටහන්
- සේවාලාභීන්ගේ රසාස්වාදය දියුණු කිරීමේ වැඩසටහන් - පැදුරු සාජ්ජය, සංගීත වැඩසටහන්
- ලෝක ළමා දින ආශ්‍රිත විශේෂ දේශන
- අවුරුදු උළෙල, නත්තල් උත්සවය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- වොලිබෝල්, ක්‍රිකට්, දාම්, චෙස්, කැරම් වැනි ක්‍රීඩා
- කාය වර්ධන වැඩසටහන්
- වසර අවසන් වර්ණ රාත්‍රිය



වසර අවසන් වර්ණ රාත්‍රිය - ගාල්ල මධ්‍යස්ථානය

**10.3.5 නව්දිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - නිට්ටඹුව**

සේවාලාභීන් 100කට එකවර සේවය සැපයිය හැකිය. 2021 වසරේ උපදේශනය සැපයූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව 1,095කි. ඉන් සේවාලාභීන් 419 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාරය ලබා දී තිබුණි.

| උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා | සේවා ලැබූ සංඛ්‍යාව |
|---|---|
| උපදේශන | 1,095 |
| නේවාසික ප්‍රතිකාර | 419 |

**නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය මඟින් මෙම වසර තුළ පුනරුත්ථාපන වැඩසටහනෙහි පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදි.**

- සදහම් යාත්‍රා - මාසික සිල් සමාදන් වැඩසටහන, බෝධි පූජා වැඩසටහන්
- සිංහල අලුත් අවුරුදු උත්සවය
- වෙසක්, පොසොන්, නත්තල් උත්සව ආශ්‍රිත ක්‍රියාකාරකම්
- සංගීත චිකිත්සාව, පැදුරු සාජ්ජය, නැටුම් සහ නාට්‍ය වැඩසටහන්, කවි නිර්මාණ
- ඩෙංගු මර්ධනය ආශ්‍රිත ක්‍රියාකාරකම්, ශ්‍රමදාන කටයුතු
- කාර්ය මණ්ඩල පුහුණු සැසි
- ප්‍රතිකාර හමු, දෙමාපිය හමුව
- පවුල් හමුව, කණ්ඩායම් උපදේශන, පුද්ගල උපදේශන, අධ්‍යාපන වැඩසටහන්
- වෘත්තීය පුහුණු වැඩසටහන්
- ලිංගාශ්‍රිත රෝග පිළිබඳ වැඩසටහන් - වතුපිටිවල මූලික රෝහලෙහි පැවැත්වීම, කායික හා මානසික සෞඛ්‍ය පිළිබඳ දේශන
- ක්‍රිකට්, වොලිබෝල් තරගාවලි පැවැත්වීම, ගෘහස්ථ ක්‍රීඩා (කැරම්, දාම්) පැවැත්වීම
- විශ්වවිද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩසටහන්
- නත්තල් වැඩසටහන, 31 වර්ණ රාත්‍රිය



නත්තල් දින (කැරොල් ගීතිකා) වැඩසටහන - නවදිගන්ත මධ්‍යස්ථානය

### 2021 වර්ෂයේ නවදිගන්ත මධ්‍යස්ථානයේ ප්‍රතිකාර වැඩසටහනේ නව ප්‍රවණතා

වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව "මතින් නිදහස් ජාතියක් - සෞභාග්‍යමත් දේශයක්" සංකල්පය අනුව ගරු ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න මැතිතුමාගේ මඟපෙන්වීම යටතේ

සේවාලාභීන් 1000කට එකවර පුනරුත්ථාපන සේවාවන් ලබා දීම සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ අත්තනගල්ල රජමහා විහාරාධිපති සීනාදී සිව් කෝරළයේ ප්‍රධාන සංඝනායක මහෝපාධ්‍යාය, ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද හිමියන්ගේ ධන පරිත්‍යාගයෙන් ප්‍රතිකාර ගොඩනැගිල්ලකට මුල්ගල තබන ලද අතර සේවාලාභීන් 64කට එකවර නේවාසික පහසුකම් ලබා දිය හැකි මෙම ගොඩනැගිල්ල 2021 ජනවාරි මස 26 දින සේවාලාභීන් වෙනුවෙන් විවෘත විය. ඒ අනුව මෙම වර්ෂය පුරා මෙම ගොඩනැගිල්ල තුළ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ සේවාලාභීන් සඳහා අඛණ්ඩ පුනරුත්ථාපන සේවාවක් ලබා දෙන ලදි.




නව ප්‍රතිකාර ගොඩනැගිල්ල විවෘත කළ අවස්ථාව

එමෙන්ම එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ කාර්යාලය (UNODC) මඟින් එක් ගොඩනැගිල්ලක් සඳහා ධන පරිත්‍යාග කරන ලද අතර එම ගොඩනැගිල්ලේ වැඩ කටයුතු මේ වන විට නිම වෙමින් පවතී.

අනුරාධපුරය "අවුරා" ආයතනයේ අධිපති වෛද්‍ය තාඹුගල විසින් සේවාලාභීන් 64කට එකවර නේවාසික පහසුකම් සැපයිය හැකි ප්‍රතිකාර ගොඩනැගිල්ලකට අරමුදල් පරිත්‍යාග කළ අතර මෙම වසරේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ විය.

**මෙම ව්‍යාපෘතියේ අරමුණු ලෙස.....**

- මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් වැඩි පිරිසකට එකවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවා ලබා දී ඔවුන් යහපත් පුරුවැසියන් ලෙස සමාජගත කර නීතිය හා සාමය වර්ධනය කර ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීම මඟින් රටේ ශ්‍රම බලකායට දායකත්වය ලබා ගැනීම
- මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් එයින් මුදවා ඔවුන්ගේ පෞරුෂ ගුණාංග තවදුරටත් සංවර්ධනය කිරීම
- මත්ද්‍රව්‍ය හේතුවෙන් සමාජයේ ඇති වී ඇති ගැටුම් සහ මත්ද්‍රව්‍ය නිසා ඇතිවන්නා වූ සෞඛ්‍යමය ගැටලු අවම කිරීම
- පුනරුත්ථාපනය තුළින් ඇබ්බැහිවූවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

- සේවාලාභීන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සහ ආයතනය විධිමත් පහසුකම් සහිත ස්ථානයක් බවට පත් කිරීම
- මණ්ඩලය සඳහා බඳවාගත් නවක තාක්ෂණික නිලධාරීන් පුහුණු කිරීම/ වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන් පුහුණු කිරීම

### 10.3.6 මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා පවත්වන ලද වෘත්තීය පුහුණු හා පෞරුෂ සංවර්ධන වැඩසටහන

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා නේවාසික ප්‍රතිකාරයට අමතරව ඔවුන්ගේ පෞරුෂ ගුණාංග තවදුරටත් සංවර්ධනය කර රටේ ආර්ථික සංවර්ධනයට සේවාලාභීන් දායක කරගැනීම සඳහා ජාතික යොවුන් සේනාංකය සමඟ ඒකාබද්ධව පෞරුෂ සංවර්ධන හා මෘදු කුසලතා වැඩසටහනක් කටුනායක පිහිටි ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථානයේ දී ආරම්භ කරන ලදි. මෙම වැඩසටහන සඳහා අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් මූලික නේවාසික වැඩසටහන සම්පූර්ණ කල සේවාලාභීන් 25 දෙනෙක් සහභාගී වන ලදි. 2021 දෙසැම්බර් මස සේවාලාභීන්ගේ විසිරයාමේ උත්සවය බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ දී ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පැවැත් වූ අතර මෙම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේ දී පෞරුෂ සංවර්ධන වැඩසටහන සාර්ථකව නිමා කළ සේවාලාභීන් වෙනුවෙන් විවිධ වෘත්තීය පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදු විය. මෙම උත්සවය ජාතික යොවුන් සේනාංකය විසින් සංවිධානය කර තිබුණි.




### 10.3.7 මත්ද්‍රව්‍ය භාවිතා කරන සේවාලාභීන්ට උපදේශන, ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබා ගැනීම සඳහා පවතින පහසුකම් වැඩි දියුණු කිරීම - තලංගම මධ්‍යස්ථානය

සභාපතිතුමියගේ උපදෙස් පරිදි තලංගම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ධාරිතාවය වැඩිදියුණු කරමින් නව පහසුකම්වලින් යුතුව නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණය කළ අතර එය ගරු ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මැතිතුමාගේ සුරතින් 2021 දෙසැම්බර් මස 14 වන දින සේවාලාභීන් සඳහා විවෘත විය.



**10.3.8 මත්ද්‍රව්‍ය භාවිතා කරන කාන්තා සේවාලාභීන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම - ගාල්ල මධ්‍යස්ථානය**

කාන්තා සේවාලාභීන් උදෙසා උපදේශන සහ ප්‍රතිකාර සේවාවන් පුළුල් කිරීම සඳහා ගාල්ල මධ්‍යස්ථානය කාන්තාවන් වෙනුවෙන් ද නේවාසික පුනරුත්ථාපන සේවාවන් ලබා ගත හැකි මධ්‍යස්ථානයක් ලෙස වැඩකටයුතු ආරම්භ කරන ලදි.

**පසුරුකවරණ වැඩසටහන - 2021**

එක් එක් මධ්‍යස්ථාන මඟින් 2021 වර්ෂය තුළ කරන ලද පසුරුකවරණ තොරතුරු පහතින් දක්වා ඇත. මෙහිදී සේවාලාභීන් මධ්‍යස්ථානයට ගෙන්වා ගැනීම, දුරකතන මාර්ගයෙන් තොරතුරු ලබාගැනීම, බාහිරසේවා වැනි ක්‍රම උපයෝගී කරගෙන ඇත.

**පසුරුකවරණ වැඩසටහන සඳහා යොමු කර ගනු ලැබූ සේවාලාභීන් ප්‍රමාණය**

| මධ්‍යස්ථානය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තලංගම පසුරුකවරණ | 21 | 17 | 16 | 11 | 18 | 03 | 06 | 10 | 22 | 15 | 16 | 11 |
| නිදහස් පිරිස | 10 | 10 | 13 | 10 | 15 | 00 | 02 | 10 | 12 | 10 | 16 | 11 |
| නුවර පසුරුකවරණ | 17 | 32 | 151 | 38 | 28 | 27 | 24 | 27 | 23 | 21 | 16 | 14 |
| නිදහස් පිරිස | 17 | 26 | 133 | 34 | 10 | 22 | 20 | 25 | 19 | 00 | 13 | 12 |
| ගාල්ල පසුරුකවරණ | 94 | 27 | 49 | 48 | 292 | 156 | 78 | 24 | 72 | 31 | 27 | 16 |
| නිදහස් පිරිස | 39 | 15 | 35 | 30 | 117 | 71 | 45 | 05 | 26 | 12 | 16 | 08 |
| නවදිගන්තය පසුරුකවරණ | 27 | 22 | 205 | 262 | 305 | 341 | 11 | 99 | 177 | 184 | 85 | 122 |
| නිදහස් පිරිස | 27 | 16 | 89 | 126 | 106 | 186 | 11 | 54 | 96 | 92 | 42 | 44 |




ඉහත සඳහන් තොරතුරු අනුව 2021 වසරේ පසුරුකවරණ කටයුතු කළ සේවාලාභීන්ගෙන් තලංගම මධ්‍යස්ථානයේ 166ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 914ක් ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 1840ක් ද, නුවර මධ්‍යස්ථානයේ සේවාලාභීන් 435ක් ද ප්‍රධාන කාර්යාලය මඟින් සේවාලාභීන් 215ක් වශයෙන් වන අතර මින් තලංගම මධ්‍යස්ථානයේ 119ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 419ක් ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 889ක් ද, නුවර මධ්‍යස්ථානයේ සේවාලාභීන් 331ක් දෙනෙක් ද මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්ව සිටි බවට වාර්තා විය. මේ අනුව අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් පමණක් පුනරුත්ථාපනය වී නිදහස්වූවන්ගෙන් 1758ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වී ඇත.

**ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ 2020/21 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම**

| වර්ෂය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| 2020 | 76% | 73% |
| 2021 | 73% | 78% |

ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ 2020 වර්ෂයේ භෞතික ප්‍රගතිය 76% ක් සහ 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 73% වශයෙන් ද මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 73% ක් සහ 78% ක් වශයෙන් 2020 සහ 2021 වර්ෂවලදී දැකගත හැකි විය. පහත දැක්වෙන පොදු කරුණු මෙම විචල්‍යයන් සඳහා හේතු ලෙස දැක්විය හැකිය.

- රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් සේවාලාභීන් මධ්‍යස්ථානගත වීම අඩු වීම.
- කාර්ය මණ්ඩල නිලධාරීන් විවිධ පුහුණු සැසි සඳහා මාර්ගගත ක්‍රමයට සම්බන්ධ වීම.
- ඉන්ධන අර්බුදය සහ ප්‍රවාහන අපහසුතා හේතුවෙන් පසුරැකවරණ කටයුතු සඳහා සේවාලාභීන් මධ්‍යස්ථාන වෙත ගෙන්වා ගැනීම අඩු වීම.
- වර්තමානයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල සිටිය යුතු කාර්ය මණ්ඩලයට වඩා අවම කාර්ය මණ්ඩලයකින් ප්‍රතිකාර ක්‍රියාවලිය පවත්වාගෙන යාමට සිදුව තිබීම.

## 10.4 නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත අනුව සියලු පෞද්ගලික සහ නාමෝදිෂ්ඨ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන විමර්ශනයට භාජනය කරන ලදි. මෙම අංශයෙහි අධීක්ෂණය යටතේ නම් කරන ලද ප්‍රතිකාර මධ්‍යස්ථාන 11ක් ද, පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන 23ක් ද ඇත.

**නම් කරන ලද ප්‍රතිකාර මධ්‍යස්ථාන වශයෙන් හඳුන්වන බන්ධනාගාර**

| | | | |
|---|---|---|---|
| 1 | පල්ලේකැලේ | 7 | කන්දෙවත්ත |
| 2 | වටරැක | 8 | මීතිරිගල |
| 3 | තල්දෙන | 9 | කලුතර |
| 4 | වීරවිල | 10 | අඹේපුස්ස |
| 5 | අනුරාධපුරය | 11 | කන්දකාඩු |
| 6 | පල්ලන්සේන | | |

ඉහත සඳහන් කල නාමෝදිෂ්ඨ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ රැඳවියන්ගේ උපදේශන කටයුතු සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ උපදේශන නිලධාරීන් එම මධ්‍යස්ථාන තුළට අනුයුක්ත කර ඇත.

නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානවල (බන්ධනාගාර) සහ පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සේවාලාභීන් සඳහා ගුණාත්මක ප්‍රතිකාර ක්‍රමවේදයක් හඳුන්වාදීමේ අරමුණින්, පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන සහ බන්ධනාගාර සඳහා ප්‍රතිකාර අත්පොත් 05ක් සකස් කරන ලදි. එමෙන්ම නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ කමිටු දෙකක් පත් කරන ලදි.

**2021 වසරේ දී නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවල පවත්වන ලද වැඩසටහන් හා මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම.**

| වැඩසටහනේ නම | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ සේවාලාභීන් ගණන |
|---|---|---|
| පුද්ගල උපදේශනය | 520 | 520 |
| කණ්ඩායම් උපදේශනය | 122 | 550 |
| පවුල් උපදේශනය | 19 | 25 |
| විශේෂ වැඩසටහන් (සති පාසල වැඩසටහන ද ඇතුලුව) (බන්ධනාගාර/ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන) | 15 | 550 |

| | | |
|---|---|---|
| නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන් | 12 | 150 |
| නිවාරණ හා අධ්‍යාපන වැඩසටහන් (බන්ධනාගාර/ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන) | 36 | 550 |
| පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන විමර්ශනය | 107 | - |
| නාමෝද්දිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන (බන්ධනාගාර) විමර්ශනය | 13 | - |

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ අධීක්ෂණය වන පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ 2021 වර්ෂයේ දී නේවාසිකව ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් ප්‍රමාණය**

| | **ප්‍රතිකාර මධ්‍යස්ථානය** | **ලිපිනය** | **දුරකථන අංකය** | **2021 වර්ෂය සඳහා ඇතුළත් වූ සේවාලාභීන් ප්‍රමාණය** |
|---|---|---|---|---|
| 01 | මිතුරු මිතුරෝ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | මිතුරු මිතුරෝ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය රිල්හේන, පැල්මඩුල්ල | 045 2274363 | 153 |
| 02 | නිදහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | නිදහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 26, ශ්‍රී සද්ධාතිස්ස මාවත, හිග්ගස්හේන, කුරුවිට | 071 8714377 | මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයට ඇතුළත් කර ගනු ලබන සේවාලාභීන් මෙම මධ්‍යස්ථානය සඳහා පසුව යොමු කරනු ලබයි |
| 03 | සෙනෙහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | සෙනෙහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 80, තුන්බෝවිල, පිළියන්දල | 011 2613242<br>077 1251578 | 67 |
| 04 | නිසංසල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | නිසංසල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 108, කීනිගම, බුත්පිටිය | 033 3555740 | 32 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | කරුණාවේ නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | කරුණාවේ නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඇලිබ, කඳන, හොරණ | 034 4940277 | 45 |
| 06 | මිදුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | මිදුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය සමන් පියස, විජය කුමාරතුංග මාවත, එඬේරමුල්ල, වත්තල | 011 2980024 | 47 |
| 07 | බලය නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | බලය නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය පරමාවලහේන වත්ත, බමුණුමුල්ල, බණ්ඩාරගම | 038 4924889 | 14 |
| 08 | සුමිත්‍රයෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානය | සුමිත්‍රයෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 60, මැල් මැදුර, හෝර්ටන් පෙදෙස, කොළඹ 07 | 011 2694665 | උපදේශනය පමණි |
| 09 | ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (සමාජ සේවා දෙපාර්තමේන්තුව) | ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අම්බලම් වත්ත උතුර, පුවක්පිටිය, අවිස්සාවේල්ල | 071 4445957 | 139 |
| 10 | සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (සමාජ සේවා දෙපාර්තමේන්තුව) | සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඌව පලාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, හාලි ඇළ, උඩුවර | 055 4934954 | 06 |
| 11 | විමෝචන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | විමෝචන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නව කල්මුණේ පාර, මඩකලපුව | 077 6684671 | 51 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 60/14, ෆාතිමා වත්ත, දළුවකොටුව, කොච්චිකඩේ | 071 5352908<br>071 9423916 | පිරිමි - 622<br>කාන්තා - 11 |
| 13 | යෞවන කිතුමඟ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | යෞවන කිතුමඟ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 289/1/ඒ, කලු අඳුර, හේවාඉන්න, අවිස්සාවේල්ල | 077 7250754 | 64 |
| 14 | පැතුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | පැතුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය මල්වත්ත, සියඹලාගොඩ, පොල්ගස්ඕවිට | 077 7368332 | මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානයට ඇතුළත් කර ගනු ලබන සේවාලාභීන් මාස 06ක ප්‍රතිකාර කාලයෙන් පසු වෘත්තීය පුහුණුව සඳහා මෙම මධ්‍යස්ථානයට යොමු කරනු ලබයි. |
| 15 | අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය වාස් සෙන්ටර්, එෆ්. ආර්. ඩයස් මාවත, වෙන්නප්පුව | 077 7898232 | 17 |
| 16 | නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය උණවටුන, ගාල්ල | 077 1277474<br>077 9563207 | 247 |
| 17 | යහපත් සමාරියයා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | යහපත් සමාරියයා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 50/5/ඒ, රාවත්ත පටුමග, මට්ටක්කුලිය, කොළඹ 15 | 071 4625598 | 29 |
| 18 | පොරොන්දු දේශය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | පොරොන්දු දේශය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 389/බී, මාදම්පිටිය, කොළඹ 14 | 077 6763138<br>072 9870969 | 92 |

| | | | | |
|---|---|---|---|---|
| 19 | ක්‍රාඩා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | ක්‍රාඩා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය කුඩා දුම්රියපොල පාර, තොට්ටවැලි ෆාම්, මන්නාරම | 077 6655230 | 18 |
| 20 | අඳුරින් ආලෝකය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | අඳුරින් ආලෝකය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නො.56, නැගෙනහිර කලුවරිප්පුව, කටාන | 077 7222974 | 79 |
| 21 | සතුට බලාපොරොත්තුවේ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | සතුට බලාපොරොත්තුවේ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නාවින්න වත්ත, කඩිගාව, රස්නායකපුර | 076 5821740 | 93 |
| 22 | නවජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | නවජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නිශ්ශංක මල්ලවපුර, පොළොන්නරුව | 076 7727680 | 53 |
| 23 | සිලෝවම් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | සිලෝවම් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය දලුපොත, මීගමුව | 077 1146266<br>071 1258090 | 340 |
| **ප්‍රතිකාර ලබාගත් මුළු සේවාලාභීන් සංඛ්‍යාව** | | | | **2,219** |

**නාමෝදිෂ්ඨ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා 2021 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් ඇතුළත් වී ඇති රැඳවියන් සංඛ්‍යාව**

| | **නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානය** | **ලිපිනය** | **රැඳවියන් සංඛ්‍යාව** |
|---|---|---|---|
| 01 | පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර | පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර පල්ලෙකැලේ, කුන්ඩසාලේ | 481 |
| 02 | වටරැක බන්ධනාගාරය | වටරැක බන්ධනාගාරය බස්නාහිර පලාත, මීගොඩ | 136 |

| | | | |
|---|---|---|---|
| 03 | තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය තල්දෙන, බදුල්ල | 564 |
| 04 | වීරවිල එළිමහන් සිරකඳවුර | වීරවිල එළිමහන් සිරකඳවුර වීරවිල | 1,065 |
| 05 | අනුරාධපුර බන්ධනාගාරය | අනුරාධපුර බන්ධනාගාරය අනුරාධපුර | 205 |
| 06 | තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය පල්ලන්සේන, දළුපොත, මීගමුව | නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක විය |
| 07 | කන්දෙවත්ත එළිමහන් සිරකඳවුර | කන්දෙවත්ත එළිමහන් සිරකඳවුර කන්දෙවත්ත, මීතිරිගල | 33 |
| 08 | මීතිරිගල එළිමහන් වැඩකඳවුර | මීතිරිගල එළිමහන් වැඩකඳවුර මීතිරිගල | 58 |
| 09 | කලුතර බන්ධනාගාරය | කලුතර බන්ධනාගාරය කලුතර | 320 |
| 10 | පබෝධා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | පබෝධා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අඹේපුස්ස | නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක විය |
| 11 | කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය කන්දකාඩු | 555 |
| **ඇතුළත් වූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව** | | | **3,417** |

**නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශයේ 2020/21 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම**

| වර්ෂය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| 2020 | 53% | 35% |
| 2021 | 56% | 5% |

නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශයේ 2020 වර්ෂයේ භෞතික ප්‍රගතිය 53%ක් සහ 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 56% වශයෙන් ද මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 35%ක් සහ 5%ක් වශයෙන් 2020 සහ 2021 වර්ෂවලදී දැකගත හැකි විය. මෙම වර්ෂ තුළ රට පුරා කොවිඩ් 19 වසංගතය පැතිරයාම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම අනුව යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවලට හා නාමෝද්දිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළට ඇතුළු වීමේදී අපහසුතා ඇතිවීම හා වරින් වර රට වසා දැමීම හේතුවෙන් සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගැටලු ඇති විය.

## 10.5 බාහිරසේවා ඒකකය

බාහිරසේවා ඒකකය "මතින් නිදහස් සුරක්ෂිත රටක්" බිහි කිරීම උදෙසා ජාතික ආයතනික වගකීම හා කාර්යභාරය මැනවින් හඳුනාගනිමින් ජාතික වැඩසටහන් ඔස්සේ සිය සේවාවන් ජනතාව වෙත සමීප කරවීමට විවිධ වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කර ඇත.

**අරමුණ**

**"මත්ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම අවම කරමින් අවදානම් කණ්ඩායම් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම වළක්වා ගැනීම, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් හට භාවිතයෙන් ඉවත්වීමට සහය වීම, ප්‍රතිකාර අවස්ථා සලසාදෙමින් භාවිතා කරන්නන් හා පවුල්වල සාමාජිකයින් වෙත උපදේශන සේවා හා පසු රැකවරණ කටයුතු සිදු කරමින් සේවාලාභින්ට හා පවුල්වල සාමාජිකයන්ට යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම"**

ඒ අනුව තම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා බාහිරසේවා ඒකකය විසින් පහත සඳහන් කාර්යයන් සිදුකරනු ලැබේ.

- මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් හඳුනාගැනීම සහ එම පිරිස් ලයිස්තුගත කිරීම
- නිවසේ සිටම භාවිතයෙන් ඉවත්වීම සඳහා අවශ්‍ය ප්‍රතිකාරාත්මක මැදිහත්වීම් සිදුකිරීම
- ප්‍රතිකාර හා පුනරුත්ථාපන කාර්යයන් සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම
- අවශ්‍යතා සහිත පුද්ගලයින් රජයේ රෝහල්වල පවත්වනු ලබන මානසික වෛද්‍ය සායන සඳහා යොමු කිරීම
- මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ට සහ ඔවුන්ගේ පවුල් සඳහා උපදේශන සේවා සැපයීම
- බන්ධනාගාර ගත වී සිටින මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම
- ප්‍රතිකාරලාභීන්ගේ පසුරැකවරණ කටයුතු සිදුකිරීම
- සේවාලාභීන්ගේ පවුල්, රැකියා, නීතිමය, සෞඛ්‍යමය, සමාජමය ගැටලු සඳහා සහය ලබා දීම
- ප්‍රදේශයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධ කරගනිමින් නිවාරණ වැඩසටහන් සිදුකිරීම
- පුද්ගලයන්, රාජ්‍ය ආයතන, නීතිය ක්‍රියාත්මක කරන ආයතන, ක්‍රීඩා, සමාජ හා විවිධ සංවිධානවල කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා 2021 වර්ෂය තුළ බාහිරසේවා නිලධාරීන් 31 දෙනෙකු කොළඹ, කළුතර, මාතර, ගාල්ල, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, රත්නපුර, පොළොන්නරුව, මහනුවර, නුවරඑළිය, අම්පාර, බදුල්ල, යාපනය, මොණරාගල හා කෑගල්ල දිස්ත්‍රික්ක ආවරණය කරන ලද අතර සේවා අවශ්‍යතාවය මත අනෙකුත් දිස්ත්‍රික්ක ද ආවරණය කර ඇත. එමෙන්ම බාහිරසේවා ඒකකය 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ ඉලක්ක සපුරා ගනිමින් පහත සඳහන් ක්‍රියාකාරකම් තුළින් සේවා අපේක්ෂිත මහජනතාව වෙනුවෙන් සේවා සපයන ලදි.

2021 වර්ෂයේ සිදුකරන ලද වැඩසටහන්

| වැඩසටහන | සේවාලාභීන් සංඛ්‍යාව |
|---|---|
| නව හඳුනාගැනීම් | 3,227 |
| ප්‍රතිකාර සඳහා යොමු කිරීම් | 1,868 |
| මත්ද්‍රව්‍යයෙන් නිදහස්වීම් | 562 |
| පසුරැකවරණ | 2,819 |
| ප්‍රජා ප්‍රතිකාරය සඳහා යොමු කිරීම් | 1,107 |

ප්‍රස්තාර 01




එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමට ඉඩ ඇති පිරිස් ඉන් වළක්වාගැනීමේ අරමුණින් දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය කරමින් බාහිරසේවා නිලධාරීන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

| අනු අංකය | කාර්යයන් හෝ ක්‍රියාකාරකම් | වැඩසටහන් ගණන | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 1 | ප්‍රජා මූලික ප්‍රතිකාර කඳවුරු | 1 | 15 |
| 2 | බාහිරසේවා නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් | 1 | 30 |
| 3 | රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 70 | 4,039 |
| 4 | ගුරුවරුන් සහ කලාප කාර්යාල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 18 | 724 |

| | | | |
|---|---|---|---|
| 5 | නීතිය බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම | 13 | 448 |
| 6 | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීම | 4 | 108 |
| 7 | ඇඟලුම් ක්ෂේත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීම | 2 | 236 |
| 8 | කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීම | 3 | 90 |
| 9 | කාර්මික ක්ෂේත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීම | 2 | 125 |
| 10 | සේවා අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම | 10 | 324 |
| 11 | කම්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 22 | 1,460 |
| 12 | පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 42 | 4,223 |
| 13 | දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 16 | 814 |
| 14 | රියදුරන් සහ සහයකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් | 23 | 2,253 |
| 15 | මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රජා වැඩසටහන් | 139 | 27,458 |
| 16 | විශේෂ දිනයන්ට සමගාමීව ප්‍රජාව මුල් කර ගනිමින් සිදු කරනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් (ළමා දිනය/ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනය) | 14 | 453 |
| 17 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 11 | 495 |

**විශේෂ වැඩසටහන්**

| **ව්‍යාපෘතිය** | **වැඩසටහන් සංඛ්‍යාව** | **සහභාගි වූ ගණන** |
|---|---|---|
| දිවයින පුරා මත්ද්‍රව්‍ය නිවාරණ සහායකයින් පුහුණු කිරීමේ වැඩසටහන (NAITA) | 23 | 2,700 |
| කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 1 | 50 |

- තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සමග එක්ව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා ඒකකයේ නිලධාරීන් විසින් තරුණ හා ක්‍රීඩා සංවර්ධනය වෙනුවෙන් කැපවුන කාර්යාල සහ පුහුණු මධ්‍යස්ථාන මතින් තොර පරිශ්‍ර බවට පත් කිරීමට අදාළ යෝජනාවලිය සකස් කර නිර්ණායක ඉදිරිපත් කිරීම.
- නිවාරණ පණිවුඩ සකස් කිරීම.

- ප්‍රතිකාරයෙන් පසු වෘත්තිය පුහුණු ලබා ගත හැකි වෘත්තිය පුහුණු ආයතන පිළිබඳ තොරතුරු ජාලයක් නිර්මාණය කිරීම.
- ප්‍රතිකාර පැවරුම් පොත නිර්මාණය කිරීම.
- සඟරාව නිර්මාණය කිරීම.
- Zoom තාක්ෂණය සහ සමාජ මාධ්‍යය ඔස්සේ නිලධාරීන් වෙනුවෙන් නිවාරණ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් සිදුකිරීම.
    - ඉලක්ක කණ්ඩායම - පාසල් ගුරුවරුන්, විදුහල්පතිවරුන්, සිසුන්, සංවර්ධන නිලධාරීන් සහ මත්ද්‍රව්‍ය නිවාරණ සහයකයින්

| දිස්ත්‍රික්කය | සිදු කරන ලද වැඩසටහන් ගණන |
|---|---|
| කොළඹ | 03 |
| රත්නපුර | 10 |
| කුරුණෑගල | 02 |
| ගම්පහ | 04 |
| කලුතර | 07 |
| අනුරාධපුර | 04 |
| මඩකලපුව | 02 |









- **Zoom තාක්ෂණය ඔස්සේ ළමා හා වැඩිහිටි දිනය මුල් කර ගෙන සිදු කරන ලද වැඩසටහන්**

| අංකය | දිස්ත්‍රික්කය | ඉලක්ක ගත පිරිස | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ගම්පහ | සිසු සිසුවියන් - කටාන මහා විද්‍යාලය | 32 |
| | | සිසු සිසුවියන් - දිවුලපිටිය මහා විද්‍යාලය | 32 |
| | | සිසු දරුවන් - යුනිවර්සල් ජාත්‍යන්තර පාසල | 49 |

| | | | |
|---|---|---|---|
| | | 8 ශ්‍රේණියෙන් ඉහල සිසු සිසුවියන් - දොම්පේ අධ්‍යාපන කොට්ඨාසය | 100 |
| | | දහම් පාසල් ළමුන්/ දෙමාපියන් - කැලණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 30 |
| | | දෙමාපියන් හා දරුවන් - මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 25 |
| 2 | කළුතර | කණිෂ්ඨ අංශයේ දරුවන් - කළුතර ශ්‍රී නාරද දහම් පාසල | 30 |
| | | ජ්‍යෙෂ්ඨ අංශයේ දරුවන් - කළුතර ශ්‍රී නාරද දහම් පාසල | 62 |
| 3 | කොළඹ | දරු දැරියන් - කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය | 42 |
| | | යෞවන සමාජ දරු දැරියන් - හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 36 |
| | | 9,10 හා 11 සිසුන් - පිළියන්දල ආනන්ද සමරකෝන් විද්‍යාලය | 28 |
| 4 | බදුල්ල | දහම් පාසල් හා ළමා සමාජ දරුවන් හා දෙමාපියන් - බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 53 |
| 5 | ගාල්ල | දරුවන් හා දෙමාපියන් - ශාසනාරක්ෂක බල ප්‍රදේශය | 37 |
| 6 | අනුරාධපුරය | පාසල් දරුවන් - තඹුත්තේගම මහා විද්‍යාලය | 25 |





**1) බස්නාහිර පළාත තුළ ළමා දිනයට සමගාමීව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව**

බස්නාහිර පළාත් ලේකම් කාර්යාලයේ නිලධාරීන්, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික් අධ්‍යාපන කළාපයේ නිලධාරීන් 95 දෙනෙකු දැනුවත් කරන ලදි.




- **Zoom තාක්ෂණය ඔස්සේ සිදුකරන ලද සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ තෙදින වැඩමුළු**

| අංකය | වැඩසටහන් සිදු කරන දිස්ත්‍රික්කය | ඉලක්කගත පිරිස | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කුරුණෑගල | අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරී | 53 |
| 2 | අනුරාධපුර | අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරී | 13 |
| 3 | මඩකලපුව | අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරී | 32 |







- **Zoom තාක්ෂණය ඔස්සේ සිදුකරන ලද සෙසු වැඩසටහන්**

| අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් තේමාව | ඉලක්කගත පිරිස | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | රත්නපුර | "මතින් තොර දැයක් උදෙසා අපේ යුතුකම් ඉටු කරමු" (මත්ද්‍රව්‍ය නිවාරණය හා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම හඳුනාගැනීම) | ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තරුණ ප්‍රජාව | 61 |
| | | දරුවන් විද්‍යුත් මාධ්‍ය වෙත යොමු වීම හා මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනයට මාධ්‍ය යොදා ගැනීම | ර/බටුගෙදර විජයාරාම විද්‍යාලයේ 8 හා 9 ශ්‍රේණියන්හි සිසුන්/ ගුරුවරුන් හා දෙමාපියන් | 88 |
| | | මත්ද්‍රව්‍ය ඇබ්බැහිය හා නව යෞවනය | පාසල් සිසුන් | 83 |
| | | තරුණ පරපුර හා මත්ද්‍රව්‍ය භාවිතය | කුරුවිට ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ තරුණ ප්‍රජාව | 56 |

| | | | | |
|---|---|---|---|---|
| | | විභාග ඉලක්ක හා දරුවන්ගේ අනාගතය | හිදැල්ලන ආනන්ද විද්‍යාලයේ 10 හා 11 ශ්‍රේණිවල සිසුන් | 75 |
| | | තාරුණ්‍යය හා මත්ද්‍රව්‍ය සම්බන්ධ ගැටලු | ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ තරුණ ප්‍රජාව | 40 |
| | | මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ සමාජීය දැනුවත්භාවය | ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය 10, 11, 12, 13 සිසුන් | 40 |
| | | තාරුණ්‍යය මත්ද්‍රව්‍ය ඇබ්බැහිය හා ඒ ආශ්‍රිත ගැටලු | කුරුවිට ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ තරුණ ප්‍රජාව | 45 |
| | | "මතින් නිදහස් තාරුණ්‍යයක් සෞභාග්‍යමත් අනාගතයක්" සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | "නිදහස" පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයේ තරුණයින් සඳහා | 90 |
| | | මත්ද්‍රව්‍ය නිවාරණය | "මිතුරු මිතුරෝ" පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයේ නිලධාරීන් | 65 |
| 2 | ගම්පහ | මත්ද්‍රව්‍ය ඇබ්බැහිය හා පුනරුත්ථාපනය | ගම්පහ දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය නිවාරණ කණ්ඩායම සඳහා | 51 |
| | | "මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රජා ප්‍රතිකාර ක්‍රමය යොදා ගන්නේ කෙසේද?" දැනුවත් කිරීමේ වැඩසටහන | ගම්පහ දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය නිවාරණ කණ්ඩායම සඳහා | 24 |
| | | මත්ද්‍රව්‍ය විරෝධී දිනයට සමගාමීව පවත්වන ලද මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන | දොම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා | 41 |
| | | අභිප්‍රේරණාත්මක අධ්‍යාපන වැඩසටහන | "නිසංසල" පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සේවාලාභීන් සඳහා | සේවාලාභීන් 42 |

| | | | | |
|---|---|---|---|---|
| 3 | කලුතර | අඛණ්ඩ රැකවරණ තුලින් සොඳුරු පවුලක් | ප්‍රජා නායකයින්, සංවර්ධන නිලධාරීන් හා මත්ද්‍රව්‍ය නිවාරණ සහායකයින් | 43 |
| | | මතින් නිදහස් වීම සඳහා ප්‍රජා පාදක ප්‍රතිකාරය | අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරීන් | නිලධාරීන් 26 |
| | | තාරුණ්‍යය නිවැරදි මාවතක කුසලතා සංවර්ධනය | තරුණ ප්‍රජාව ඉලක්කගතව | තරුණයන් 67 |
| | | සෞඛ්‍යමත් දිවියක රහස | බේරුවල සෞඛ්‍ය නිලධාරීන් ඉලක්කගතව | නිලධාරීන් 54 |
| | | සාර්ථක ජීවිතයකට චිත්තවේග කළමනාකරණය කරමු | වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරීන් | නිලධාරීන් 36 |
| | | සාර්ථක ජීවිතයකට ආතතිය කළමනාකරණය කරමු | සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නිලධාරීන් | සාමාජිකයි න් 78 |
| | | සාර්ථක ජීවිතයකට ආතතිය කළමනාකරණය කරමු | මදුරාවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අභ්‍යාසලාභී උපාධිධාරීන් සඳහා | නිලධාරීන් 27 |
| | | "මතින් තොර දැයක්" උදෙසා රාජ්‍ය සේවකයන් සතු වගකීම | බුලත්සිංහල ප්‍රාදේශිය ලේකම් කාර්යාල නිලධාරීන් | නිලධාරීන් 25 |
| | | දරුවන්ගේ වෙනස්වීම් හඳුනා ගනිමු | දෙමාපියන් සඳහා | දෙමාපියන් 82 |
| | | "මතින් තොර දැයක්" සඳහා තරුණ ප්‍රජාවගේ වගකීම් | බුලත්සිංහල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ යෞවන ප්‍රජාව | තරුණ ප්‍රජාව 58 |
| | | සෞඛ්‍යමත් ජීවිතයක් මතින් තොර හෙටක් | අවිත්තාව නාලන්ද විද්‍යාලයේ දරුවන් සහ දෙමාපියන් | දරුවන් හා දෙමාපියන් 43 |
| 4 | අනුරාධපුරය | ප්‍රජා ප්‍රතිකාරය හා ඒ සඳහා ප්‍රජාවේ දායකත්වය කෙසේ විය යුතුද | ප්‍රජා නායකයින්, සංවර්ධන නිලධාරීන් හා මත්ද්‍රව්‍ය නිවාරණ සහායකයින් | නිලධාරීන් 100 |

| | | | | |
|---|---|---|---|---|
| | | මත්ද්‍රව්‍ය භාවිත පුද්ගලයින් හඳුනාගැනීම හා උපදේශනය සඳහා යොමු කිරීම | ප්‍රජා නායකයින්, සංවර්ධන නිලධාරීන් හා මත්ද්‍රව්‍ය නිවාරණ සහායකයින් | නිලධාරීන් 100 |
| | | ධනාත්මක පවුල් පරිසරයක් සඳහා ගුණාත්මක මා පිය යුවලක් | අලුත විවාහ වූ දරුවන් අපේක්ෂිත තරුණ යුවල් | තරුණ යුවල් 46 |
| | | දරුවන් අපගාමී චර්යාවන්ට යොමුවීමෙන් වළක්වා ගැනීම සඳහා යහපත් මවක පියෙකු වශයෙන් ඔබගේ කාර්යභාරය කුමක්ද | උතුරු පළාත් රාජ්‍ය නිලධාරීන් හා අනුරාධපුරය දෙමාපියන් සඳහා | දෙමාපියන් හා රාජ්‍ය නිලධාරීන් 320 |
| | | සංගීතමය චිකිත්සක වැඩසටහන | ප්‍රජා නායකයින්, සංවර්ධන නිලධාරීන් හා මත්ද්‍රව්‍ය නිවාරණ සහායකයින් | නිලධාරීන් 100 |
| 5 | කොළඹ | මත්ද්‍රව්‍ය නිවාරණය හා තාරුණ්‍යයේ වගකීම | මත්ද්‍රව්‍ය නිවාරණ සහයකයින් | නිලධාරීන් 24 |
| 6 | කොළඹ - මහරගම | මත්ද්‍රව්‍ය භාවිතය සහ තාරුණ්‍යය | ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තරුණ පිරිස | තරුණ ප්‍රජාව 57 |
| | | අභියෝගාත්මක තාරුණ්‍යය ජය ගැනීම | ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තරුණ පිරිස | තරුණයන් 67 |
| 7 | කොළඹ - කැස්බෑව | මතින් නිදහස් පරපුරක් උදෙසා පාසල් මත් නිවාරණ වැඩසටහන | කහපොල ශ්‍රී පඤ්ඤාලෝක විද්‍යාලයේ 10 සහ 11 වසර සිසුන් | දරුවන් 61 |
| 8 | කොළඹ - කොළොන්නාව | පෙර පාසල් ගුරුවරුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | පෙර පාසල් ගුරුවරු | නිලධාරීන් 24 |
| | | මත්ද්‍රව්‍ය භාවිතය හා ජංගම දුරකතන අනිසි භාවිතයේ ප්‍රතිවිපාක | රත්මලාන ශ්‍රී පියරත්නාරාම දහම් පාසලේ 9 හා 10 ශ්‍රේණි සිසුන් | දරුවන් 46 |

| | | | | |
|---|---|---|---|---|
| 9 | කොළඹ - මොරටුව | කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ මත්ද්‍රව්‍ය නිවාරණ සහයකයෙකුගේ කාර්යභාරය | මොරටුව, රත්මලාන, දෙහිවල හා මහරගම මත්ද්‍රව්‍ය නිවාරණ සහයකයන් | නිලධාරීන් 32 |
| | | මත්ද්‍රව්‍යට ඇබ්බැහිවීමෙන් දරුවන් ගලවා ගන්නේ කෙසේද | මොරටුව බල ප්‍රදේශය තුළ දහම් පාසල් ගුරුවරු | නිලධාරීන් 81 |
| | | මත්ද්‍රව්‍ය භාවිතය හා නව යොවුන් විය | මොරටුව, රත්මලාන, දෙහිවල තරුණ ප්‍රජාව | ප්‍රජාව 50 |
| 10 | කොළඹ - සීතාවක | මත්ද්‍රව්‍ය නිවාරණය හා ප්‍රතිකාරය පිළිබඳ | ප්‍රජා නායකයින්, සංවර්ධන නිලධාරීන් හා මත්ද්‍රව්‍ය නිවාරණ සහායකයින් | නිලධාරීන් 65 |
| 11 | කොළඹ - පාදුක්ක | පාසල් ළමුන් දැනුවත් කිරීම | පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පාසල් දරුවන් | දරුවන් 10 |
| | | සංවර්ධන නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම | පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සංවර්ධන නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම | නිලධාරීන් 46 |
| 12 | මහනුවර | මත්ද්‍රව්‍ය අවධානමෙන් ආරක්ෂා වීම | ළමුන් හා තරුණයන් | ප්‍රජාව 76 |






**ප්‍රජා පාදක වැඩසටහන්**

- **1927 දුරකතන අංකය දිවයින පුරා ප්‍රචලිත කිරීම සඳහා සිදුකරන ලද ප්‍රජා පාදක වැඩසටහන්** දිවයිනේ සියලු ප්‍රජාව ආවරණය වන පරිදි මණ්ඩලයේ බාහිරසේවා නිලධාරීන්ගේ මූලිකත්වයෙන් අභ්‍යාසලාභී උපාධිධාරීන් හා මත්ද්‍රව්‍ය නිවාරණ සහයකයින් විසින් මත්ද්‍රව්‍ය භාවිතයේ ඇති අනිසි

ප්‍රතිඵල පිළිබඳව හා මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීම සඳහා මණ්ඩලය තුළ පවතින ක්ෂණික දුරකතන අංකය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරන ලදී.








- **රෝහල් ආශ්‍රිත මානසික සෞඛ්‍ය සායන මුල් කර ගනිමින් උපදේශන සේවා සිදු කිරීම**

දිවයිනේ සෑම ප්‍රදේශයකම රෝහල් මනෝ වෛද්‍ය සායන පදනම් කරගනිමින් උපදේශන සේවා ආරම්භ විය. පසුගිය කොවිඩ් - 19 වසංගත කාල සීමාව තුළ දී මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත පුද්ගලයින්ට ඇති වූ විරමණ ලක්ෂණවලට ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් රෝහල් මානසික සෞඛ්‍ය වෛද්‍ය සායන සඳහා පැමිණි පුද්ගලයින් වෙත උපදේශන සේවාවන්, ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට යොමු කිරීම මෙන්ම අඛණ්ඩ පසුරැකවරණ කටයුතු අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා නිලධාරීන් හා උපදේශන නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සිදු විය.






- **බස්නාහිර පළාත් "යාත්‍රාව" වැඩසටහන සඳහා සම්බන්ධ වීම**

බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් මූලස්ථානයේ මූලිකත්වයෙන් බස්නාහිර පළාත තුළ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් හඳුනාගෙන ඔවුන් උපදේශනය/ වෛද්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේ විශේෂ වැඩසටහන වන "යාත්‍රාව" වැඩසටහන සඳහා කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්කයන් හි බාහිරසේවා නිලධාරීන් සම්බන්ධ විය.





**2021 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා 1927 ක්ෂණික දුරකතන ඒකකයට ලද තොරතුරු සහ යොමු කිරීම්**

| මාසය | අදාළ දුරකථන ඇමතුම් සංඛ්‍යාව | යොමු කිරීම් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | බාහිරසේවා නිලධාරීන් | NDDCB මධ්‍යස්ථාන සඳහා | මානසික රෝගී සායන | පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන | තොරතුරු දැනගැනීම සඳහා | දුරකතන උපදේශනය සඳහා | ප්‍රධාන කාර්යාලයේ උපදේශන සේවා සඳහා | 1948 සහ NATA සඳහා | පසුරැකවරණ සේවා | වෙනත් ඇමතුම් |
| ජනවාරි | 195 | 46 | 16 | 04 | - | - | 01 | - | 02 | 104 | 22 |
| පෙබරවාරි | 251 | 43 | 36 | 05 | - | - | 04 | - | 06 | 136 | 21 |
| මාර්තු | 303 | 50 | 24 | 20 | 06 | 04 | 03 | 02 | 02 | 161 | 31 |
| අප්‍රේල් | 301 | 151 | 59 | 22 | 03 | 06 | 06 | 02 | 03 | 13 | 36 |
| මැයි | 253 | 133 | 17 | 02 | 04 | 02 | 12 | - | 03 | 21 | 59 |
| ජූනි | 473 | 247 | 30 | 09 | - | 13 | 06 | - | 10 | 61 | 97 |
| ජූලි | 209 | 84 | 87 | 11 | - | 13 | 3 | - | 5 | - | 724 |
| අගෝස්තු | 626 | 380 | 110 | 51 | 23 | 14 | 32 | - | 16 | - | 1035 |
| සැප්තැම්බර් | 630 | 246 | 60 | 5 | 7 | 23 | 9 | - | 7 | 273 | 711 |
| ඔක්තෝබර් | 171 | 117 | 28 | 5 | 2 | - | - | - | 19 | - | 880 |
| නොවැම්බර් | 51 | 23 | 26 | 1 | 1 | - | - | - | - | - | 799 |
| දෙසැම්බර් | 260 | 83 | 47 | 03 | 05 | 74 | - | - | 27 | - | 21 |

**බාහිරසේවා ඒකකයේ 2020/21 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම**

| වර්ෂය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| 2020 | 32.58% | 88.75% |
| 2021 | 40% | 38% |

2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී බාහිරසේවා අංශය විසින් ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් වැඩි ප්‍රමාණයක් සිදු කිරීමට හැකි වූ අතර රටතුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත දෙවන, තෙවන සහ සිව්වන කාර්තු වල දී වැඩසටහන් සිදු කිරිම අවම මට්ටමක පැවතුනි. 2021 වර්ෂයේ ද කොවිඩ් වසංගත තත්ත්වයේ බලපෑම මත ක්‍රියාකාරී සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක කිරිමට නොහැකි වූ බැවින් බාහිරසේවා අංශයේ ප්‍රගතියේ සුළු පසුබෑමක් දක්නට ලැබේ. මෙම වර්ෂයේ බහුතරයක් වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කළ බැවින් මූල්‍ය තත්ත්වයේ අඩුවීමක් දක්නට ලැබේ.

## 10.6 ජාතික මාදක රසායනාගාරය

මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් සියලුම විද්‍යාත්මක ක්‍රියාවන් ආවරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සහ අංග සම්පූර්ණ විද්‍යාත්මක ඒකකයක් ලෙස ජාතික මාදක රසායනාගාරය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ස්ථාපිත කර ඇත. මෙම අංශය ඖෂධ සැපයුම් පාලනය සහ ඉල්ලුම අවම කිරීම සඳහා රසායනාගාර විශ්ලේෂණය, විද්‍යාත්මක පර්යේෂණ, විද්‍යාත්මක පුහුණුව, තාක්ෂණික සහය සැපයීම, විද්‍යාත්මක නිර්දේශ සහ උපදේශන සේවා සිදු කිරීමෙහි නිරත වේ.

ජාතික මාදක රසායනාගාරය විසින් සිදුකරනු ලබන විශ්ලේෂණාත්මක කාර්යයන් සමන්විත වන්නේ විමර්ශන, බුද්ධිමය, අධිකරණමය අරමුණු සහ කටයුතු සඳහා, නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් ඉදිරිපත් කරන ලද සැක සහිත ඖෂධ සාම්පල සඳහා (මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය) විශ්ලේෂණය කිරීම, මධ්‍යසාර, පාලිත ඖෂධ, පාලිත රසායනික ද්‍රව්‍ය (පුරෝගාමී), ක්‍රීඩා ආශ්‍රිත පෝෂණ අතිරේක සාම්පල ද නියාමන අරමුණු සඳහා විශ්ලේෂණය කෙරේ. තව ද, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් හඳුනාගැනීම සඳහා රෝහල්, අධිකරණ, ප්‍රතිකාර මධ්‍යස්ථාන, රජයේ සහ පෞද්ගලික අංශයේ සේවා ස්ථාන මඟින් ඉදිරිපත් කරන ජීව විද්‍යාත්මක නිදර්ශක විශ්ලේෂණය කිරීම සිදු කෙරේ.

එමෙන්ම ජාතික මාදක රසායනාගාරය විසින් මත්ද්‍රව්‍ය සැපයුම පාලනය, ඉල්ලුම අවම කිරීම සහ මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින් විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණු මත පදනම්ව සිය දෛනික සහ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබයි.

### 10.6.1 නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ජාවාරම් කිරීම, විකිණීම සහ භාවිතයට එරෙහිව ඵලදායී ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් ආයතන/ අධිකාරී වෙත විද්‍යාත්මක සහය ලබා දීම.

#### 10.6.1.1 විමර්ශන, මෙහෙයුම්, බුද්ධිමය සහ අධිකරණ කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින සැක සහිත ඖෂධ හඳුනාගැනීම සහ විශ්ලේෂණය

2021 වර්ෂයේ දී නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් කරන ලද ඉල්ලීම් අනුව, ජාතික මාදක රසායනාගාරය මඟින් අවස්ථා 60ක දී මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල 85ක් සඳහා විශ්ලේෂණයන් සිදුකොට ඇත. ඉහත විශ්ලේෂණ ප්‍රතිඵල ජාතික හා අනෙකුත් වගකිව යුතු ආයතන සමඟ බෙදා ගනිමින් මත්ද්‍රව්‍ය ගැටලුව පිළිබඳ විවිධ මෙහෙයුම්, නව ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණ කිරීම, උපක්‍රමික විශ්ලේෂණ කිරීම, නීති ප්‍රතිපත්ති විශ්ලේෂණය හා සැකසුම් අවශ්‍යතා, නෛතික සහ සෞඛ්‍ය ගැටළු අවම කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කර ඇත. මෙම අනාවරණ මඟින් රටේ නීති බලගැන්වීම, අපරාධ නිවාරණය හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකසීම් සඳහා සුවිශේෂී බලපෑමක් ඇති කරනු ලබයි.

තව ද, මහේස්ත්‍රාත් අධිකරණ නියෝගයන්ට අදාලව නිකුත් කරන ලද විශ්ලේෂණ වාර්තා, නඩු පැවරීම සම්බන්ධයෙන් ගත යුතු නෛතික ක්‍රියාමාර්ග සඳහා යොදා ගැනේ.

විෂ අබිං සහ අන්තරායදායක ඖෂධ පාලන පනත හා 2008 අංක 01 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් ජාතික මාදක රසායනාගාරය වෙත යොමුකරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල පිළිබඳ සිදුකරන ලද පර්යේෂණාත්මක විශ්ලේෂණ පහත පරිදි වේ.

වගු අංක 01 - 2021 වසර තුළදී විශ්ලේෂණය කරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල සංඛ්‍යා

| ආයතනය | | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නවදිගන්තය ප්‍රතිකාර මධ්‍යස්ථානය | අවස්ථා | 01 | - | - | - | - | - | - | - | - | - | - | - |
| | සාම්පල සංඛ්‍යාව | 01 | - | - | - | - | - | - | - | - | - | - | - |
| විශේෂ විමර්ශන අංශය, යුධ හමුදා පොලීසිය | අවස්ථා | 01 | - | 01 | 02 | - | 04 | 01 | - | - | 03 | 02 | 02 |
| | සාම්පල සංඛ්‍යාව | 01 | - | 01 | 03 | - | 04 | 01 | - | - | 05 | 04 | 03 |
| පාරිභෝගික සේවා අධිකාරිය | අවස්ථා | - | 02 | - | - | - | - | - | - | - | - | - | - |
| | සාම්පල සංඛ්‍යාව | - | 02 | - | - | - | - | - | - | - | - | - | - |
| මහේස්ත්‍රාත් අධිකරණ | අවස්ථා | - | 02 | 03 | - | 01 | 03 | - | 04 | - | 04 | 02 | 04 |
| | සාම්පල සංඛ්‍යාව | - | 02 | 07 | - | 01 | 05 | - | 07 | - | 04 | 03 | 06 |
| ශ්‍රී ලංකා රේගුව | අවස්ථා | 01 | - | 03 | 01 | 01 | - | 01 | - | - | - | - | - |
| | සාම්පල සංඛ්‍යාව | 04 | - | 04 | 01 | 01 | - | 03 | - | - | - | - | - |
| පුද්ගලික | අවස්ථා | - | 01 | 02 | 01 | - | 01 | 01 | - | - | - | 02 | - |
| | සාම්පල සංඛ්‍යාව | - | 01 | 03 | 01 | - | 01 | 01 | - | - | - | 02 | - |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | අවස්ථා | - | - | - | - | - | - | - | - | 01 | - | 01 | - |
| | සාම්පල සංඛ්‍යාව | - | - | - | - | - | - | - | - | 01 | - | 02 | - |
| **එකතුව** | **අවස්ථා** | **03** | **05** | **09** | **04** | **02** | **08** | **03** | **04** | **01** | **07** | **07** | **06** |
| | **සාම්පල සංඛ්‍යාව** | **06** | **05** | **15** | **05** | **02** | **10** | **05** | **07** | **01** | **09** | **11** | **09** |

**මුළු අවස්ථා සංඛ්‍යාව : 60**

**මුළු සාම්පල සංඛ්‍යාව : 85**

#### 10.6.1.2 වීදි හෙරොයින් පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය

භාවිත කරන්නා හා වෙළඳපොල අතර සම්බන්ධය අධීක්ෂණය සඳහා ඉතාමත් හොඳ දර්ශකයක් ලෙස වීදි හෙරොයින් සාම්පලවල මිල සහ පිරිසිදුභාවය අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීම තුළින් සුලභතාවයෙහි ඇතිවන්නා වූ වෙනස්කම් ඉතා පහසුවෙන් වටහාගත හැකිය. මීට අමතරව මිල සහ පිරිසිදුභාවය අතර ඇති සම්බන්ධතාවය ඇගයීම තුළින් මත්ද්‍රව්‍ය සැපයුමේ විධි ක්‍රම හඳුනාගැනීම සහ එමඟින් සැළසුම් සහගත ඉලක්ක භාවිතා කර ගනිමින් හෙරොයින් ජාවාරම් කිරීම, ප්‍රවාහනය කිරීම හා අත්අඩංගුවට පත්වන භාවිත කරන්නන් සඳහා වඩාත් හොඳින් නීතිය ක්‍රියාත්මක කළ හැක. මෙම පර්යේෂණ අධ්‍යයන ප්‍රතිපත්ති සැකසුම්වල දී සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ කාර්‍යයභාරයේ දී වැදගත් වන අතර අත්අඩංගුවට පත්වන මහා පරිමාණ මත්ද්‍රව්‍ය තොග, හෙරොයින් සාම්පලවල උක්ත සබඳතාවය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි ද යන්න අනාවරණය කරගත හැකිය.

කොවිඩ් - 19 වසංගතයේ අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මඟින් මත්ද්‍රව්‍ය සාම්පල ලබා දී නොමැති අතර බස්නාහිර පළාතේ වීදි හෙරොයින් භාවිත කරන වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ජනවාරි මාසය සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවෙන් වීදි සාම්පල ලබා දීමෙන් පර්යේෂණ අඛණ්ඩව සිදුකරන ලදි.

මීට අමතරව පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදුකරනු ලැබේ.

- වීදිවල දක්නට ලැබෙන හෙරොයින්වල මිල සහ පිරිසිදුභාවය අනාවරණය කර එහි ඇති සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ
- හෙරොයින් සාම්පලවල මූලාරම්භය හා විකාශනය හඳුනාගැනීම
- වීදි හෙරොයින් සාම්පලවල ඇති නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන විශ්ලේෂණයන්

බස්නාහිර පළාතේ විවිධ ප්‍රදේශවලින් 2021 වර්ෂය සඳහා ලැබුණු "වීදි" සාම්පල දොළහක් (12) පවතින තනුකකරණ ද්‍රව්‍ය/ එකතු කරන වෙනත් ද්‍රව්‍ය සහ ඒවායේ ඩයිඇසිටයිල් මොර්ෆීන් (DAM) අන්තර්ගතය සම්බන්ධයෙන් විශ්ලේෂණය කරන ලදි.

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ කොළඹ නගරයේ විවිධ නගරවල වීදි මට්ටමින් අලෙවි කරන හෙරොයින්වල මිලට සාපේක්ෂව සංශුද්ධතාවයේ දත්ත පහත දක්වා ඇත.

මෙහි දී ඉහළම සංශුද්ධතාවය වන 68.96% කොටහේන ප්‍රදේශයෙන් වාර්තා වී ඇති අතර 0% සංශුද්ධතාවයෙන් යුත් සාම්පල කිසිවක් අනාවරණය නොවීය. කෙසේ වෙතත්, සාම්පල කිහිපයක් ඖෂධ ද්‍රව්‍ය සමඟ මිශ්‍ර කර ඇති බව අධ්‍යයනයේ දී වාර්තා විය.

වගු අංක 02 – වීදි හෙරොයින් සාම්පලවල පිරිසිදුතාවය (ඩයිඇසිටයිල් මොර්ෆීන් ප්‍රතිශතය)

| ප්‍රදේශය | ඩයිඇසිටයිල් මොර්ෆීන් ප්‍රතිශතය/ පිරිසිදුතාවය | ඩයිඇසිටයිල් මොර්ෆීන් මිලිග්‍රෑමයක් සඳහා වන මිල (රු.) |
|---|---|---|
| කොළඹ (*බඩෝවිට*) | 61.50 | 38.34 |
| කොළඹ (*මට්ටක්කුලිය*) | 62.80 | 38.83 |
| කොළඹ (*තොටලඟ*) | 67.78 | 9.61 |
| කොළඹ (*කොටහේන*) | 68.96 | 26.81 |
| කොළඹ (*මාලිගාවත්ත*) | 65.24 | 46.73 |
| කොළඹ (*වනාතමුල්ල*) | 36.23 | 33.62 |
| කොළඹ (*ග්‍රෑන්ඩ්පාස්*) | 56.25 | 27.27 |
| කොළඹ (*දෙහිවල*) | 67.52 | 48.56 |
| කොළඹ (*කොහුවල*) | 61.37 | 11.07 |
| කොළඹ (*කැස්බෑව*) | 29.72 | 14.50 |
| කොළඹ (*මොරටුව*) | 22.11 | 38.14 |
| කොළඹ (*රත්මලාන*) | 62.76 | 48.43 |

අදාල සාම්පලවල පිරිසිදු හෙරොයින් මිලිග්‍රෑම් එකක මිල රු.9.61 සිට රු.48.56 ක් වූ අතර පිරිසිදු හෙරොයින් මිලිග්‍රෑම් එකක ඉහළම මිල දෙහිවල ප්‍රදේශයෙන් නිරීක්ෂණය විය. වගුව 2 මඟින් විවිධ ප්‍රදේශවලින් ලබාගත් පිරිසිදු හෙරොයින් මිලිග්‍රෑම් එකක මිල සඳහා වන අගයන් පිළිබිඹු කර ඇත.

**වීදි හෙරොයින් සාම්පලවල ඇති ඇල්කලොයිඩ අපද්‍රව්‍ය, තනුකකරණ ද්‍රව්‍ය/ එකතු කරන වෙනත් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන විශ්ලේෂණයන්**

වීදි හෙරොයින් සාම්පල විශ්ලේෂණ රාමුව තුළ දී මත්ද්‍රව්‍යයේ ප්‍රමිතිය, එමෙන්ම ඒ අනුව ආරම්භක ප්‍රදේශ හා සාම්පල් එකිනෙක අතර ඇති සම්බන්ධතාවය අනාවරණය වේ.

ඉතා සුළු ප්‍රමාණවලින් අඩංගු ප්‍රධාන ඇල්කලොයිඩ හා අපිරිසිදු ද්‍රව්‍ය ගෑස්ක්‍රොමටග්‍රැපි මැස් ස්පෙක්ට්‍රස්කොපි (Gas Chromatography Mass Spectroscopy) තාක්ෂණය යටතේ හඳුනාගෙන ඇති අතර ඒවා වගු අංක 04 හා 05 මඟින් පෙන්වා දී ඇත.

වගු අංක 03 – වීදි හෙරොයින් සාම්පලවල ඇති ඇල්කලොයිඩ ඝනයේ අපිරිසිදු ද්‍රව්‍යයන්

| ප්‍රදේශය | ඇල්කලොයිඩ ඝනයේ අපිරිසිදු ද්‍රව්‍යයන් | හඳුනාගත් එකතු කළ ද්‍රව්‍ය හා තනුකාරක |
|---|---|---|
| කොළඹ (*බඩෝවිට*) | MEC, HC, 6-AC, 6-MAM, MOR, PAP, NOS | CAF |
| කොළඹ (*මට්ටක්කුලිය*) | MEC, HC, 6-AC, 6-MAM, MOR,COD, PAP, NOS | CAF |
| කොළඹ (*තොටලඟ*) | MEC, HC, 6-AC, 6-MAM, MOR, COD, PAP | CAF |
| කොළඹ (*කොටහේන*) | MEC, HC, 6-AC, 6-MAM, PAP | CAF |
| කොළඹ (*මාලිගාවත්ත*) | MEC, HC, 6-AC, 6-MAM, COD | CAF |
| කොළඹ (*වනාතමුල්ල*) | MEC, 6-AC, 6-MAM | CAF |
| කොළඹ (*ග්‍රෑන්ඩ්පාස්*) | MEC, HC, 6-AC, 6-MAM, COD | CAF, ACT |
| කොළඹ (*දෙහිවල*) | MEC, HC, 6-AC, 6-MAM | CAF |
| කොළඹ (*කොහුවල*) | MEC, HC, 6-AC, 6-MAM, MOR, COD, PAP | CAF, PHT |
| කොළඹ (*කැස්බෑව*) | MEC, HC, 6-AC, 6-MAM, COD | CAF |
| කොළඹ (*මොරටුව*) | MEC, HC, 6-AC, 6-MAM, COD | CAF,ACT |
| කොළඹ (*රත්මලාන*) | MEC, HC, 6-AC, 6-MAM, COD | CAF |
| ***MOR** -Morphine ; **6-AC**– Acetylcodeine ; 6-**MAM** – 6-Monoacetylmorphine; **NOS** – Noscapine, **COD** – Codeine, **PAP**-Papaverine, **HC** -Hydrocotamine; **MEC**-Meconin **ACT** – Acetaminophen; **CAF**-Caffeine ; **PHT** – Phentoyin* | | |

### 10.6.1.3 ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලවල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම

ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල 05ක්, ශ්‍රී ලංකා රේගුව මඟින් ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා ආයතනයට යොමු කරන ලද අතර ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව රසායනික ප්‍රතිකාරක නැවත සකසා දෙන ලද අතර ඒවා පහත සඳහන් පරිදි වේ.

වගු අංක 04 - 2021 වසර තුළ නැවත සකස් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලවල දත්ත

| ආයතනය | පරීක්ෂණ කට්ටල වර්ගය | පරීක්ෂණ කට්ටල සංඛ්‍යාව |
|---|---|---|
| පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය | මාදක රසායන හඳුනාගැනීමේ කට්ටල<br>පූරෝගාමී රසායන හඳුනාගැනීමේ කට්ටල | 02<br>01 |
| ශ්‍රී ලංකා රේගුව | මාදක රසායන හඳුනාගැනීමේ කට්ටල | 02 |
| **එකතුව** | | **05** |

**10.6.1.4 මත්ද්‍රව්‍ය සැපයුම අඩාල කිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක නිර්දේශ/ තාක්ෂණික සහය සහ උපදේශන සේවා**

1. කංසා අවභාවිතාව හා ජාවාරම් සම්බන්ධ ගැටලු හා ඒ හා සම්බන්ධිත අහිතකර ප්‍රතිවිපාකයන් මෙන්ම වෛද්‍යමය කරුණු සඳහා කංසාවලට නීත්‍යානුකුලභාවය ලබාගැනීම යන මාතෘකා මත සකස් කරන ලද ප්‍රශ්නාවලිය මත පදනම්ව, රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය, උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව - කොළඹ විශ්වවිද්‍යාලය, ජාතික මානසික සෞඛ්‍ය ආයතනය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය (ජාතික ඖෂධ නියාමන අධිකාරිය, වෛද්‍ය සැපයුම් ඒකකය) යන ආයතනවලින් රැස්කරගත් සවිස්තරාත්මක තොරතුරු සහ අදහස් පිළිබඳ සාරාංශගත වාර්තාවක් සකස් කිරීම.

2. කංසා අවභාවිතාව හා ජාවාරම සම්බන්ධව රටේ දැනට පවතින පසුබිම තක්සේරු කිරීම සහ කංසා ආශ්‍රිත වෛද්‍යමය භාවිතාවන් සඳහා ඇති සුලභතාවය හා වගාවන් පිළිබඳ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් සිදුකරනු ලැබූ පරීක්ෂණයන් ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් ආරක්ෂක ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම.

3. ශ්‍රී ලංකාවේ අවභාවිතා වන ශාක මූලික නීති විරෝධී මත්ද්‍රව්‍ය (කංසා විශේෂිතව) හඳුනාගැනීම සම්බන්ධව යාන්ත්‍රණයක් සැකසීම පිළිබඳ මාර්ගගතව විද්වත් හමුවක් පවත්වන ලදි. මේ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධානී මහාචාර්ය සී.ජී. පෙරේරා මහත්මිය, සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් රොහාන් විජේරත්න මහතා හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ විද්‍යාත්මක නිලධාරීන් සහභාගී විය. ශ්‍රී ලංකාව තුළ සංසරණය වන කංසා ආශ්‍රිත නව්‍ය වෛද්‍යමය නිෂ්පාදන හෝ පාරිභෝගික නිෂ්පාදන පිළිබඳ නෛතික හා නියාමනය කිරීමේ ආයතනික පසුබිම සම්බන්ධව නිරීක්ෂණයන් හා නිර්දේශයන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් ඉදිරිපත් කරන ලදි.

4. මත්ද්‍රව්‍ය පරීක්ෂණ කට්ටල 300ක් සැකසීම සඳහා අවශ්‍ය වන මූලික ක්‍රියාදාමයන් ආරම්භ කළ අතර මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා පරීක්ෂණ කට්ටලවල ජාතික අවශ්‍යතාවය පිළිබඳව තොරතුරු ලබාගැනීම ජාතික වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, රාජ්‍ය බුද්ධි සේවාව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, පොලිස් විශේෂ කාර්ය බලකාය හා ශ්‍රී ලංකා පොලීසිය ආමන්ත්‍රණය කිරීමෙන් ලබාගන්නා ලදි.

**10.6.2 පාලිත ඖෂධ/ ද්‍රව්‍ය අපසරණය වැළැක්වීමේ නියාමන අරමුණු සඳහා විද්‍යාත්මක සහය ලබා දීම සහ ඒවායේ ආනයන අපනයන සහ බෙදා හැරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම**

**10.6.2.1 මධ්‍යසාර සාම්පල විශ්ලේෂණය**

පහත දැක්වෙන්නේ ජාතික මාදක රසායනාගාරය මඟින් පර්යේෂණ මට්ටමෙන් සිදුකරන ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව හරහා එවනු ලබන මධ්‍යසාර විශ්ලේෂණය මඟින් ඒවායේ අඩංගු මෙතනොල් හා අනෙකුත් අතිරේක ද්‍රව්‍ය පිළිබඳ වාර්තා විස්තරයයි. මෙසේ සිදුකරනු ලැබූ අවස්ථාවට අදාළව සාම්පල 01ක විශ්ලේෂණයන් පහත දැක්වේ.

වගු අංක 05 - 2021 වසර තුළ දී විශ්ලේෂණය කරන ලද සාම්පල සංඛ්‍යාවන්

| ආයතනය | සිදුකරන ලද විශ්ලේෂණය | අවස්ථා සංඛ්‍යාව | සාම්පල සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | අයිසෝ-ප්‍රොපයිල් මධ්‍යසාර සහ අනෙකුත් අතිරේක ද්‍රව්‍ය පවතින බව හඳුනාගැනීම | 01 | 01 |

**10.6.2.2 අතිරේක ආහාරමය නිෂ්පාදනවල අඩංගු තහනම් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණ**

ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදනවල ඇති තහනම් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම රසායනාගාරය මඟින් සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ මෙන්ම පාසැල් මට්ටමේ ද ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදන තුළ තහනම් ද්‍රව්‍ය අඩංගු බවට ලැබුණු තොරතුරු අනුව මෙවැනි ද්‍රව්‍ය විශ්ලේෂණය කොට එවැනි ද්‍රව්‍ය හඳුනාගැනීම ක්‍රීඩාවේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම හා ඉදිරියේ දී ඇතිවිය හැකි අපකීර්තිමත් තත්ත්ව නිසා රටට ඇතිවිය හැකි බලපෑම අවම කරනු වස් ජාතික කර්තව්‍යයක් ලෙස සළකා ජාතික මාදක රසායනාගාරය මෙම අතිරේක ආහාර නිෂ්පාදන විශ්ලේෂණ කටයුතු අරඹන ලදි.

මෙහි දී ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය/ ශ්‍රී ලංකාවේ තහනම් උත්තේජක නිශේධක ආයතනය මඟින් ඉදිරිපත් කරනු ලැබූ සාම්පල විද්‍යාත්මක විශ්ලේෂණයන් පර්යේෂණ මට්ටමෙන් සිදු කරන ලදි. දිවයිනේ විවිධ අතිරේක ආහාර නිෂ්පාදන සමාගම් මඟින් ඉදිරිපත් කරන ලද සාම්පල විශ්ලේෂණයන් වගු අංක 06 මඟින් දැක්වේ.

වගු අංක 06 - අදාළ කාලය තුළ දී විශ්ලේෂණය කළ අතිරේක ආහාර නිෂ්පාදන සාම්පල සංඛ්‍යාව

| ආයතනය | අවස්ථා සංඛ්‍යාව | සාම්පල සංඛ්‍යාව |
|---|---|---|
| ඇස්ට්‍රොන් ලිමිටඩ්, රත්මලාන | 02 | 02 |
| සිලෝන් ග්‍රීන් ආයුර්වේද නිෂ්පාදන සමාගම | 01 | 01 |
| බියුටි ප්‍රඩක්ට්ස් ලංකා සමාගම | 02 | 02 |
| **එකතුව** | **05** | **05** |

**10.6.2.3 මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ පරීක්ෂණ කට්ටලවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සහ සහතික කිරීම**

තත්ත්ව පරික්ෂණ සහතිකකරණ (Quality Test Certificate - QTC) වැඩසටහන මෑතකදී ජාතික මාදක රසායනාගාරය මඟින් දියත් කරන ලද අතර මෙහි දී මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ කට්ටල/ මෙවලම්වල තත්ත්වය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ වැඩි වශයෙන් අවධානය යොමුකරන ලද අතර

ස්ථායිතාවය, හරස් ප්‍රතික්‍රියාකාරිත්වය, හඳුනාගැනීමේ මට්ටම, ක්ෂේත්‍ර මට්ටමින් සිදුකරන මූලික මත්ද්‍රව්‍ය පරීක්ෂණ සඳහා ව්‍යාජ ඖෂධවල බලපෑම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකරයි. සිදු කරන ලද පරීක්ෂණවල විස්තර පහත පරිදි වේ.

වගු අංක 07 - මෙම කාලසීමාව තුළ දී පරීක්ෂා කරන ලද පරීක්ෂණ කට්ටල සංඛ්‍යාව

| ආයතනය | පරීක්ෂණ කට්ටල වර්ගය | පරීක්ෂා කරන ලද මත්ද්‍රව්‍ය/ද්‍රව්‍ය වර්ග | පරීක්ෂණ කට්ටල සංඛ්‍යාව |
|---|---|---|---|
| සෞඛ්‍ය අමාත්‍යාංශය | බහු-විධ තත්ත්ව පරීක්ෂාව මත්ද්‍රව්‍ය (12) හඳුනාගැනීමේ පරීක්ෂණ කට්ටල (මුත්‍රා) | කොකේන්, ඇම්ෆෙටමින්, මෙතඇම්ෆෙටමින්, කැනබිනොයිඩ්ස්, මෙතඩෝන්, එක්ස්ටසි, මෝර්ෆීන්, ට්‍රැමඩෝල්, බාබිටියුරේට්, බෙන්සොඩයසපීන්, ෆෙන්ටනයිල්, ට්‍රයි සයික්ලික් ඇන්ටි ඩිප්‍රෙසන්ට් | 35 |
| සුරාබදු දෙපාර්තමේන්තුව | ඇල්කොහොල් මීටරය | එතනෝල් | 01 |

තවද, ඖෂධ හඳුනාගැනීමේ පරීක්ෂණ කට්ටලවල (මුත්‍රා/බේට තරල) තත්ත්ව පරීක්ෂාව සඳහා නිකුත් කරන ලද සහතිකයක් අලුත් කිරීම සඳහා එක් (01) ඉල්ලීමක් කරන ලද අතර, පරීක්ෂණ කට්ටලවල තත්ත්ව පරීක්ෂණ සඳහා බලපත්‍රය අලුත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික සහය සහ නිර්දේශ ලබා දෙන ලදි.

**10.6.3 මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය සඳහා නියාමන පියවර ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක නිර්දේශ, තාක්ෂණික සහය සහ උපදේශන සේවා සැපයීම**

**10.6.3.1 මාර්ගවල රථවාහන අනතුරු සහ මරණ වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා පියවරක් ලෙස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ රියදුරන් පරීක්ෂා කිරීම**

පවතින දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ වාර්ෂිකව සාමාන්‍ය අනතුරු 38,000ක් සිදුවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස 3,000ක් පමණ මරණ සහ 8,000ක් බරපතල තුවාල ලබා ඇත. ඇස්තමේන්තුගත වාර්ෂික මාර්ග අනතුරු සහ ඒක පුද්ගල මරණ සංඛ්‍යාව දකුණු ආසියාවේ ආසන්නතම අසල්වැසි රටවල් අතර ඉහළම අගය වේ. මෙය රටේ සෞඛ්‍යයට, යහ පැවැත්මට, මානව ප්‍රාග්ධනයට සහ ආර්ථික වර්ධනයට ඍජුවම ප්‍රශ්නයකි. ලෝක බැංකුව ඇස්තමේන්තු කර ඇත්තේ මාර්ග අනතුරු මරණ සහ තුවාල හේතුවෙන් ශ්‍රී ලංකාව වැනි රටවලට වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් 3% - 5% අතර මුදලක් වැය විය හැකි බවය. මෙම ගැටළුවට ප්‍රතිචාරයක් ලෙස, ජාතික මාදක රසායනාගාරය විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ප්‍රවාහන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසිය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ ජාතික ප්‍රවාහන

වෛද්‍ය ආයතනය වැනි අදාළ පාර්ශවකරුවන් සමග සම්බන්ධීකරණයෙන් මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පදවන රියදුරන් පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.

මේ සම්බන්ධයෙන් ජාතික මාදක රසායනාගාරය විසින් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග:

i. අදාළ අමාත්‍යාංශ සමග එකඟතාවයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ස්ථාපිත පනතට අනුකූලව මෙම ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස සිදු කිරීමට සැලසුම් කිරීම

ii. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

iii. මාර්ග ආශ්‍රිතව රියදුරන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පරීක්ෂා කිරීම පිළිබඳ නියමු අධ්‍යයනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කමිටුවක්/ ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම

iv. මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිර්දේශ කර ඇති පරිදි ජාතික මාර්ග ආරක්ෂක කවුන්සිලයේ මූල්‍ය සහය ඇතිව ඛේට තරල පරීක්ෂණ කට්ටල (5000 සංඛ්‍යාවක්) සහ මුත්‍රා තරල පරීක්ෂණ කට්ටල (5000 සංඛ්‍යාවක්) මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම

v. පාලන ක්‍රියාමාර්ග පිළිබඳ නීති සම්පාදනය, නියාමනය සහ සංශෝධන පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් විද්‍යාත්මක නිර්දේශ ඉදිරිපත් කිරීම

**10.6.3.2 මත්ද්‍රව්‍ය භාවිතා කරමින් රිය පැදවීම හා සම්බන්ධිත අභියෝග ජය ගැනීමට සහ මත්ද්‍රව්‍ය සඳහා පරීක්ෂා කිරීමට අදාලව නීතිය බලාත්මක කිරීමේ සහ වෛද්‍ය වෘත්තිකයන්ගේ ධාරිතා වර්ධන වැඩසටහන් කිරීම**

මාර්ග රථවාහන අනතුරු සහ මරණ වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා පියවරක් ලෙස මත්ද්‍රව්‍යවලින් තොර ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ රියදුරන් පරීක්ෂා කිරීම පිළිබඳ යෝජිත නියමු අධ්‍යයනයට අනුකූලව සහ මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පැදවීම හා සම්බන්ධිත අභියෝගය ජය ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන්නන් සහ වෛද්‍ය වෘත්තිකයන් දැනුවත් කිරීමේ අරමුණින් විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ ජාතික මාදක රසායනාගාරය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් අදාළ සියලු පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණයෙන් සංවිධානය කර ඇත. මෙම සහයෝගීතාවයන් තුළින් මත්ද්‍රව්‍ය භාවිත කර රිය පැදවීම හේතුවෙන් සිදුවන අනතුරු සහ මරණ වැළැක්වීම සඳහා තිරසාර යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරිණි.

I) ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, සභාපති - ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, සභාපති - මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (නියෝජිත), විශේෂ කාර්ය බලකායේ අණදෙන නිළධාරි (නියෝජිත), අධ්‍යක්ෂ - රථවාහන පාලන සහ මාර්ග ආරක්ෂාව, ශ්‍රී ලංකා පොලිසිය යන ආයතනවල සහභාගීත්වයෙන් සමාරම්භක උත්සවය පවත්වන ලද අතර, 2021 නොවැම්බර් 10 සහ 11 යන දිනවල දී අඛණ්ඩව දින හතරක් (04) පුහුණු වැඩසටහන පැවැත්විණි. මෙහි දී ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, අධිකරණ වෛද්‍ය විද්‍යාඥයින්ගේ

විද්‍යාලය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ විශේෂඥ වෘත්තිකයන් විසින් තාක්ෂණික සැසි පවත්වන ලදි.

II) තවද 2021 නොවැම්බර් 29 සහ 30 යන දිනවලදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රදානයන් යටතේ, මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පැදවීම සම්බන්ධයෙන් අභියෝගය ජය ගැනීම සහ රියදුරන් අතර මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතයේ හැසිරීම්වලින් මිදීමට ඔවුන්ට සහයවීම සඳහා වෛද්‍ය වෘත්තිකයන් දැනුවත් කිරීම සහ විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් උපාය මාර්ගික මැදිහත්වීම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

### 10.6.3.3 මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීම හා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන පියවරයන් සම්බන්ධ අනෙකුත් කාර්යයන් සඳහා තාක්ෂණික සහය සහ විද්‍යාත්මක නිර්දේශ ලබා දීම

ඵලදායී ලෙස මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීම, ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ක්‍රියාමාර්ගවලට අදාළව ලබා දුන් තාක්ෂණික සහය සහ විද්‍යාත්මක නිර්දේශ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

I) බර වාහන රියදුරන් සඳහා සිදුකරන මත්ද්‍රව්‍ය පරීක්ෂණය සම්බන්ධයෙන් "රියදුරන් මත්ද්‍රව්‍ය සඳහා වෛද්‍ය පරීක්ෂණයට යොමු කිරීම සහ එය සිදුකිරීමේ පිළිවෙල සම්බන්ධයෙන් මාර්ගෝපදේශ, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලදි.

II) ශ්‍රී ලංකාවට ආනයනය කරන ගංජා ආශ්‍රිත අලුතින් එකතුවන නිෂ්පාදන නියාමනය කිරීම සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියට සහ ශ්‍රී ලංකා රේගුව වෙත විද්‍යාත්මක නිර්දේශ සහ නිරීක්ෂණ ලබා දීම.

### 10.6.4 මත්ද්‍රව්‍ය පාලන ක්ෂේත්‍රය හා සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් හා අදාල අනෙකුත් ආයතනයන් සඳහා කාර්යක්ෂමතා හා බුද්ධිමය වර්ධන වැඩසටහන

පාලනයට යටත් ඖෂධ හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපනයනය, ආනයනය හා බෙදා හැරීම යන කාරණාවලදී මේ හා සම්බන්ධ කටයුතු කරනආයතනයන්හි සේවය කරන නිළධාරින්ගේ දැනුම හා පර්යේෂණ හැකියාව විද්‍යාත්මක පැතිකඩක් ඔස්සේ දැනුවත් කිරීමේ පුහුණු සැසි පැවැත්වීම ජාතික මාදක රසායනාගාරය විසින් සිදුකරනු ලැබේ. මෙහිදි දුර්භාවිත ඖෂධ හඳුනාගැනීම හා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරින් විශේෂිතව පුහුණු කරනු ලැබේ. මෙවැනි පුහුණු වැඩසටහන්/ වැඩමුළු මත්ද්‍රව්‍ය පාලන කටයුතු සඳහා සම්බන්ධ අනෙකුත් ආයතන සඳහා ද ක්‍රියාත්මක කරන ලදි.

### 10.6.4.1 මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා විද්‍යාත්මක පුහුණු වැඩසටහන්

ශ්‍රී ලංකාවේ නීති විරෝධී ඖෂධ හඳුනාගැනීම සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම යන තේමාව යටතේ දෙදින විද්‍යාත්මක පුහුණු වැඩසටහන් ජාතික මාදක රසායනාගාරය විසින් සංවිධානය කරන ලද අතර මෙම පුහුණු වැඩමුළුවේ අභිමතාර්ථය වූ,

1. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීම සම්බන්ධ මූලික දැනුම ලබා දීම
2. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සම්බන්ධ පුළුල් අවබෝධාත්මක දැනුම ලබා දීම
3. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය හඳුනාගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල භාවිතා කරමින් ප්‍රායෝගික දැනුම ලබා දීම
4. මත්ද්‍රව්‍යවල නවීන ආකාර සම්බන්ධව යාවත්කාලීන කිරීම

ඖෂධහල්වල අලෙවිකරනු ලබන මත් විය හැකි ඖෂධ අවභාවිතාව පිළිබඳ විද්‍යාත්මක පැතිකඩ පැහැදිලි කෙරෙන පුහුණු වැඩසටහන්/ සැසි අඛණ්ඩව විශ්වවිද්‍යාල සිසුන් සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලැබීය. 2021 වසරේදී සිදු කරනු ලැබූ මෙම වැඩමුළු වගු අංක 09 වගුවෙන් විස්තර කෙරේ.

වගු අංක 09 - 2021 වසරේදී පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්/ සැසි සංඛ්‍යාව

| ආයතනය | | පෙබ. | මාර්තු | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා නාවික හමුදාව (බුද්ධි අංශය) | වැඩමුළු සංඛ්‍යාව | - | 01 (පැය 48) | 01 (පැය 72) | - | - | - |
| | සහභාගි වූ සංඛ්‍යාව | - | 51 | 12 | - | - | - |
| පාදුක්ක/ කුරුණෑගල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සහ සංවර්ධන නිලධාරී | වැඩමුළු සංඛ්‍යාව | - | - | 02 | - | - | - |
| | සහභාගි වූ සංඛ්‍යාව | - | - | 90 | - | - | - |
| අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | වැඩමුළු සංඛ්‍යාව | - | - | - | 01 | - | - |
| | සහභාගි වූ සංඛ්‍යාව | - | - | - | 40 | - | - |
| රාජ්‍ය බුද්ධි සේවය සහ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය (ඒකාබද්ධව) | වැඩමුළු සංඛ්‍යාව | 02 (පැය 48) | 02 (පැය 96) | - | - | - | - |
| | සහභාගි වූ සංඛ්‍යාව | 56 | 56 | - | - | - | - |
| විශේෂ කාර්යසාධක | වැඩමුළු සංඛ්‍යාව | - | - | - | - | 03 (පැය 48) | 04 (පැය 48) |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| බලකාය | සහභාගි වූ සංඛ්‍යාව | - | - | - | - | 51 | 83 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | වැඩමුළු සංඛ්‍යාව | 01 (පැය 72) | - | - | - | - | - |
| | සහභාගි වූ සංඛ්‍යාව | 27 | - | - | - | - | - |
| ශ්‍රී ලංකා පොලිසිය | වැඩමුළු සංඛ්‍යාව | - | - | - | - | 01 (පැය 48) | - |
| | සහභාගි වූ සංඛ්‍යාව | - | - | - | - | 59 | - |
| වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | වැඩමුළු සංඛ්‍යාව | - | - | - | 01 | - | - |
| | සහභාගි වූ සංඛ්‍යාව | - | - | - | 20 | - | - |
| **එකතුව** | **වැඩමුළු සංඛ්‍යාව** | **03** | **03** | **03** | **02** | **04** | **04** |
| | **සහභාගි වූ සංඛ්‍යාව** | **83** | **107** | **102** | **60** | **110** | **83** |

**මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව : 19**

**සහභාගි වූ සංඛ්‍යාව : 545**

**10.6.4.2 මත්ද්‍රව්‍ය හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කරන ආයතන නිලධාරීන් සඳහා පවත්වනු ලබන පරිගණක පුහුණු වැඩසටහන්**

මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම හා පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම උදෙසා මත්ද්‍රව්‍යවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය උපක්‍රමයක් වන අතර ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හට විධිමත් පුහුණුවක් ලබා දීම මූලික කොටගෙන පරිගණක පුහුණු වැඩසටහන් මෙම වසර තුල ද පවත්වන ලදි. ඒ අනුව පහත සඳහන් කර ඇති විශේෂිත වූ මොඩියුල සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට දැනුවත්භාවය ලබා දීම සඳහා පරිගණක පුහුණු වැඩසටහන් පවත්වන ලදි. ප්‍රමිතිගතකොට යාවත්කාලීන කරන ලද පුහුණු වැඩසටහන් මඟින් ඉතාමත් සාර්ථක ක්‍රියාන්විතයන් සහිත තාක්ෂණික උපක්‍රම යොදාගනිමින් මෙන්ම බුද්ධිමය උපක්‍රම භාවිතා කරමින් මෙහෙයුම් කිරීම කල හැකි අතර එමඟින් ඉතාමත් ශක්තිමත්ව නීතිය ක්‍රියාත්මක කළ හැක. එමනිසා පරිගණක මූලාශ්‍ර පුහුණු පාඨමාලාව තුළ දැනුම වර්ධනය කිරීම, අවබෝධය ඇති කිරීම සහ ඉලක්කගත කාරණා සඳහා වෙනස් වූ මොඩියුල මඟින් ඉතා ප්‍රතිඵලදායක සාර්ථක උපක්‍රමික විධික්‍රම සහිත පුහුණු වැඩසටහන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හට ලබාදී ඇත.

මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරවීම සඳහා මෙම වැඩසටහන් අත්‍යවශ්‍ය වන අතර නීති විරෝධි මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ඉලක්කගත ක්‍රමවේද සහිත පුහුණු පාඨමාලාවන් හඳුන්වාදීමෙන් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතාව පිළිබඳ පාලන හා නිවාරණ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වැඩසටහන් මහත් පිටුවහලක් වනු ඇත.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (NDDCB( එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලයේ (UNODC) තාක්ෂණික සහය සමඟින් මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවන් සවිමත් කිරීම සඳහා පරිගණක පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදි. නමුත්, කොවිඩ් - 19 වසංගතය අතරතුර මුහුණ දුන් තාක්ෂණික ගැටළු හේතුවෙන් 2021 වසර තුළදී පරිගණක පුහුණු වැඩසටහන් නොපවත්වන ලදි.

### 10.6.5 මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම අරමුණු කොටගෙන ප්‍රතිකාර කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලීන් සඳහා විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ සහය ලබා දීම

#### 10.6.5.1 දුර්භාවිත ඖෂධවල පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය

මෙම කර්තව්‍යයේ දී ජීව විද්‍යාත්මක සාම්පලවල ඇති පාලනයට නතු ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය කොටස් හඳුනාගැනීම සඳහා පුද්ගල හා ආයතන මට්ටමින් විශ්ලේෂණ කරනු ලබයි. විශ්ලේෂණයෙන් පසුව මත්ද්‍රව්‍යවලින් නිදහස් බවට දෙනු ලබන සහතිකය රැකියා ලබා ගැනීම හා වෙනත් කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම රසායනාගාර වාර්තාව රෝග නිධාන හඳුනා ගැනීම, ප්‍රතිකාර තීරණය කිරීම, පුනරුත්ථාපනය කිරීම සඳහා පුද්ගලයන් යොමු කිරීම අධ්‍යාපනික ආයතනවල මෙන්ම රැකියා අවශ්‍යතා වැනි කාරණාවලදී ප්‍රයෝජනවත් වේ. ඊට අමතරව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධ 2007 අංක 54 දරන පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සාම්පල විශ්ලේෂණ වාර්තාවන් මහේස්ත්‍රාත් අධිකරණ වෙත සපයනු ලබයි.

විෂ අබිං අන්තරායකර ඖෂධ පාලනය පිළිබඳ පනත හා 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත බලගැන්වීම උදෙසා ජාතික මාදක රසායනාගාරය විසින් විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පලවල විස්තරාත්මක ලේඛනයන් පහත වගු අංක 10 මඟින් ඉදිරිපත් කෙරේ.

වගු අංක 10 - 2021 වසරේදී විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක නියැදි සංඛ්‍යාව

| ආයතනය | | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රජයේ හා පෞද්ගලික රෝහල | සාම්පල සංඛ්‍යාව | 04 | 09 | 16 | 03 | 02 | 05 | - | 10 | 03 | 09 |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 27 | 38 | 74 | 07 | 06 | 09 | - | 74 | 27 | 81 |
| මහේස්ත්‍රාත් අධිකරණ | සාම්පල සංඛ්‍යාව | - | - | - | - | - | - | 01 | 01 | 01 | - |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | - | - | - | 02 | 05 | 01 | **-** |
| නීතිය බලාත්මක කරන ආයතන | සාම්පල සංඛ්‍යාව | 02 | - | - | - | - | - | - | - | - | - |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 24 | - | - | - | - | - | - | - | - | - |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | සාම්පල සංඛ්‍යාව | - | - | - | - | - | - | 01 | 02 | - | 05 |
| | පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | - | - | - | 12 | 24 | - | 60 |
| තනි පුද්ගලයින් | සාම්පල සංඛ්‍යාව | - | 02 | 01 | 01 | - | - | - | 01 | - | - |
| | පරීක්ෂණ සංඛ්‍යාව | - | 03 | 07 | 01 | - | - | - | 02 | - | - |
| **එකතුව** | **සාම්පල සංඛ්‍යාව** | **06** | **11** | **17** | **04** | **02** | **05** | **02** | **14** | **05** | **14** |
| | **පරීක්ෂණ සංඛ්‍යාව** | **51** | **41** | **61** | **08** | **06** | **09** | **14** | **105** | **29** | **141** |

**මුළු නියැදි සංඛ්‍යාව** : 80

**මුළු පරීක්ෂණ සංඛ්‍යාව** : 465

### 10.6.5.2 විමර්ශන සහ මෙහෙයුම් අරමුණු සඳහා ජීව විද්‍යාත්මක නිදර්ශකවල මත්ද්‍රව්‍ය ඇති බවට තහවුරු කිරීමේ විශ්ලේෂණයන් සිදු කිරීම

ජීව විද්‍යාත්මක නිදර්ශක (මුත්‍රා) සම්බන්ධයෙන් පරීක්ෂණ කට්ටල හරහා සිදු කරන මූලික පරීක්ෂණ යනු ගුණාත්මක විශ්ලේෂණයක් පමණක් වන අතර එහිදී අදාල නිදර්ශකයන්ගේ මත්ද්‍රව්‍ය හෝ එහි පරිවෘත්තීය ද්‍රව්‍ය තිබීම හෝ නොපැවතීම පමණක් පෙන්නුම් කරන අතර, එහිදී අන්තර් ප්‍රතික්‍රියා කරන මත්ද්‍රව්‍ය හා සමාන රසායනික ද්‍රව්‍ය හේතුවෙන් ද අදාල ප්‍රතිඵල පෙන්නුම් කල හැක. එබැවින් යමෙකු මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බව විමර්ශනය සඳහා සවිස්තරාත්මක තහවුරු කිරීමේ විශ්ලේෂණයක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

2021 වර්ෂය තුළ ජාතික මාදක රසායනාගාරය විසින් ගෑස් ක්‍රොමැටොග්‍රැෆි මාස් ස්පෙක්ට්‍රොස්කොපි (Gas Chromatography Mass Spectrometry) තාක්ෂණය භාවිතයෙන් විමර්ශන සහ මෙහෙයුම් අරමුණු සඳහා වන ඉල්ලීම් මත පදනම්ව නීතිය බලාත්මක කරන ආයතන විසින් ඉදිරිපත් කරන ලද ජීව විද්‍යාත්මක නිදර්ශක (මුත්‍රා) සඳහා තහවුරු කිරීමේ විශ්ලේෂණය සිදු කරන ලදි. අදාල නිදර්ශකවල මත්ද්‍රව්‍ය ඇති බවට සනාථ කිරීමට සිදු කරනු ලැබූ තහවුරු කිරීමේ පරීක්ෂාවන් සම්බන්ධයෙන් විස්තර පහත වගුවෙහි සටහන් වේ.

වගු අංක 11 - 2021 කාල සීමාව තුළ සිදු කරන ලද තහවුරු කිරීමේ විශ්ලේෂණය පිළිබඳ විස්තර

| **ආයතනය** | **අරමුණ** | **සාම්පල සංඛ්‍යාව** | **තහවුරු කිරීම සඳහා ඉලක්කගත විශ්ලේෂණ සංඛ්‍යාව** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය කොළඹ | විමර්ශන | 01 | 02 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය රත්මලාන | විමර්ශන | 01 | 02 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය කටුනායක | විමර්ශන | 02 | 02 |

**10.6.5.3 රැකියා ස්ථානයන්හි මත්ද්‍රව්‍ය පරීක්ෂණ**

රැකියා ස්ථානවල වැඩ කරන කාල සීමාවන්හි දී පුද්ගලයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සෞඛ්‍ය, ආරක්ෂාව මෙන්ම කාර්යක්ෂමතාව කෙරෙහි ද බලපෑම් ඇති කරන අතර එය රටෙහි නිෂ්පාදන ක්‍රියාවලියට ද අහිතකර ලෙස බලපාන බව පැහැදිලිය. මෙහි අවදානම අවම කිරීම පිණිස ජාතික මාදක රසායනගාරය මඟින් රැකියා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර කලාප ස්ථාපිත කිරීම උදෙසා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා අනුබද්ධ සමාගම්වල සම්බන්ධීකරණයෙන් මත්ද්‍රව්‍ය භාවිතය/ නොකිරීම තහවුරු කිරීම සඳහා සේවකයන්ගේ ශරීර තරලවල පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනාගැනීමේ පරීක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් ආරම්භ කොට ඇත.

වගු අංක 12 - රැකියා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තහවුරු කිරීම සඳහා විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පලවල විස්තරාත්මක ලේඛනයන් පහත වගුවෙන් දැක්වේ.

| **ආයතනය** | | පෙබ. | මාර්තු | අප්‍රේල් | ජූලි | අගෝ. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|
| C- Suite Pvt Ltd | සාම්පල සංඛ්‍යාව | 10 | 10 | 03 | 15 | 27 | - | - | - |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 94 | 80 | 19 | 134 | 182 | - | - | - |
| Envoy Ortus Pvt Ltd | සාම්පල සංඛ්‍යාව | - | - | - | - | - | - | 29 | 37 |
| | පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | - | - | - | 156 | 180 |
| Acuity Knowledge Partners | සාම්පල සංඛ්‍යාව | - | - | - | - | - | - | 05 | 03 |
| | පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | - | - | - | 25 | 15 |
| Ausee Oats Milling (Pvt) Ltd | සාම්පල සංඛ්‍යාව | - | - | - | - | - | 15 | - | - |
| | පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | - | - | 30 | - | - |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| Star Tek Private Limited | සාම්පල සංඛ්‍යාව | - | - | - | - | - | - | - | 02 |
| | පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | - | - | - | - | 08 |
| **එකතුව** | සාම්පල සංඛ්‍යාව | **10** | **10** | **13** | **15** | **27** | **15** | **34** | **42** |
| | පරීක්ෂණ සංඛ්‍යාව | **94** | **80** | **19** | **134** | **182** | **30** | **181** | **203** |

**මුළු නියැදි සංඛ්‍යාව : 166**

**මුළු පරීක්ෂණ සංඛ්‍යාව : 923**

### 10.6.6 දුර්භාවිත මත්ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර ප්‍රමිතිකරණය පවත්වාගෙන යාම හා නඩත්තුකරණය

#### 10.6.6.1 ජාත්‍යන්තර කාර්යක්ෂමතා පරීක්ෂණ වැඩසටහන්

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන මඟින් ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන නමින් පවත්වන ජාත්‍යන්තර රසායනාගාර කුසලතා පරීක්ෂණ වැඩසටහනට ජාතික මාදක රසායනාගාරය සහභාගි වේ. මෙම වැඩසටහනට සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල රසායනාගාරයන් ඉදිරිපත් වේ.

මේ සඳහා අඛණ්ඩව සිදුකරන සහභාගීත්වය මඟින් ගෝලීය මට්ටමෙන් රසායනාගාර සම්මතකරණ කර ගැනීම, විශ්ලේෂණ හැකියාවන් වර්ධනය කර ගැනීම, නිවැරදි තීන්දු ගැනීම පිළිබඳ වඩා නිවැරදි ප්‍රවිෂ්ඨයක් ලබා ගනී. ස්ථාවර මෙන්ම ඒකාබද්ධ ප්‍රතිඵල හා වාර්තාකරණයන් සියලුම රසායනාගාර මඟින් ලබා ගැනීම මෙහිදී බලාපොරොත්තු වේ.

මේ සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය මඟින් අවශ්‍ය නිර්දිෂ්ඨ සාම්පල සහ හඳුනා නොගත් සැක සහිත සාම්පල, සහ ජීව විද්‍යාත්මක සාම්පල, හඳුනාගැනීම සහ විශ්ලේෂණ සඳහා එවනු ලබයි.

**ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) - දෙවන අදියර 2021**

මෙම කාලසීමාව තුළ දී රසායනාගාරය මඟින් ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන් 2021, 2වන අදියරයන් සඳහා "සැක සහිත සාම්පල" සහ "ජීව විද්‍යාත්මක සාම්පලවලට" අදාලව සියලු ලේඛනගත කිරීමේ කටයුතු අවසන් කරන ලදි.

**ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) - පළමුවන අදියර 2021**

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන් 2021 අදියර 1 ප්‍රතිඵල සමාලෝචනයට අනුව සුදුසුකම් ලබන රසායනාගාර ලැයිස්තුගත කිරීම සඳහා රටවල් 63ක රසායනාගාර 204ක් සහභාගි වී ඇති අතර, වගු අංක 13 මඟින් ජාතික මාදක රසායනාගාරයේ ප්‍රතිඵල ඇගයීම දැක්වේ.

වගු අංක 13 - ICE වැඩසටහනේ 2021 - පළමුවන වන අදියරෙහි ප්‍රතිඵල ඇගයීම

| පරික්ෂාව | Z අගය |
|---|---|
| 3,4-මෙතිලීන්ඩයොක්සිමෙතැම්ෆිටමීන් (MDMA) | 0.16 |
| හෙරොයින් | - 1.08 |

**/Z/අගයේ සතුටුදායක සීමාව : <2**
**ජාත්‍යන්තර සහායෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) - දෙවන අදියර 2020**

2021 වසර ආරම්භයේ දී, ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන **(ICE)** - 2020 2වන අදියරෙහි "සැක සහිත සාම්පල" සහ "ජීව විද්‍යාත්මක සාම්පල" වලට අදාළ අවශ්‍ය ලියකියවිලි සම්පූර්ණ කරන ලදි. කෙසේ වෙතත්, ආනයන බලපත්‍රය ඉදිරිපත් කිරීමේ දී ඇති වූ තාක්ෂණික ප්‍රමාදයන් සහ 2020 (ICE) දෙවන අදියර සඳහා සාම්පල රසායනාගාරය වෙත ලැබීමේ දී වූ ප්‍රමාදය හේතුවෙන්, ජාතික මාදක රසායනාගාරයේ ඇගයීම් ප්‍රතිඵල UNODC විසින් නිකුත් කරන ලද සාරාංශ වාර්තාවලට ඇතුළත් කර නොමැත.

**10.6.6.2 ජාතික මාදක රසායනාගාරයෙහි සම්පත් ශක්තිමත් කිරීම, සේවාවන්හි ඵලදායිතාව සහ පහසුකම් සංවර්ධනය - 17025 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ සහතිකය**

ISO 17025 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ සහතිකය ලබාගැනීම සඳහා විද්‍යාගාරයේ සේවාවන් ඉහළ සම්මත ක්‍රියාමාර්ගයක පවත්වාගැනීම පිණිස මත්ද්‍රව්‍ය, මනෝවර්ධක ද්‍රව්‍ය, පූරෝගාමී රසායන හා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ආදිය සම්බන්ධයෙන් සිදු කරනු ලබන විද්‍යාත්මක පරීක්ෂණයන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාගාරයේ හැකියාව වැඩිදියුණු කිරීමට අදාල ලියකියවිලි සකස් කෙරෙමින් පවතී.

ISO 17025 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ සහතිකය ලබා ගැනීම සම්බන්ධව උපකරණ සහ රසායනාගාර නඩත්තු සම්බන්ධ අරමුණු ප්‍රකාශ (SOP) ලේඛන සකස් කිරීම සිදුකරන ලදි.

තව ද මත්ද්‍රව්‍ය පාලනය හා නියාමනයන් මෙහෙයවන නීතිය බලාත්මක කිරීමේ සහ නියාමන අධිකාරි ආයතනවල විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් භාවිතයන් හා නව සංවර්ධන සැලසුම් ක්‍රියාවට නැංවීමට හා ප්‍රවර්ධනය කිරීමට අනුගතව, ජාතික මාදක රසායනාගාරය විසින් ISO 17025 රසායනාගාර ප්‍රමිතිකරණය ක්‍රියාවලිය ලබාගැනීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ මණ්ඩලය (SLAB) වෙතින් උපදේශන සේවා ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත.

**10.6.7 රට තුළ මත්ද්‍රව්‍ය පාලනය සහ භාවිතය පිළිබඳ ගැටලුව වැළැක්වීම සඳහා විද්‍යාත්මක සේවාවන් ප්‍රවර්ධනය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග සහ නව මුලපිරීම් (කණ්ඩායම් කාර්යයන්)**

I. පහත සඳහන් පනත් සංශෝධනය කිරීම සඳහා විද්‍යාත්මක නිර්දේශ සැපයීම

- 1984 අංක 11 දරන අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත
- විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ ආඥා පනත සහ සංශෝධන
- 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත
- 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිලිබඳ පනත

II. රට තුළ මත්ද්‍රව්‍ය පාලනය සහ භාවිතය අවම කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කෙටුම්පත සමාලෝචනය සඳහා නිරීක්ෂණ සහ විද්‍යාත්මක නිර්දේශ ඉදිරිපත් කර ඇත.

III. මත්ද්‍රව්‍ය නිවාරණය සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සහ ක්‍රියාමාර්ග, අදාළ සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් හඳුනාගනිමින්, ජාතික ක්‍රියාකාරී සැලැස්මේ කෙටුම්පත සකස්කිරීම සඳහා නිරීක්ෂණ සහ විද්‍යාත්මක නිර්දේශ ඉදිරිපත් කර ඇත.

IV. අවසන් කරන ලද නඩු කටයුතුවල නඩු භාණ්ඩ ලෙස පවතින නීතිවිරෝධී මත්ද්‍රව්‍ය විනාශ කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික විශේෂඥතාව ලබා ගැනීමට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුව වෙනුවෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය නියෝජනය කිරීම.

අ. නඩු කටයුතු අවසන් නීති විරෝධී මත්ද්‍රව්‍ය සහිත නඩු භාණ්ඩ, සොරකමට යොමු වීමේ අවස්ථාවන් වැළැක්වීම, ආදේශ කිරීම, නිසි ගබඩා අවකාශයන් අවමවීමේ දී ඇතිවන බාධා වළක්වාගැනීම සහ ඒවා විනාශ කිරීමේ දී මිනිස් සෞඛ්‍යයට, ප්‍රජාවන්ට සහ පරිසරයට ඇති අවදානම අවම කිරීම සැලකිල්ලට ගනිමින්, නීති විරෝධී මත්ද්‍රව්‍ය විනාශ කිරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග හඳුන්වාදීමේ දී ක්‍රියාකාරී දායකත්වය සහ අත් අඩංගුවට ගත් නීති විරෝධී ඖෂධ විද්‍යාත්මකව බැහැර කිරීම හඳුන්වාදීම සඳහා පවත්වන ලද සාකච්ඡා සභාපතිනියගේ ප්‍රමුඛත්වයෙන් සහභාගි වීම.

ආ. අත්අඩංගුවට ගත් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය විනාශ කිරීමේ ක්‍රියාවලියේ ඒකාකාරිත්වය පවත්වාගෙන යාම, එම මත්ද්‍රව්‍යවල සාම්පල නියැදි විශ්ලේෂණ සඳහා යොමු කිරීම, අදාල රෙගුලාසි මගින් නියම කර ඇති පරිදි මත්ද්‍රව්‍ය සාම්පල හැසිරවීමේ ආරක්ෂිත ක්‍රමවේදයන් සහ විශාල නීතිවිරෝධී මත්ද්‍රව්‍ය තොගවල පූර්ව විනාශ කිරීමේ ක්‍රියාවලින් සම්බන්ධයෙන් විද්‍යාත්මක නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඇ. නිමා වූ නඩු 19,869ට අදාළ නීති විරෝධී මත්ද්‍රව්‍ය සාම්පල විනාශ කිරීමේ ක්‍රමවේදය සහ පූර්ණ දහනය කිරීමේ පහසුකම සලසාගැනීම වෙනුවෙන් අවශ්‍ය පිරිවිතර තවදුරටත් ඉදිරිපත් කරන ලදි.

V. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද මුදල් විශුද්ධිකරණය පිළිබඳ රැස්වීම නියෝජනය කිරීම සහ මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් නීති විරෝධී මූල්‍ය ප්‍රවාහයන් පාලනය කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ අවදානම් තක්සේරු කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් සක්‍රීය දායකත්වය ලබා දීම සහ ඒ පිළිබඳ විද්‍යාත්මක නිර්දේශ ඉදිරිපත් කිරීම.

VI. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සමඟ සම්බන්ධීකරණයෙන් ජංගම මත්ද්‍රව්‍ය පරීක්ෂණ පහසුකම සංවර්ධනය ආරම්භ කිරීම (මාර්ගවල මත්ද්‍රව්‍ය භාවිත කරන රියදුරන් හඳුනාගැනීමේ විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් යාන්ත්‍රණය සහ තත්ත්වය තක්සේරු කිරීමේ හදිසි අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්) මෙහි දී මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ පරීක්ෂණ සිදු කිරීමේ පහසුකම් සහිත ජංගම බස් රථය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සමඟ සම්බන්ධීකරණයෙන් ස්ථාපිත කිරීමේ යෝජනාව වෙනුවෙන් තාක්ෂණික විශේෂඥතාව ලබා දීම.

VII. රසායනාගාරය විසින් විශේෂයෙන් හඳුනාගෙන ඇති නැගී එන ප්‍රවණතා (මත්ද්‍රව්‍ය මිශ්‍ර ආහාර නිෂ්පාදන, ගංජා දෙමුහුන් ප්‍රභේද, ඖෂධ නිෂ්පාදන ආදිය) පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ තොරතුරු පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, විශේෂ කාර්ය බළකාය, රාජ්‍ය බුද්ධි සේවාව සමඟ බෙදාහැරීම සහ ඵලදායී ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ නීතිපති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාල ආයතනවල ඵලදායි ක්‍රියාමාර්ග ගැනීම අරමුණු කොට ගෙන නිසි දැනුවත් කිරීම් සිදු කිරීම.

VIII. ශ්‍රී ලංකා පොලිසිය සහ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් අන්තර්ජාලය හරහා සහ සමාජ මාධ්‍ය ජාල භාවිතා කරමින් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම සහ විකිණීමට එරෙහිව ඵලදායීව නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම.

IX. රසායනාගාරය නියෝජනය කරමින්, මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය ජාවාරම සහ මත්ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා කිරීම සහ ඒවායේ විනාශකාරී අහිතකර ප්‍රතිවිපාකවලට එරෙහිව සහ අඛණ්ඩව නැගී එන අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා නීතිමය සහ තාක්ෂණික උපදෙස් පිළිබඳව ගරු නීතිපතිවරයා සමඟ සක්‍රීය සාකච්ඡාවක නිරත විය.

සාකච්ඡාගත වූ මාතෘකා

a. පාලිත මත්ද්‍රව්‍ය සඳහා නීත්‍යානුකූල විකල්ප ලෙස මත්ද්‍රව්‍ය මිශ්‍ර ආහාර නිෂ්පාදන, ක්‍රීඩා ආශ්‍රිත පෝෂණ අතිරේක, රූපලාවන්‍ය ද්‍රව්‍ය වැනි රසායනික ද්‍රව්‍ය, යන ආකාරවලින් මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය ව්‍යාප්ත වීම සහ රසායනික ද්‍රව්‍ය, සැකසුම් සහ ව්‍යාජ ඖෂධ ආකාරයෙන් මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය ජාවාරම් කිරීම සහ අනිසි ලෙස භාවිත කිරීම යන කරුණු මතු කරමින්, ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීම සහ වැළැක්වීම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සඳහා බලය පැවරීමේ අවශ්‍යතාවය.

b. මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ වැලැක්වීම හා මත්ද්‍රව්‍ය නීතිය බලාත්මක කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා විද්‍යාත්මක බුද්ධි සේවා සැපයීම අරමුණු කරගනිමින් අත් අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය සාම්පලයන්ගේ කුඩා කොටසක්, උසාවි කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට පෙර රසායනාගාරය වෙත ඉදිරිපත් කිරීම.

c. මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සටන් කිරීම, සමාජ මාධ්‍ය ඇතුළු අන්තර්ජාලය හරහා තහනම්/ පාලිත ඖෂධ ප්‍රවර්ධනය කිරීම සහ තැපැල් සේවා හරහා බෙදාහැරීම සහ ජාවාරම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන

X. නියාමන අරමුණු සඳහා ලෝක තහනම් උත්තේජක විරෝධී නියෝජිතායතනය (WADA) විසින් තහනම් කරන ලද ක්‍රීඩාවේදී භාවිතා වන ආහාරමය අතිරේක, ධාරිතා වර්ධක ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා විද්‍යාත්මක නිර්දේශ සහිත යෝජනා යෞවන හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි.

XI. පුරෝගාමී පාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කරමින් සුදුසු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ මනා සම්බන්ධීකරණයකින් සුදුසු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා අධීක්ෂණ සහ තාක්ෂණික සහය ලබාදීම වෙනුවෙන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් බොහෝ මුලපිරීම් ගෙන ඇත.

a. එෆිඩ්‍රින් නමැති ද්‍රව්‍ය සහිත ඖෂධීයමය සැකසුම් අපසරණය වැළැක්වීම සම්බන්ධයෙන් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.
b. පූර්වජ රසායනික ද්‍රව්‍ය ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු කඩිනම් කිරීම
c. බලපත්‍ර/ ලියාපදිංචි සහතික/ විමර්ශනයට අදාල සාම්පල නියැඳි සඳහා පරීක්ෂණ ගාස්තු සංශෝධනය කිරීම සඳහා පුරෝගාමී පාලන නියාමනයන් සංශෝධනය කිරීම.
d. පූර්වජ රසායනික ද්‍රව්‍ය සහ ඒවායේ සැකසුම්, ආනයනය අපනයනය සම්බන්ධයෙන් ඵලදායී පාලන පියවරයන් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම.
e. පූර්වජ රසායනික ද්‍රව්‍ය අපසරණයවීමේ උත්සාහයන් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය සමඟ සම්බන්ධීකරණයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට සහය වීම සහ විමර්ශනයන් ප්‍රවර්ධනය කිරීම

**10.6.8 ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය හා නිවාරණය උදෙසා ජාත්‍යන්තර සබඳතා හා කාර්යයන් ශක්තිමත් කිරීමට පියවර ගැනීම**

I. "ඇබ්බැහිය සුවපත් කිරීම් නැවත වරනැගීම්" මැයෙන් මත්ද්‍රව්‍ය කොමිසම/ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ වැළැක්වීමේ කාර්යාලය මඟින් 64වන සැසියේ දී එක් පැතිකඩක් උදෙසා

ක්‍රියාත්මක වන වැඩසටහනට ජාතික මාදක රසායනාගාරයේ නිලධාරීන් 2021 අප්‍රේල් 14 දින සම්බන්ධ විය.

II. මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු හේතුවෙන් ඇතිවන මානව හිමිකම් උල්ලංඝනයවීම් ඉස්මතු කිරීම පිණිස මානව හිමිකම් සභාවේ මත්ද්‍රව්‍ය ප්‍රතිපත්ති මත බලහත්කාරයෙන් රඳවාගැනීම සම්බන්ධව කටයුතු කරන ක්‍රියාකාරී කමිටුව වෙත ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විද්‍යාත්මක පැහැදිලි කිරීම් සහිත වාර්තාවක් ඉදිරිපත් කරන ලදි.

III. BIMSTEC කලාපීය හමුව වෙත විද්‍යාත්මක නිර්දේශ ඇතුළත් යෝජනාවලියක් ඉදිරිපත් කරන ලදි.

IV. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය පාලන හා නිවාරණ ක්‍රියාවලිය සඳහා ද්වි පාර්ශවීය හා බහු පාර්ශවීය එකඟතාවයන් පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම උදෙසා විද්‍යාත්මක නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

V. මත්ද්‍රව්‍ය පාලනය නිවාරණය උදෙසා ජාත්‍යන්තරයේ භාවිතාවන තත්ත්ව සමඟ සමපාත කිරීම්, අවශ්‍ය යාවත්කාලීන කිරීම, තත්ත්වකරණය, විද්‍යාත්මක සාකච්ඡා මූලික තාක්‍ෂණික ක්‍රියාදාමයන් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම.

VI. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලක මණ්ඩලය (INCB) එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය මගින් නිකුත් කරන උපදේශන/ නිර්දේශ මාර්ගෝපදේශ නිසි පරිදි එකතු කිරීම පරිහරණය සහතික කිරීම හා ඒවා නිවාරණ ප්‍රතිකාර පුනරුත්ථාපන කාර්යයන් වෙනම නීති සම්පාදනය සහ රසායනාගාර විශ්ලේෂණ කටයුතුවලට යොදා ගැනීම.

VII. කලාපීය සහ ජාත්‍යන්තර නියෝජිතායතනවල හවුල්කාරීත්ව වැඩසටහන් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ වඩාත් ඵලදායී මත්ද්‍රව්‍ය නිවාරණ සහ පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික සහය, විද්‍යාත්මක නිර්දේශ සහ ක්‍රියාකාරී දායකත්වය ලබා දීම.

a. GRIDS (භයානක ද්‍රව්‍ය ගෝලීයව ව්‍යාප්තිය වේගවත්වීම තහනම් කිරීම)
රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය පුළුල් කිරීම, කලාපීය තාක්ෂණික උපදේශකයින් ඇති කිරීම, බුද්ධි හුවමාරුව, තීව්‍ර කිරීමේ අරමුණින් ලෝක මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB) විසින් මෙහෙයවන ලද වැඩසටහනකි.

b. නව මනෝකාරී ද්‍රව්‍යවල ජාත්‍යන්තර මෙහෙයුම් සහ ලැයිස්තුගත කොට නැති නව මනෝකාරී ද්‍රව්‍ය පිළිබඳ බහුපාර්ශ්වික මෙහෙයුම් ක්‍රියාකාරකම්, බුද්ධි තොරතුරු උත්පාදනය සහ හුවමාරු කිරීම, දැනුවත් කිරීම, බුද්ධි උත්පාදනය සහ ව්‍යාප්තිය සඳහා IONICS වේදිකාව වෙත තත්‍යකාලීන තොරතුරු හුවමාරු කරගැනීමේ ප්‍රවේශය සඳහා ජාතික අධිකාරීන්ට සහයවීම වෙනුවෙන් ලෝක මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB) විසින් මෙහෙයවන ලද වැඩසටහනකි.

c. I2ES පද්ධතිය

ලෝක මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB) මගින් සංවර්ධනය කරන ලද මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය (NDPS) සඳහා ආනයන සහ අපනයන බලය පැවරීමේ මාර්ගගත පද්ධතිය හරහා එම ද්‍රව්‍යයන්ගේ ආනයන සහ අපනයන ක්‍රියාවලීන්ට මත්ද්‍රව්‍ය පාලනයේ ජාතික අධිකාරීන්ගේ අවසර ලබා ගැනීමට සහ අදාල අනුමත කිරීම් වේගවත් කිරීමට දියත් කරන ලද වැඩසටහනකි.

d. UNODC ගෝලීය විද්‍යුත් ඉගෙනුම් වැඩසටහන

මත්ද්‍රව්‍ය සංවිධානාත්මක අපරාධ, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, මිනිස් ජාවාරම, දේශසීමා පාලනය, පරිගණක ආශ්‍රිත පුහුණුව සහ මාර්ගගත පුහුණු පාඨමාලා හරහා පාඨමාලා ලබා දෙන බුද්ධි විශ්ලේෂණවලට එරෙහිව පුහුණු වැඩසටහන් ඉදිරිපත් කිරීම.

**මූල්‍යමය විස්තර**

වගු අංක 14 - 2021 වර්ෂය තුළ ජාතික මාදක රසායනාගාරය විසින් සපයන ලද විශ්ලේෂණ සේවා මත පදනම්ව උත්පාදනය කරන ලද ආදායම

| **විශ්ලේෂණය** | **ආදායම රුපියල්** |
|---|---|
| දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය | 1,010,250.00 |
| ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල නැවත සකස් කිරීම | 10,000.00 |
| මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ පරීක්ෂණ කට්ටලවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සහ සහතික කිරීම | 31,000.00 |
| තහනම් උත්තේජක අඩංගු අතිරේක ආහාර විශ්ලේෂණය | 100,000.00 |
| **එකතුව** | **1,151,250.00** |

**ජාතික මාදක රසායනාගාරයේ 2020/21 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම**

| වර්ෂය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| 2020 | 35.03% | 70.56% |
| 2021 | 68.08% | 12.01% |

පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ, 2020 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වූ අතර, එම බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස 35.03%ක භෞතික ප්‍රගතිය රසායනාගාරය විසින් 2020 වසරේදී ලබා ඇත. කෙසේ වෙතත්, ක්‍රියාත්මක කරන ලද නව ක්‍රියාකාරකම් වන, සේවා ස්ථානයන් හි ඖෂධ පරීක්ෂාව, පුළුල් ලෙස දියත් කරන ලද විද්‍යාත්මක පුහුණු සේවාවන් සහ අනෙකුත් නව ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සමඟ 2021 වසර සඳහා භෞතික ප්‍රගතිය 68.08% දක්වා වැඩිවීමක් සිදුව ඇත.

## 10.7 පුරෝගාමී පාලන අධිකාරිය

ශ්‍රී ලංකාවේ මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේ දී භාවිතා කරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන ගිවිසුමක් වන 1988 මත්ද්‍රව්‍ය හා මනෝවිද්‍යාත්මක ද්‍රව්‍යවල නීති විරෝධී ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ විධිවිධාන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක අධිකාරිය ලෙස 2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතියේ 18 වැනි වගන්තියට අනුව පුරෝගාමී පාලන අධිකාරිය පිහිටුවා ඇත.

පුරෝගාමී රසායනිකයක් යනු වෙනත් සංයෝගයක් නිපදවන රසායනික ප්‍රතික්‍රියාවකට සහභාගි වන සංයෝගයකි. මත්ද්‍රව්‍ය පුරෝගාමී රසායනිකයක් යනු නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ මනෝවිද්‍යාත්මක ද්‍රව්‍ය සෑදීම සඳහා භාවිතා කළ හැකි ද්‍රව්‍යයකි. එබැවින් මෙම රසායනික ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම, භාවිතය නිරීක්ෂණය කිරීම සඳහා දැඩි යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

### 10.7.1 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූල වීම

ශ්‍රී ලංකාව 1988 මත්ද්‍රව්‍ය හා මනෝවිද්‍යාත්මක ද්‍රව්‍යවල නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට 1991 ජුනි 6 සිට පාර්ශ්වකරුවෙකු වී ඇත. පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධ විධිවිධාන සහ අවශ්‍යතා (නීති සම්පාදන සහ පාලන පියවර), සාමාන්‍ය අවශ්‍යතා 12වන වගන්තියේ 1වන ඡේදයේ පහත පරිදි සාරාංශ කර ඇත.

සම්මුතියේ මූලික අදහස වන්නේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා භාවිත කළ හැකි රසායනික ද්‍රව්‍ය ගණනාවක් නිත්‍යානුකූල අරමුණු සඳහා වෙළෙඳාමට ඉඩ දී වෙළෙඳාම නියාමනය කිරීම සහ නීති විරෝධී ඖෂධ නිෂ්පාදනය සඳහා යොමුවීම වැළැක්වීමයි. 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතිය මඟින් පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා නීතිමය පදනමක් ස්ථාපිත කරන අතර එවැනි ද්‍රව්‍ය අපසරණය වැළැක්වීම සඳහා සුදුසු පරිපාලන රාමුවක්, ක්‍රියාකාරී යාන්ත්‍රණයක් සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි පිහිටුවීමට ඉල්ලා සිටි.

1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 12වන වගන්තියට අනුව, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීමේ නිරත සියලුම පුද්ගලයින් සහ ව්‍යවසායන් නිරීක්ෂණය කළ යුතුය.

"මත්ද්‍රව්‍ය හෝ මනෝවිද්‍යාත්මක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන I සහ II වගුව හි ඇති ද්‍රව්‍ය වෙනත් දිශාවකට යොමු කිරීම වැළැක්වීමට පාර්ශවයන් සුදුසු යැයි සලකනු ලබන ක්‍රියාමාර්ග ගත යුතු අතර, මේ සඳහා එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය."

ඒ අනුව සහ ඉහත සඳහන් කරුණු අනුව පුද්ගලයින් සහ/හෝ ව්‍යවසායන් 1634ක් පුරෝගාමී පාලන අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති අතර, එම පරිශ්‍රවල පරීක්ෂණ පැවැත්විය යුතුය. එසේ ලියාපදිංචි නොකළ ව්‍යවසායන්/ පුද්ගලයන් දැනුවත් කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් පළ කිරීමට කටයුතු කර ඇත.

**10.7.1.1 මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියට අනුව පුරෝගාමී පාලන අධිකාරියේ කාර්යභාරය**

මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියේ 2.2 වගන්තියට අනුව, පුරෝගාමී පාලන අධිකාරිය හට ශ්‍රී ලංකාව තුළ ඵලදායී අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට බලය ඇත;

(අ) පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සඳහා සහතික සහ අවසර නිකුත් කිරීම සහ ගිවිසුම්වල සියලුම අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම සඳහා 1988 මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යවල නීතිවිරෝධී ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 12 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූලව පුරෝගාමී සහ අත්‍යවශ්‍ය රසායනික ද්‍රව්‍ය පිළිබඳ ජාතික පාලනයන් නියාමනය කිරීම හෝ බලාත්මක කිරීම.

(ආ) පාලනය යටතේ පවතින පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ආනයනය, අපනයනය, ගබඩා කිරීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් පවතින ක්‍රියා පටිපාටි, භාවිතයන්, රෙගුලාසි සහ නීති වරින් වර සමාලෝචනය කිරීම.

(ඇ) බලපත්‍ර අනුමත කරන බලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අනෙකුත් අදාළ ආයතන සමඟ එක්ව පාලනය යටතේ පවතින පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ජාවාරම් කිරීම, හරවා යැවීම සහ අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම ශක්තිමත් කිරීම.

සලකා බලන කාලසීමාව තුළ සේවක සංඛ්‍යාව වැඩි දියුණු කිරීම, 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ රෙගුලාසි සංශෝධනය කිරීම, තත්‍යකාලීන තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණයන් පිහිටුවීම, මාර්ගගතව හමුවීම් වෙන්කරවා ගැනීමේ විකල්පය වෙබ් අඩවිය හරහා අධිකාරිය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. පුරෝගාමී පාලන අධිකාරිය, බලපත්‍ර නිකුත් කිරීම, පරීක්ෂණ ක්‍රියා පටිපාටිය සහ රසායනික බැහැර කිරීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම.

**10.7.1.2 2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීම**

2008 අංක 01 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතියේ 19 වැනි වගන්තියට අනුව අධිකාරියට පහත රාජකාරි පැවරී ඇත.

අධිකාරියේ කාර්යය

(අ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන්, අදාළ කර්මාන්තවල අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන, නියම ලබන ආකාරයට වලංගු බලපත්‍රයක් අනුව එසේ සිදු කරන බවට;

(ආ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය කිරීමට අදාළ කටයුතු බලපත්‍රලාභියා විසින් කටයුතු කරන්නේ යම් පරිශ්‍රයක සිට ද, එම පරිශ්‍රය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යවන වන පියවර ගන්න බවට;

(ඇ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ඒවා ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවට;

(ඈ) පනතේ පළමුවන උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය භාවිතා කරමින් යම් මාදක ඖෂධයක් හෝ මනෝවර්තකයක් නීතිවිරෝධී ලෙස නිෂ්පාදනය කිරීම යථා පරිදි වාර්තා කරන බවටත්, එම වරදකරුවන්ට දඬුවම් පැමිණවීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගන්නා බවටත්;

(ඉ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යවලින් යම් ද්‍රව්‍යක් ආනයනය කරන හෝ අපනයනය කරන සෑම තැනැත්තෙක්ම, එම ද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම, භාවිතා කිරීම, නිෂ්පාදනය කිරීම සහ බෙදාහැරීම පෙන්නුම් කරන ත්‍රෛමාසික වාර වාර්තා අධිකාරියට ඉදිරිපත් කරන බවට;

(ඊ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යවලින් යම් ද්‍රව්‍යයකට අදාළව සියලු සැකකටයුතු ගනුදෙනු පිළිබඳ විස්තර, එවැනි ද්‍රව්‍ය කිසිවක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හා සම්බන්ධ තැනැත්තන් විසින් ප්‍රමාදයකින් තොරව අධිකාරියට දැනුම් දෙන බවට;

(උ) නියම කර ඇති කාරණා පිළිබඳ නිසි වාර්තා පවත්වා ගෙන යන බවත්, කටයුතු සහ වාර්තා නියම කරනු ලබන ආකාරයට නියාමනය කරන බවටත්, අධිකාරිය සහතික විය යුතුය.

**10.7.1.4 පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනයට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම**

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ නීති විරෝධී ජාවාරමට එරෙහි සම්මුතියේ 18වැනි වගන්තිය බලාත්මක කිරීම සඳහා 2010 අංක 1 දරන පුරෝගාමී පාලන අධිකාරි නියෝග රෙගුලාසි අනුව පුරෝගාමී පාලන අධිකාරිය 2010 මැයි 04 දින සිට ක්‍රියාත්මක විය.

තවද, නීතිවිරෝධී ලෙස මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පුරෝගාමී රසායන අපසරණය වැළැක්වීමට අදාළ අධිකාරියේ මෙහෙයුම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මසකට වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව එම කාලය තුළ රැස්වීම් තුනක් (03) පැවැත්විණි.

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යවල නීතිවිරෝධී වෙළඳාමට එරෙහි සම්මුතිවල 31 වැනි වගන්තිය ප්‍රකාරව පුරෝගාමී රසායනික ද්‍රව්‍ය සඳහා ගත යුතු පාලන ක්‍රියාමාර්ග 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නියාමන පියවර) රෙගුලාසි අංක 1හි දක්වා ඇත.

2008 සහ 1988 UN සම්මුතියේ අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය පනතේ 18වැනි වගන්තියට එරෙහිව බලාත්මක කිරීම සඳහා, 2010 අංක 1 දරන පුරෝගාමී පාලන අධිකාරියේ රෙගුලාසි සහ 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික (නියාමන පියවර) නියෝග පිහිටුවීම සංශෝධනය කිරීම සඳහා අධිකාරිය විසින් අනුමැතිය ලබා දෙන ලදි.

### 10.7.2 පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල නීත්‍යානුකූල අවශ්‍යතාවය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය නීති විරෝධී ඖෂධ නිෂ්පාදනයට අපසරණය වීම නිරීක්ෂණය කිරීම

ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ, පුරෝගාමී රසායනික මූලික වශයෙන් භාවිත කරනුයේ රසායනාගාර පර්යේෂණවල ප්‍රතික්‍රියාකාරක ඇතුළුව සුවඳ විලවුන්, තීන්ත, ඩයි වර්ග, ඖෂධ, ප්ලාස්ටික් වැනි දෛනික අවශ්‍යතා ඇතුළු පුළුල් පරාසයක නිෂ්පාදන නීත්‍යානුකූලව නිෂ්පාදනය කිරීම සඳහාය. බොහෝ කාර්මික යෙදුම් අතර ඇසිටෝන් සහ මෙතිල් එතිල් කීටෝන් මුද්‍රණ තීන්තවල ද්‍රාවක ලෙස බහුලව භාවිතා වන අතර ඒවා බොහෝ නිෂ්පාදන කර්මාන්තවල දින සංකේතනය සඳහා භාවිතා කරයි. සල්ෆියුරික් අම්ලය ප්‍රධාන වශයෙන් බැටරි අම්ල නිෂ්පාදනය සඳහා භාවිතා වේ. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය සහ සල්ෆියුරික් අම්ලය පී.එච්. අගය සකස් කිරීම සඳහා කර්මාන්තවල අපජල පිරිපහදු කිරීම සඳහා බහුලව භාවිතා වන අතර පිහිනුම් තටාක නඩත්තු කිරීමේදී ද භාවිතා වේ. ඇසිටෝන්, ටොලුයින් සහ මෙතිල් එතිල් කීටෝන් බොහෝ දුරට තීන්ත කර්මාන්තයේ ද්‍රාවක ලෙස භාවිතා කරනුයේ දැව ආලේපන වැනි තුනී සහ ද්‍රාවක පදනම් වූ තීන්ත නිෂ්පාදන ක්‍රියාවලීන්හි ය. ටොලුයින් මැලියම් නිෂ්පාදනය සඳහා ද්‍රාවකයක් ලෙසද භාවිතා කරයි. එතිල් ඊතර් කුළුබඩු නිස්සාරණය සඳහා භාවිතා කරයි. පිපරනැල් අයිස්ක්‍රීම් සහ රසකාරක නිෂ්පාදනය වැනි රස නිෂ්පාදන කර්මාන්තවල භාවිතා වේ. පොටැසියම් පර්මැන්ගනේට් ධූමකරණය සඳහා ගොවිපලවල භාවිතා වේ. ඖෂධීය ඖෂධ කිහිපයක නිෂ්පාදනය සඳහා ඇන්ත්‍රනිලික් අම්ලය, ෆීනයිල් ඇසිටික් අම්ලය, පිපරඩීන්, ඇසිටික් ඇන්හයිඩ්‍රයිඩ්, එන්. ඇසිටිලැන්ත්‍රලිනික් අම්ලය, එපිහිඩ්‍රින්, අර්ගොමෙට්‍රින, නොර් එප්ඩ්‍රින්, 1-ෆීනයිල් -2-ප්‍රොපනොන සහ ප්සියුඩෝඑපිහිඩ්‍රින් භාවිතා වේ. උදාහරණයක් ලෙස, එපිහිඩ්‍රින් සහ ප්සියුඩෝඑපිහිඩ්‍රින ස්වාස නාල විස්තාරණය, නාසික ඉහිල්කිරීම් නිෂ්පාදනය සඳහා භාවිතා වේ. නොර්එප්ඩ්‍රින් නාසික ඉහිල්කිරීම් නිෂ්පාදනය සඳහා භාවිතා කරයි. ඉරුවාරදය සඳහා ප්‍රතිකාර කිරීම සඳහා අර්ගොමෙට්‍රින සහ අර්ගොට් ඇමින් නියම කර ඇත. සැෆ්රෝල් සහ අයිසෝ සැෆ්රෝල් සුවඳ විලවුන්, පයිප්පෙරෝනල් සහ සබන් නිෂ්පාදනය සඳහා යොදා ගනී. කාබනික සංයෝග සංස්ලේෂණය සඳහා ලයිසර්ජික් අම්ලය භාවිතා කරයි.

#### 10.7.2.1 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයන හා අපනයන අධීක්ෂණය

ශ්‍රී ලංකාවේ බලාත්මක අධිකාරිය ලෙස, පුරෝගාමී පාලන අධිකාරිය විසින් මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම සඳහා ඉතා වැදගත් වන නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනයට මෙම රසායනික ද්‍රව්‍ය යොමු කිරීම වැළැක්වීමේ අරමුණින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ බෙදාහැරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමේ අරමුණින් පහත සඳහන් කාර්යයන් ඉටු කරයි.

- **බලපත්‍ර නිකුත් කිරීම**

පුරෝගාමී පාලන අධිකාරිය විසින් 2008 අංක 1 දරන පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයින් සඳහා බලපත්‍ර නිකුත් කර ඇති අතර 2021 වර්ෂය තුළ බලපත්‍ර 107ක් නිකුත් කර ඇත.

- **පරිශ්‍ර ලියාපදිංචි කිරීම**

පුරෝගාමී පාලන අධිකාරිය විසින් 2008 අංක 1 දරන පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයින් ගේ, එම කටයුතු වලට අදාළ පරිශ්‍රය ලියාපදිංචි කල යුතු අතර, එවැනි පරිශ්‍ර ලියාපදිංචි කිරීම් 6ක් 2021 වර්ෂය තුළ සිදු කර ඇත.

- **අධීක්ෂණය සහ පරීක්ෂණය**

බලපත්‍රලාභියාගේ ලියාපදිංචි පරිශ්‍රය වරින් වර අධීක්ෂණය කළ යුතු අතර, පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය භාවිතා කරමින් සිදුකරන ක්‍රියාකාරකම්, පුරෝගාමී පාලන අධිකාරිය මඟින් අධීක්ෂණය කළ යුතු අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාල සීමාව තුළ සිදු කරන ලද පරිශ්‍ර පරීක්ෂා කිරීම් සංඛ්‍යාව දහනවයකට (19) සීමා විය.

**පරිශ්‍ර පරීක්ෂාවන් අතරතුර**











### 10.7.2.2 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ගනුදෙනු කිරීම සහ අවසන් භාවිතය නිරීක්ෂණය කිරීම

පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ නිශ්චිතව දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදහස් කරන සෑම පුද්ගලයෙක්ම හෝ පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති යම් ද්‍රව්‍යයක් භාවිතා කිරීමට අදහස් කරන පුද්ගලයන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතුය. අධිකාරිය, අදාළ ගාස්තුව සමඟ, අයදුම්පත ලැබීමෙන් පසු අයදුම්පතෙහි සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය සහ අලෙවි නියෝජිතයා හෝ අවසාන පරිශීලකයා විසින් ක්‍රියාකාරකම් සිදු කරන ආකාරය තහවුරු කර වසරක කාලයක් සඳහා සහතිකයක් හෝ ලියාපදිංචියක් නිකුත් කරනු ලැබේ. ඒ අනුව පුරෝගාමී රසායනික ද්‍රව්‍ය සඳහා ලියාපදිංචි කර ඇති අයදුම්පත් 671ක් සඳහා බලපත්‍ර/ ලියාපදිංචි සහතික 648ක් නිකුත් කර ඇත.

වගුව 1 : 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ ලියාපදිංචි කර ඇති අයදුම්පත් සහ බලපත්‍ර පිළිබඳ විස්තර

| | ක්ෂේත්‍රය | බලපත්‍ර/ ලියාපදිංචි සහතික වර්ගය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | අවසන් භාවිතා කරන්නන් | වෙළෙන්දන් | ආනයනකරුවන් | අපනයනකරුවන් | පරිශ්‍ර | එකතුව |
| **වසර 2021 (2021.12.31 දිනට)** | ලියාපදිංචි අයදුම්පත් සංඛ්‍යාව | 487 | 70 | 108 | 00 | 06 | 671 |
| | නිකුත් කළ බලපත්‍ර/ ලියාපදිංචි සහතික සංඛ්‍යාව | 463 | 72 | 107 | 00 | 06 | 648 |
| | පරිශ්‍ර පරීක්ෂා කිරීම | | | | | | 19 |




*රූපය 1: 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා ලියාපදිංචි වූ අයදුම්පත් සංඛ්‍යාව පිළිබඳ විස්තර*




රූපය 2 : 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ විස්තර




*රූපය 3 : 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා ලියාපදිංචි කර ඇති අයදුම්පත් සංඛ්‍යාව සහ බලපත්‍ර සංසන්දනය කිරීම*

වගුව 2 : 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුල සිදු කරන ලද පරිශ්‍ර පරීක්ෂා කිරීම් පිළිබඳ විස්තර

| **මාසය** | **2021** | |
|---|---|---|
| | **පරික්ෂා කිරීම්** | **අවලංගු කල බලපත්‍ර** |
| ජනවාරි | 06 | 00 |
| පෙබරවාරි | 02 | 00 |
| මාර්තු | 03 | 00 |
| අප්‍රේල් | 00 | 00 |
| මැයි | 00 | 00 |
| ජුනි | 00 | 00 |
| ජූලි | 00 | 00 |
| අගෝස්තු | 00 | 00 |
| සැප්තැම්බර් | 00 | 00 |
| ඔක්තෝබර් | 00 | 00 |
| නොවැම්බර් | 02 | 00 |
| දෙසැම්බර් | 06 | 00 |
| **එකතුව** | **19** | **00** |




රූප සටහන 4 : 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ සිදු කරන ලද පරීක්ෂා කිරීම් පිළිබඳ විස්තර

පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය සඳහා නිකුත් කර ඇති බලපත්‍ර, ඒවායේ සංශෝධන සහ අලුත් කිරීම් සඳහා ගාස්තු අය කරනු ලබන්නේ රු. 5,000/-, රු. 2,000/- සහ රු. 4,500/- වශයෙනි. පරිශ්‍රය ලියාපදිංචි කිරීම සඳහා රුපියල් 5,000/-ක් අය කරනු ලබන අතර අලෙවි නියෝජිතයන් ලියාපදිංචි කිරීම, ඔවුන්ගේ සංශෝධන සහ අලුත් කිරීම් සඳහා රු. 4,000/-, රු. 1,500/- සහ රු. 3,500/- පිළිවෙලින් අයකරනු ලැබේ. අවසාන පරිශීලකයින් සඳහා ලියාපදිංචි සහතිකය ලියාපදිංචි කිරීම, සංශෝධනය කිරීම සහ අලුත් කිරීම සඳහා පිළිවෙලින් රු. 1,500/-, රු. 500/- සහ රු 1,000/- අය කෙරේ. 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමෙන් පුරෝගාමී පාලන අධිකාරියේ ආදායම ලෙස රු. 1,130,800ක් උපයා ගන්නා ලදි. අවසාන පරිශීලකයින් ලියාපදිංචි කිරීම සඳහා අය කරන ලද ගාස්තු සහ විස්තර 03 වගුවේ දක්වා ඇත.

වගුව 03 : විවිධ බලපත්‍ර කාණ්ඩ යටතේ 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ පුරෝගාමී පාලන අධිකාරිය විසින් ජනනය කරන ලද ආදායම

| මාසය | අවසන් භාවිතා කරන්නන් රු. | වෙළෙන්දන් රු. | ආනයනකරුවන් රු. | පරිශ්‍ර රු. | අපනයනකරුවන් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 75,350.00 | 47,300.00 | 65,450.00 | 00.00 | 00.00 | 188,100.00 |
| පෙබරවාරි | 84,150.00 | 15,400.00 | 62,150.00 | 5,500.00 | 00.00 | 167,200.00 |
| මාර්තු | 73,150.00 | 27,500.00 | 45,100.00 | 5,500.00 | 00.00 | 151,250.00 |
| අප්‍රේල් | 34,100.00 | 5,500.00 | 9,350.00 | 11,000.00 | 00.00 | 59,950.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මැයි | 7,700.00 | 3,850.00 | 17,050.00 | 00.00 | 00.00 | 28,600.00 |
| ජූනි | 23,100.00 | 11,550.00 | 31,350.00 | 00.00 | 00.00 | 66,000.00 |
| ජූලි | 57,200.00 | 35,200.00 | 59,950.00 | 00.00 | 00.00 | 152,350.00 |
| අගෝස්තු | 20,900.00 | 23,650.00 | 14,850.00 | 5,500.00 | 00.00 | 64,900.00 |
| සැප්තැම්බර් | 6,600.00 | 8,250.00 | 24,200.00 | 00.00 | 00.00 | 39,050.00 |
| ඔක්තෝබර් | 70,400.00 | 42,350.00 | 95,150.00 | 5,500.00 | 00.00 | 213,400.00 |
| නොවැම්බර් | 7,9750.00 | 31,350.00 | 32,450.00 | 00.00 | 00.00 | 143,550.00 |
| දෙසැම්බර් | 47,850.00 | 19,800.00 | 26,950.00 | 00.00 | 00.00 | 94,600.00 |
| එකතුව | **580,250.00** | **271,700.00** | **484,000.00** | **33,000.00** | **00.00** | **1,130,800.00** |

රූපය 5 : 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ මාසික ආදායමේ විචලනය පිළිබඳ විස්තර



රූපය 6 : 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ යටතේ මාසික ආදායමේ විචලනය




රූපය 7 : 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර/ ලියාපදිංචි සහතික යටතේ වාර්ෂික ආදායම



### 10.7.3 පුරෝගාමී පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු සමාලෝචනය

ආරම්භයේ සිට වසර එකොළහක් (11) ගාස්තු සංශෝධන කර නොතිබීම, පවතින ගාස්තු අයකිරීමේ ක්‍රමය තුළ පවතින නොගැලපීම්, ආනයනකරුවන්, අපනයනකරුවන්, අලෙවිකරුවන් සහ අවසාන පරිශීලකයින් යන සියලුම කාණ්ඩවලට සමාන ගාස්තු පැනවීම යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව අදාළ අරමුණ කුමක් වුව ද තොග විකුණුම් මට්ටම, සිල්ලර මට්ටම, කුඩා පරිමාණ සහ මහා පරිමාණ අවසන් භාවිතය හෝ ආනයනය සහ අපනයනය යන කරුණු සැලකිල්ලට නොගෙන ප්‍රමාණය, පරීක්ෂණ වියදම්, තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා කරන පරීක්ෂා කිරීම්, එහි ඇති රසායනික ද්‍රව්‍ය සත්‍යාපනය කිරීම සඳහා පවත්වනු ලබන නියැදි විශ්ලේෂණ පිරිවැය, දැනට පවතින ගාස්තු ක්‍රමය මගින් අධිකාරියේ පිරිවැය සම්පූර්ණයෙන් අයකර නොගන්නා බව හඳුනාගෙන ඇත. එබැවින්, අත්‍යාවශ්‍ය කර්තව්‍යයක් ලෙෂ තාක්ෂණික සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාළ අධිකාරියේ වියදම් සම්පූර්ණයෙන් අයකරගැනීම සහතික කිරීම සඳහා, රසායනික විශ්ලේෂණය සහ විෂමතා මඟහරවා ගැනීමේ අරමුණ ඇතිව පුරෝගාමී පාලන අධිකාරියේ බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා සංශෝධිත ගාස්තු 2010 අංක 01 දරන පුරෝගාමී රසායන ද්‍රව්‍ය (නියාමන පියවර) නියෝග සංශෝධන සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි.

### 10.7.4 පාරිභෝගිකයා සම්බන්ධ තොරතුරු බෙදාගැනීම සහ ඒ සම්බන්ධ අභියෝග ජය ගැනීම සඳහා "සුහුරු පුරෝගාමී පාලන ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම

2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිවල 19 වැනි වගන්තිය ප්‍රකාරව පාරිභෝගිකයා සම්බන්ධ ගැටලු විසඳීමට සහ පුරෝගාමී පාලන අධිකාරියේ සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කඩිනම් කිරීම සහතික කිරීම සඳහා අධිකාරිය පහත සඳහන් කාර්යයන් ආරම්භ කරන ලදි.

අ. පුරෝගාමී පාලන අධිකාරියේ වෙබ් අඩවිය හරහා මාර්ගගත හමුවීම් වෙන්කරවා ගැනීම, මාර්ගගත බලපත්‍ර තත්ත්ව පරීක්ෂාව, බලපත්‍ර හිමියන්ගේ ලැයිස්තුව සමග වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, බලපත්‍ර අවලංගු කාලසීමාව, පරීක්ෂණ දැනුම්දීම්, මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා විකල්ප සහ නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සඳහා ප්‍රවේශය ඇතුළු තත් කාලීන තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම, තොරතුරු සත්‍යාපනය කිරීම, ඉල්ලුම්පත්‍ර භාරදීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ පාරිභෝගිකයන් සඳහා තොරතුරු සැපයීම, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය සහ තොරතුරු ගබඩා කිරීමේ පද්ධතියක් හරහා අනෙකුත් තොරතුරු ලබාදීම.

ආ. බලපත්‍ර හෝ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී අධිකාරිය විසින් තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ආනයනකරු, අපනයනකරු, පරිශ්‍ර, අලෙවිකරු සහ අවසාන පරිශීලකයා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ ඉදිරිපත් කරන ලද පිරික්සුම් ලැයිස්තු පුරෝගාමී රසායන ද්‍රව්‍ය දේශීය නිෂ්පාදනය, වෙළඳාම, බෙදාහැරීම සහ අවසන් භාවිතය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා අයදුම්පත් සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදි.

**10.7.5 පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අපසරණය වැළැක්වීමේ ඵලදායී යාන්ත්‍රණයක් සඳහා ජාතික ආයතන අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම**

**10.7.5.1 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ ප්‍රතිනැව්ගත කිරීම අධීක්ෂණය කිරීම සහ පාලනය සඳහා ශ්‍රී ලංකා රේගුව සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණ සහ සහයෝගීතා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම**

**10.7.5.1.1 ශ්‍රී ලංකා රේගුව සම සම්බන්ධීකරණයෙන් පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම, සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම සඳහා රැස්වීමක් සංවිධානය කරන ලද අතර අධීක්ෂණ යාන්ත්‍රණය කඩිනම් කිරීමට පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.**

අ. පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අසිකුඩා පද්ධතිය උපයෝගී කර ගැනීම, අධිකාරිය විසින් අදාළ සියලුම පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල එච්.එස්. කේතයන් ඉදිරිපත් කිරීමත් සමඟ වාර්තා සහ අවදානම් තක්සේරු කිරීමේ වාර්තා පිළියෙළ කිරීම.

ආ. අදාළ නැව්ගතකිරීම් නිෂ්කාශනයට අවසර ලබා දීම සඳහා පුරෝගාමී පාලන අධිකාරිය සමඟ සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම, පුරෝගාමී රසායනික ද්‍රව්‍යවලට අදාළ නැව්ගත කිරීම් තත්කාලීන පදනමින් නිෂ්කාශනය කිරීම සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම සහ පුරෝගාමී පාලන අධිකාරියේ පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දින 7 පැය 24 පුරා සේවා සැපයීම සහතික කිරීම, ප්‍රමාදයන් මගහරවා ගැනීම සඳහා පුරෝගාමී පාලන අධිකාරිය අවසරය ඉදිරිපත් කිරීම.

ඇ. තත්කාලීන පදනමින් පුරෝගාමී පාලන අධිකාරිය සමඟ ඵලදායී සන්නිවේදනය සහ සම්බන්ධීකරණය සඳහා ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකයේ රේගු අධිකාරීවරයා නම් කිරීම.

ඈ. ඒපිහිඩ්රින් වැනි ඖෂධ ලෙස ආනයනය කරනු ලබන විවිධ එස්. එච් කේත යටතේ සකස් කරන ලද පුරෝගාමී රසායනික අඩංගු පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය කිරීමේදී අධිකාරිය මුහුණ දෙන අභියෝග ජය ගැනීමට ක්‍රියා කිරීම. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය, ඒපිහිඩ්රින් සල්පේට්, නොර්ඒපිහිඩ්රින්, සියුඩෝ ඒපිහිඩ්රින්, අර්ගොමෙට්‍රින සහ අර්ගොට් ඇමින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතියට යටත්ව, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා අපසරණය වීම මෙන්ම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ අවදානම හේතුවෙන් මෙතිලිතයිල්කීටෝන් අඩංගු තීන්ත මිශ්‍රණ සහ නයිට්‍රික් අම්ලය, පාලිත රසායනික ද්‍රව්‍ය ලැයිස්තුවට ඇතුළත් කිරීමට යෝජිත වේ.

**10.7.5.2 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ පුරෝගාමී පාලන අධිකාරියේ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග**

අ. එන්.සී.එච්. ඉන්දීය පෞද්ගලික සමාගම වෙතින් සියැට් කැලණි රේඩියල්ස් සමාගම වෙත අවසර ලත් ප්‍රමාණය තුළ හයිඩ්‍රොක්ලෝරයිඩ් ආනයනය කිරීමට විරෝධතා නොමැති බවට ලිපියක් නිකුත් කිරීම.

**10.7.5.3 සෞඛ්‍ය අමාත්‍යාංශය, අදාළ බලධාරීන් සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම**

අ. එපිහිඩ්රින් සඳහා විශේෂ සඳහනක් සහිත පූර්වගාමී රසායනික ද්‍රව්‍ය අඩංගු ඖෂධ නිෂ්පාදන අපසරණය වැළැක්වීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

**10.7.5.4 මධ්‍යම පරිසර අධිකාරිය සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණ සහ සහයෝගීතා යාන්ත්‍රණ ශක්තිමත් කිරීම.**

අ. පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත්කිරීමේ තත්ත්වයන් සහ 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නියාමන පියවර) නියෝග 20වැනි වගන්තියේ අවශ්‍යතාවක් ලෙස නිර්දේශ නිකුත් කිරීමේ තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සබැඳි සම්බන්ධතාවයක් ඇති කිරීමට මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

**10.7.6 පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම**

මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම සඳහා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපසරණය වීම, පුළුල් වෙමින් විවිධාංගීකරණය වෙමින් පවතින නව කෘත්‍රිම ඖෂධ සහ ඖෂධ වෙළඳපොළේ ව්‍යාප්තිය සම්බන්ධ අඛණ්ඩ සහ මතුවෙමින් පවතින අභියෝග සලකා බැලීමේදී ද්විපාර්ශ්වික ශක්තිමත් කිරීම ඉතා වැදගත් වේ. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පිළිබඳ කාර්යාලය, මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම, අනෙකුත් ජාත්‍යන්තර ආයතන සහ සාමාජික රටවල නිසි ජාතික අධිකාරීන් හරහා කලාපීය, ජාත්‍යන්තර සම්බන්ධීකරණ සහ සහයෝගිතා යාන්ත්‍රණ ක්‍රියාත්මක කෙරේ.

එබැවින් ද්විපාර්ශවික කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවයේ පුරෝගාමී රසායනික පාලන පියවර වැඩිදියුණු කිරීම සහ වාර්තා කිරීම, පූර්ව අනතුරු ඇඟවීම් සහ තොරතුරු හුවමාරු පද්ධති සඳහා ජාතික, කලාපීය සහ ජාත්‍යන්තරව ස්ථාපිත වේදිකා භාවිතය ශක්තිමත් කිරීම, බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම, උගත් පාඩම් සහ හොඳම පරිචයන්, තාක්ෂණික සහයෝගීතාව, මූල්‍ය සහ තාක්ෂණික ආධාර වැඩසටහන්, ඒකාබද්ධ විමර්ශන යානාදිය ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පහත සඳහන් කරුණු ඇතුළත් අධිකාරියේ රැස්වීම සඳහා ඉදිරිපත් කර ඇත.

1. ශ්‍රී ලාංකීය සන්දර්භයට අදාළ වන පරිදි ජාත්‍යන්තර ගිවිසුම් සමඟ සමපාත වන පරිදි පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පිළිබඳ ජාතික ව්‍යවස්ථාදායක රාමුවේ ක්‍රියාකාරිත්වයට අනුකූල වීම සහතික කිරීම.

අ. ජාත්‍යන්තර සම්මුතීන් තුනක් සාක් සම්මුතිය සහ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB), මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම (CND) විසින් නිකුත් කරන ලද සියලුම යෝජනා ඒකාබද්ධ කිරීම. පුරෝගාමී පාලනය සම්බන්ධයෙන් අහිතකර ප්‍රතිවිපාක ආමන්ත්‍රණය කරමින් මත්ද්‍රව්‍ය ගැටලුවට එරෙහිව සටන් කිරීම සඳහා 2008 අංක 01 දරන පනත සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

2. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව යාවත්කාලීන, ප්‍රමිතිගත, විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් තාක්ෂණික ක්‍රියා පටිපාටි යෙදෙන බවට සහතික වීම.

අ. එබැවින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් INCB සහ UNODC විසින් නිකුත් කරන ලද සියලුම අත්පොත්/ මාර්ගෝපදේශ එකතු කර ඇති අතර අදාළ පරිදි අභ්‍යන්තර ක්‍රියා පටිපාටි නැවත පන ගන්වමින් පවතී.

ආ. පුරෝගාමී පාලන අධිකාරියෙහි විද්‍යාත්මක නිලධාරීන් විසින් 2021 මාර්තු 16 සිට 2021 මාර්තු 23 දක්වා වීඩියෝ සම්මන්ත්‍රණ ආකෘතියෙන් "මත්ද්‍රව්‍ය සඳහා ඇස්තමේන්තු පද්ධතිය, මනෝවිද්‍යාත්මක උපද්‍රව්‍ය සඳහා තක්සේරු පද්ධතිය සහ ඇම්ෆෙටමින්-වර්ග උත්තේජකවල පූර්වගාමීන් ආනයනය සඳහා වාර්ෂික නීත්‍යානුකූල අවශ්‍යතාවය සඳහා ඇස්තමේන්තුව" යන මාතෘකා යටතේ INCB කාර්යාලයේ ප්‍රවීණයන් විසින් පිරිනමනු ලබන අතථ්‍ය පුහුණු සැසි සාර්ථකව නිම කරන ලදි.

3. නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් සහ අපයෝජන (ප්‍රාදේශීය සහ ගෝලීය) ප්‍රවණතා රටා නිරීක්ෂණය කිරීම සඳහා තොරතුරු රැස් කිරීම සහතික කිරීම.

පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල සැක කටයුතු ගණුදෙනු හඳුනා ගැනීම සඳහා ශක්තිමත් හවුල්කාරීත්වයක් සහතික කිරීම පිණිස, පුරෝගාමී පාලන අධිකාරිය තාක්ෂණික සහාය සඳහා කලාපීය සහ ජාත්‍යන්තර නියෝජිතායතනවල හවුල්කාරීත්ව වැඩසටහන් සක්‍රීයව පවත්වාගෙන යනු ලැබේ. එවැනි එක් වේදිකාවක් වන්නේ මාර්ගගත පූර්ව දැනුම් දීම් පද්ධතියයි. එය 1988 එක්සත් ජාතීන් (UN) ගේ සම්මුතියේ 12වැනි වගන්තියට අනුව අපනයනය කරන රටවලට පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පිළිබඳ විද්‍යුත් වශයෙන් දැනුම්දීමට ඉඩ සලසන මාර්ගගත වේදිකාවකි. එමනිසා 2021 වර්ෂය තුළ දැනුම්දීම් 197ක් ලැබී සමාලෝචනය කර ඇති අතර තොරතුරු සත්‍යාපනය කිරීමේදී හඳුනාගත් විෂමතා හේතුවෙන් නැව්ගත කිරීම් 10ක් ආනයනය කිරීමට ප්‍රතික්ෂේප කර ඇත.

| මාසය | පු. අ. වා . සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 25 |
| පෙබරවාරි | 12 |
| මාර්තු | 13 |
| අප්‍රේල් | 17 |
| මැයි | 19 |
| ජූනි | 17 |
| ජූලි | 22 |
| අගෝස්තු | 12 |
| සැප්තැම්බර් | 15 |
| ඔක්තෝම්බර් | 12 |
| නොවැම්බර් | 21 |
| දෙසැම්බර් | 12 |
| **එකතුව** | **197** |



| | පු. අ. වා සංඛ්‍යාව |
|---|---|
| ප්‍රතික්ෂේප වූ | 10 |
| ප්‍රතික්ෂේප නොවූ | 187 |




1. පුරෝගාමී පාලන අධිකාරිය, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නීත්‍යානුකූල සහ නීති විරෝධී භාවිතයෙන්) සම්බන්ධයෙන් තොරතුරු ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ හුවමාරු කිරීමේ නිසි ජාතික අධිකාරිය වේ. පුරෝගාමී පාලන අධිකාරිය, ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය, අනෙකුත් ජාත්‍යන්තර නියෝජිතායතන සහ වෙනත් රටවල නිසි ජාතික අධිකාරීන් සමඟ වාර්ෂික අවශ්‍යතාවය සහ මෙම රසායනික ද්‍රව්‍ය (නීත්‍යානුකූල සහ නීති විරෝධී භාවිතයෙන්) භාවිතය පිළිබඳ තොරතුරු හුවමාරු කරගෙන ඇත.

2. මීට අමතරව, ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව රට තුළ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව වඩාත් දැනුවත් කිරීම සහ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අධික ප්‍රමාණවලින් ගබඩා වීම වළක්වා ගනිමින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා වීම වැළැක්වීම පිළිබඳව කර්මාන්ත දැනුවත් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනී.

3. ආනයනය කරන රටවලට පූර්ව අපනයන දැනුම්දීම් (PEN) සැපයීමට අමතරව කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර මට්ටමින් පහත සඳහන් කාර්යන් සිදු කරනු ලැබේ.

අ. පූර්ව අපනයන දැනුම්දීම් සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම සහ පරීක්ෂණ සඳහා සහය වීම

ආ. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB) සහ වෙනත් රටවල නිසි බලධාරීන් සමඟ තත්කාලීන තොරතුරු හුවමාරුව

ඇ. පෝරම සහ වාර්තා ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය වෙත යොමු කිරීම (උදාඃ- පෝරමය D)

**10.7.7 ඖෂධ පිළිබඳ නීති බලාත්මක කිරීම සහ අනෙකුත් ආයතන සඳහා තාක්ෂණික සහය ලබා දීම**

2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ 19 වෙනි වගන්තියට අනුව I වගුවේ සහ II වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය භාවිතයෙන් යම් කිසි මත්ද්‍රව්‍ය හෝ මනෝවර්තක ද්‍රව්‍යයක් නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම අධිකාරිය විසින් සහතික කල යුතුය. පනතේ පළමු උපලේඛනයේ II නිසි ලෙස වාර්තා කර වැරදිකරුවන්ට දඬුවම් කිරීමට

සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. එවැනි පුරෝගාමී පාලන අධිකාරියෙ නිලධාරීන් සැක කටයුතු ගණුදෙනු හඳුනා ගැනීමේදී මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට සහය වේ.

ඒ අනුව එම කාල සීමාව තුළ පහත විමර්ශන සිදු කර ඇත.

අ. විද්‍යාත්මක නිලධාරින් විසින් ශ්‍රී ලංකා රේගුවේ ටොලුයින් තොග පිළිබඳව විශේෂ පරීක්ෂණයක් පවත්වන ලදි. එස්.කේ.එස් අපනයන පෞද්ගලික සමාගම විසින් නැව්ගත කරන ලද තිනර්/ ඇසිටෝන් තායිලන්තයේ සිට වික්ටර් අලයන්ස් පෞද්ගලික සමාගම, 51, මාලිගාව පාර, රත්මලාන, ශ්‍රී ලංකාව. රේගු නඩුව, අංකය CIB/2021/CCR/0413 නිරීක්ෂණ චාරිකාව අතරතුර, එහි ඇති පුරෝගාමී රසායනික ද්‍රව්‍ය සනාථ කිරීම සඳහා වැඩිදුර විශ්ලේෂණය සඳහා සැක සහිත බැරල්වලින් සාම්පල ලබා ගන්නා ලදි.

ආ. සිදු කරන ලද විමර්ශනය මත පදනම්ව කොළඹ මධ්‍යම කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමකට අදාලව තාක්ෂණික සහය සමඟ පුරෝගාමී රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සහ අධීක්ෂණය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම.



ඇ. මධ්‍යම පරිසර අධිකාරියේ ඉල්ලීමක් මත කැගල්ල ඉසඩ්.ඒ.එම්. හරූන් මහතාගේ පරිශ්‍රයේ පුරෝගාමී පාලන අධිකාරිය විසින් පරිශ්‍ර පරික්ෂාවක් සිදු කරන ලද අතර එම පරිශ්‍රය 2008 අංක 01 දරන පනතේ අවශ්‍යතා සහ එහි යටතේ ඇති රෙගුලාසි සම්පූර්ණ කර ඇත.

පරිශ්‍ර පරික්ෂාවන්වලදී නිලධාරීන් ඔවුන්ගේ විශේෂ අවධානය යොමු කරන්නේ මාර්ගෝපදේශ සපුරා ඇත්දැයි පරික්ෂා කර බැලීමට සහ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ආනයනය කරන්නන් විසින් පවත්වාගෙන යනු ලබන පරිශ්‍රයන්හි පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපසරණය වැළැක්වීම සඳහා සුදුසු ආරක්ෂක පියවරයන් අනුගමනය කරන්නේද යන්න පරික්ෂා කරනු ලැබේ.

### 10.7.8 එපිහිඩ්රින් අඩංගු ඖෂධ අපසරණය වැළැක්වීම

2019 සිට 2020 දක්වා කාලය තුළ අක්බාර් පාමසූටිකල් ආයතනය විසින් ගණුදෙනු කරන ලද එපිහිඩ්රින් අපසරණයවීමේ හැකියාව පුරෝගාමී පාලන අධිකාරියේ නිලධාරින් විසින් විමර්ශනය කරන ලද්දේ වසර 2018 සිට 2019 දක්වා අත්අඩංගුවට ගන්නා ලද මෙතම්පිටමින්/ මෙතම්පිටමින් ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව සහ මෙතම්පිටමින් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වීම

සැලකිල්ලට ගනිමිනි. ශ්‍රී ලංකා රේගු, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය සැපයුම් අංශය සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමඟ සම්බන්ධීකරණයෙන් එම ලියාපදිංචි නොකල අලෙවිකරුවන්ගේ/ අවසන් පරිශීලකයන්ගේ විකුණුම් තොරතුරු හඳුනාගෙන ඒවා නිරීක්ෂණය කිරීම සඳහා විමර්ශනයක් සිදු කිරීමට නිර්දේශ කරන ලදි.

**10.7.9 දත්ත කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම**

ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිතා කරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අපසරණය වීම වැළැක්වීම සඳහා පුරෝගාමී රසායනික පාලන ක්ෂේත්‍රයේ වැදගත් වන දත්ත කළමනාකරණ පද්ධතියක් මෙම කාලය තුළ නිර්මාණය කර ඇත.

මෙම දත්ත සමුදාය 2008 අංක 1 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ I වගුවේ සහ II වගුවේ ලැයිස්තුගත කර ඇති පුරෝගාමී රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන, භාවිතා කරන, ආනයනය කරන සහ අපනයන කරන සමාගම් ලැයිස්තුවකින් සමන්විත වේ. පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයන් නිෂ්පාදනය, ගණුදෙනු කිරීම, භාවිතය, ආනයනය, අපනයනය සහ ඒවායේ ප්‍රමාණයන් සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය ද දත්ත පදනමට ඇතුලත් කර නිතිපතා යාවත්කාලීන වේ.

සංවර්ධනය කරන ලද දත්ත කළමනාකරණය ප්‍රවණතාව අධ්‍යයනය කිරීමේ දී අරමුණු සහගත විශ්ලේෂණයක් සඳහා භාවිතා කළ හැකි දත්ත සම්පාදනය කිරීමට සහ අවශ්‍ය ස්ථානවල නීතියෙන් ගැලවීමේ මාර්ග වසාලීමට උපකාරී වන අතර මෙම දත්ත කළමනාකරණයේ ප්‍රධාන උපයෝගීතා පහත දැක්වේ.

- ආනයන/ අපනයන/ භාවිතා කිරීමේ රටා වෙනස් වන අවස්ථාවක දී ගැටළු නිරාකරණය කිරීම
- ලියාපදිංචිය/ බලපත්‍ර ලබා ගැනීමේ විෂය පථය යටතේ සිටින ක්ෂේත්‍රයේ කොටස්කරුවන් හඳුනා ගැනීම
- එක් එක් රසායනික ද්‍රව්‍යවල අවශ්‍යතා තක්සේරු කිරීම
- මෙම රසායනික ද්‍රව්‍යවල නීත්‍යානුකූල වෙළඳාම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම

තවද, කොළඹ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කරන ලද ක්‍රමවේදයක් මෙම කාලසීමාව තුල සමාලෝචනය කර සම්පූර්ණ කර ඇති අතර, එය නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම යන පැහැදිලි පියවර හයක් අනුගමනය කරමින් සම්පූර්ණ බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය ප්‍රවාහය ඇතුළු පුරෝගාමී පාලන අධිකාරියේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයව ස්ථාපිත කිරීම. බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ මෙම පියවරයන් නවීකරණය කිරීමට යෝජනා කර ඇත.

1. අයදුම්පත් ඉදිරිපත් කිරීම
2. අයදුම්පත් සැකසීම
3. අයදුම්පතට අදාළ කාර්ය ප්‍රවාහය සහ තත්ත්ව
4. බලපත්‍ර අයදුම්පත් සඳහා ගෙවීම් ක්‍රම
5. වාර්තා කිරීම
6. අවසරය ලබාදීම

පද්ධති අධ්‍යයනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායනයට (ICTA) ඉදිරිපත් කර ඇති අතර එහි උපදේශනය යටතේ පිහිටුවීම ආරම්භ කෙරේ. පද්ධති අධ්‍යයනය රේබීය අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් විසින් සමාලෝචනය කෙරේ.

**පුරෝගාමී පාලන අධිකාරියේ 2020/21 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම**

| වර්ෂය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| 2020 | 61.92% | 78.66% |
| 2021 | 64.86% | 56.8% |

පුරෝගාමී පාලන අංශයේ 2020 වර්ෂයේ භෞතික ප්‍රගතිය 61.92% ක් සහ 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 64.86% වශයෙන් ද මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 78.66% ක් සහ 56.8% ක් වශයෙන් 2020 සහ 2021 වර්ෂවලදී දැකගත හැකි විය. මෙම වර්ෂ තුළ රට පුරා කොවිඩ් 19 වසංගතය පැතිරයාම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම අනුව යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මාර්ගගත ක්‍රම ඔස්සේ කටයුතු සිදු කරන ලදී. ඒ සමගම වරින් වර රට වසා දැමීම හේතුවෙන් පරිශ්‍ර පරීක්ෂාවන් සහ අනෙකුත් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සැලසුම් කරන ලද ආකාරයට ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

| සහභාගි වූ දිනය | පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | සහභාගී වූ නිලධාරින්/ අංශ | සම්පත් දායකත්වය | අරමුණ |
|---|---|---|---|---|---|
| 2021 (එක් අවුරුදු පාඨමාලාව) | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 9 | එච්. ඩබ්. තුෂාරි මිය<br>ටී. එස්. කේ. වීරසේකර මිය<br>බී. සී. ජීවන්ති මිය<br>එම්. ඩී. වික්‍රමගේ මයා<br>ජේ සී. රණසිංහ මිය<br>ඩබ්. කේ. ගයාන් ලක්මාල් මයා<br>එස්. ඒ. ඩී. සී. අබේසිංහ මිය<br>එස්. ඩබ්. ඒ. කුමාර මයා<br>ජේ. එම්. ඩී. නුවන්ති ජයසුන්දර මිය | කොළඹ විශ්වවිද්‍යාලය | කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ඒකකය මගින් පවත්වනු ලබන මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම. |
| 2021.01.06 සහ 07 දිනයන්<br><br>2021.11.07 සිට 2021.11.11 දක්වා<br><br>2021.11.08 සිට 2021.11.12 දක්වා | එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාල (UNODC) අත්පොත | 20 | ගයාන් ලක්මාල් මයා<br>රසික සම්පත් මයා<br>පූර්ණ ජයශ්‍රී මයා<br>ගාමිණී ජයලත් මයා<br>සමිත් ජයසේකර මයා<br>කුමාරී රත්නායක මිය<br>සුදීපා පෙරේරා මිය<br>දමයන්තී මිය<br>අතුල හේරත් මයා<br>ඉන්දික නලින් මයා<br>රසිකා නන්දනී මිය<br>චාන්දනී පෙරේරා මිය<br>අංජලී රාජපක්ෂ මිය | ප්‍රධාන කාර්යාලය අධ්‍යාපන අංශය | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2021.11.15<br>සිට<br>2021.11.19<br>දක්වා<br><br>2021.11.22<br>සිට<br>2021.11.26<br>දක්වා | | | එම්. කේ. කලංසූරිය මයා<br>දිසාලා වීරසිංහ මිය<br>ශ්‍යාම් සදමාල් මයා<br>ශෂික මධුරංග මයා<br>මංගලා ජයතිලක මිය<br>හෂිනි හේරත් මිය<br>අමිල මදුරප්පෙරුම මයා | | |
| 2021.01.13<br><br>2021.04.05 | Google දත්ත පද්ධතිය හැදෑරීම | 7 | පවිත්‍රා විජේතුංග මිය<br>ජී.ඩී. සුදර්ශිකා මිය<br>එච්. ඩී. දේශප්‍රිය මයා<br>යූනි පෙරේරා මිය<br>සමෘද්ධි පෙරේරා මිය<br>නිහතමානී බුලත්සිංහල මිය<br>හෂිනි ප්‍රබෝධා හේරත් මිය | ප්‍රධාන කාර්යාලය තොරතුරු තාක්ෂණ අංශය | Google දත්ත පද්ධතියේ යෙදවුම් සහ භාවිතය පිළිබඳ දැනුවත්භාවය ලබාදීම |
| 2021.03.04 | “සතිමත්බව” දියුණුව උදෙසා න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව | 7 | සුනිල් දිසානායක මයා<br>යූනි පෙරේරා මිය<br>සුබෝධා සෝමසිරි මිය<br>වික්‍රම සේනානායක මහතා<br>දිපිකා ප්‍රියදර්ශනී මිය<br>කුමාරි රත්නායක මිය<br>සුදීපා පෙරේරා මිය | සති පාසල කඩුවෙල | සතිමත්බව සම්බන්ධයෙන් න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබා දීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2021.07.21 | මූලික සංඛ්‍යානය පිළිබඳ මණ්ඩලයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 20 | මණ්ඩලීය කාර්ය මණ්ඩලය | එස්. ඒ. එම්. එස්. ප්‍රියදර්ශන මයා (පර්යේෂණ නිලධාරී) | සංඛ්‍යානමය විශ්ලේෂණය සම්බන්ධයෙන් දැනුවත්භාවය ලබා දීම |
| 2021.10.11 | සේවාලාභීන්ගේ විරමණ අපහසුතා කළමනාකරණය කිරීම | - | මණ්ඩලයේ සියලුම කාර්ය මණ්ඩලය | මනෝ වෛද්‍ය විශේෂඥ ගිහාන් අබේවර්ධන මයා | - |
| 2021.11.08 සිට 2021.11.12 දක්වා<br><br>2021.11.15 සිට 2021.11.19 දක්වා<br><br>2021-11-22 සිට 2021-11-26 දක්වා | මත්ද්‍රව්‍ය පරායත්තතාවයට (Drug Dependency) ප්‍රතිකාර කිරීම සහ රැකවරණ සේවාවන් සඳහා වන ගුණාත්මක ප්‍රමිතීන් පිළිබඳ නිවැරදි දැනුම කාර්ය මණ්ඩලයට ලබාදීම | 60 | ප්‍රතිකාර මධ්‍යස්ථාන නිලධාරීන්, නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නිලධාරීන්,<br>බාහිරසේවා නිලධාරින් | ප්‍රදීප් කොහොලානේගෙදර මයා<br>චාමර කරුණාරත්න මයා<br>එම්.එම්.ජී.බී.එම්. රෂාඩ් මයා<br>සුපුන් උදාන මයා<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශක සුචින්තන දසුන් මයා<br>ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන ඒකකයේ වෛද්‍ය | මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාරය හා පුනරුත්ථාපන යන ක්ෂේත්‍රයන්හි සේවය කරනු ලබන නිලධාරීන්ට අවශ්‍ය නිවැරදි ප්‍රායෝගික තාක්ෂණික දැනුම ලබාදීම.<br>නිලධාරීන් වෙත ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීමය පුහුණුවක් ලබාදීම.<br>දිනෙන් දින අලුත්වන මත්ද්‍රව්‍ය විෂයට අදාල යාවත්කාලීන දැනුම ඔවුන් වෙත සම්ප්‍රේෂණය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | දර්ශනී මල්ලිකාරච්චි මිය<br>එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාල නියෝජිත වටරුක ශිනෝ මයා | කිරීම. |
| 2021.11.16 | විනය ක්‍රියා පරිපාටිය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 3 | එස්. ටී. වැරණියගොඩ මිය<br>ඩී. ඒ. සී. එම්. ජයමාන්න මිය<br>එම්. ඩී. ඩී. ආර්. ජයවර්ධන මයා | ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | විනය ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුවත් කිරීම් |
| 2021.11.17 | මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය පිළිබඳව ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථාන නිලධාරින් දැනුවත් කිරීම | 31 | රජයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශ නිලධාරින්<br>නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නිලධාරින් | ඒ. ටී. දර්ශන මයා<br>පී. එන්. එස්. තිසේරා මිය | මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියෙහි වැදගත්කම සහ එයට දත්ත යොමු කිරීමේ ආකෘති පත්‍රය සම්බන්ධයෙන් දැනුවත් කිරීම |
| 2021.12.16<br>2021.12.17 | රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම | 1 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | කොකිලා අතාවුද මිය | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ISO/IEC 17025 : 2017 අනුව | | | | |
| 2021.12.20<br>2021.12.21<br>2021.12.22 | ISO/IEC 17043 : 2010 අනුව ප්‍රවීණතා පරීක්ෂණ සපයන්නන්ගේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම සහ ISO/IEC 17025 සහ ISO/IEC 17043 යන දෙකම ආවරණය වන පරිදි ISO/IEC 17025 තත්ත්ව පද්ධතිය සංවර්ධනය කිරීම | 1 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | කල්පනා මුතුමාල මිය | |

## 12. ආයතනික සමාජ වගකීම පිළිබඳ වාර්තාව

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පනත ප්‍රකාරව මණ්ඩලය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් සමාජය වෙත සේවා සපයන කාර්යයන් වන අතර ඒ අනුව වර්ෂය පුරාම මණ්ඩලය විසින් එම සමාජීය වගකීම ඉටු කරනු ලබයි. මණ්ඩලයේ සියලු කටයුතු සඳහා ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් සපයාගන්නා බැවින් පවතින සම්පත් අනුව මණ්ඩලයෙන් සැපයූ සේවාවන්ට අමතරව ශ්‍රී ලාංකීය සමාජය වෙත 2021 වර්ෂය තුලදී පහත සේවා ද සැපයුමට කටයුතු කර ඇත.

"මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවූවන් සඳහා උපදේශන වැඩසටහන" නමින් වතුපිටිවල රෝහලේ මානසික සෞඛ්‍ය සායනය (සුව පියස) වෙත පැමිණෙන මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවූවන් භාවිතයෙන් නිදහස් වීම සඳහා 2021.07.02, 30/ 2021.08.06/ 2021.09.03, 17, 24/ 2021.10.01, 29/ 2021.11.12, 19 සහ 2021.12.03, 31 යන දිනයන්හි දී අවශ්‍ය උපදේශන මැදිහත් වීම ලබා දෙන ලදි.

නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ නේවාසික සේවාලාභීන් හට වතුපිටිවල රෝහලේ ලිංගාශ්‍රිත රෝග සායනයේ වෛද්‍යතුමිය හා කාර්ය මණ්ඩලය විසින් "ලිංගාශ්‍රිත රෝග සායනය" නමින් 2021.10.10 වන දින දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

## 13. විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

**හැඳින්වීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 (1) වගන්තියට අනුව, ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරන ලද ආයතනයක් තුළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් හෝ පාලක මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීම අනිවාර්ය අවශ්‍යතාවයකි. තවද, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2019.01.12 දිනැති DMA 01-2019 දරන චක්‍රලේඛයේ 05 ඡේදය මගින් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමේ අවශ්‍යතාවය සහ කමිටු සංයුතිය දක්වා ඇත.

ඒ අනුව, විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායන් සඳහා යහපාලනයේ මාර්ගෝපදේශවල 7.4.1 වගන්තියට අනුව හා 2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED-55 මගින් මෙහි සංශෝධනයන් ඇතුළත් කොට ඇත.

තවද, ජාතික විගණන පනතේ 41 වන වගන්තියට අනුව, විගණන හා කළමනාකරණ කමිටුව විසින් මූල්‍ය හා වත්කම් කළමනාකරණය සහ විගණනය කරන ලද ආයතනයේ සියළුම අංගයන් සමාලෝචනය කරනුයේ සම්පත් කලින් තීරණය කළ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථික හා කාර්යක්ෂමව භාවිතා කරන බව සහතික කිරීම සඳහාය.

**සංයුතිය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි විගණන හා කළමනාකරණ කමිටුව මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ද ඇතුළත්ව විධායක නොවන මණ්ඩල සාමාජිකයින්

තිදෙනෙකුගෙන් සමන්විත වේ. මණ්ඩලයේ අභ්‍යන්තර විගණක කාර්තුමය රැස්වීම කැඳවීම සිදු කරනු ලබන අතර මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා විගණන හා කළමනාකරණ කමිටුවෙහි සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබේ. ජාතික විගණන කාර්යාලයේ නිල නියෝජිතයින් සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විගණන හා කළමනාකරණ කමිටුවෙහි නිරීක්ෂකයින් ලෙස සහභාගී වේ.

**කාර්යභාරය**

කමිටු සාමාජිකයින් විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර, ඒවා සම්පූර්ණ සහ අනුකූලද යන්න සලකා බැලීම සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ප්‍රතිපත්තිවලට අනුකූලව තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.

අභ්‍යන්තර විගණන ඒකකයේ කටයුතු සඳහා 2021 වර්ෂය සඳහා ආයතනයේ කාර්යභාරය අනුව සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ඇගයීම් සිදු කරන ලදි. ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය සහ ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම, අනාගතයේදී නැවත නැවත සිදුවන අඩුපාඩු වැළැක්වීම සහ නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින් විශේෂ විගණන සහ කළමනාකරණ ප්‍රතිකර්ම පිළිබඳව අවධානය යොමු කරන ලදි. 2020.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්යයන්/ මෙහෙයුම් සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සඳහා ලබා දී ඇති පිළිතුරු විශේෂයෙන් අවධාරණය කරන ලද ගැටලු පිළිබඳ පසු විපරම් කරන ලදී.

**අවදානම් කළමනාකරණය සහ රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය සහ සමාලෝචන කමිටුව ලෙස ද ක්‍රියා කරනු ලැබේ.

**අනුකූල වීම්**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අර්ථ දැක්වීම්වලට අනුකූලව අදාළ පාර්ශව ලේඛනගත කිරීමේ ක්‍රියා පරිපාටිය, වාර්ෂික පදනමින් ආයතනය විසින් කළ යුතු හෙළිදරව් කිරීම්වලට අදාල ක්‍රියා පරිපාටිය, ආරක්ෂණ සංකල්පයට අනුව අදාල ක්‍රියා පටිපාටීන්, නීති රීති විධාන හා පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හා විශේෂ විධි විධාන, ආයතනයේ ගිණුම්කරණ රෙගුලාසි අනුව සිදු කළ යුතු හෙළිදරව් කිරීම්ද ඇතුලු කරුණුවල ඵලදායිත්වය සමාලෝචනය කරන ලදි.

**2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්ය සාධනය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමාලෝචිත වර්ෂයේ (2021) ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කර ඇති අතර, එය සියලු ක්‍රියාකාරී ක්ෂේත්‍රවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නංවන අතර, නිරීක්ෂණය කරන

ලද අපගමනයන් මඟහරවා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන ලදි. එපමණක් නොව, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා මගින් ඉස්මතු කර ඇති කරුණු සමාලෝචනය කරන අතරම, අධ්‍යක්ෂ මණ්ඩලයට සුදුසු ප්‍රතිකර්ම යෝජනා කිරීමටත්, අදාළ බලධාරීන් සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය වාර්තා කිරීමටත් පියවර ගන්නා ලදි.

විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් සහ වගකීම් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් දක්වන සහයෝගය හා දායකත්වය අගය කරනු ලැබේ.

සී.ඩබ්.කේ. ධර්මසේන
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

## 14. ආදායම් ප්‍රකාශය

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | **සටහන අංකය** | | |
| රාජ්‍ය පුනරාවර්ථන ප්‍රදාන | සටහන 1 | 243,944,000.00 | 249,463,501.00 |
| වෙනත් ආදායම් | සටහන 2 | 41,568,026.21 | 9,833,084.84 |
| ස්ථාවර වත්කම් විකණීමෙන් ලද ලාභය | සටහන 3 | | 39,755.00 |
| | | **285,512,026.21** | **259,336,340.84** |
| **වියදම්** | | | |
| පුද්ගල හා පරිපාලන පිරිවැය | සටහන 4 | 177,351,884.47 | 191,990,707.70 |
| වෙනත් මෙහෙයුම් පිරිවැය | සටහන 5 | 38,270,600.52 | 36,027,375.22 |
| දේශීය/ විදේශීය ආයතන දායකත්වය | සටහන 6 | 330,000.00 | 485,000.00 |
| නිවාරණ අධ්‍යාපන අංශය පිරිවැය | සටහන 7 | 1,070,275.03 | 1,475,765.86 |
| ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිරිවැය | සටහන 8 | 23,284,159.22 | 14,650,455.64 |
| පර්යේෂණ අධ්‍යයන පිරිවැය | සටහන 9 | 1,422,681.96 | 2,566,710.43 |
| බාහිර සේවා පිරිවැය | සටහන 10 | 3,257,625.21 | 1,773,269.93 |
| රසායනාගාර පිරිවැය | සටහන 11 | 961,112.02 | 1,764,061.88 |
| බන්ධනාගාර හා අනිකුත් මධ්‍යස්ථාන පිරිවැය | සටහන 12 | 49,225.00 | 76,690.00 |
| මානව සම්පත් සංවර්ධන පිරිවැය | සටහන 13 | 1,149,796.75 | 16,640.00 |
| මූල්‍ය පිරිවැය | සටහන 14 | 96,974.00 | 69,950.00 |
| ක්ෂයවීම් | සටහන 15 | 23,249,642.71 | 21,136,992.05 |
| මුළු මෙහෙයුම් පිරිවැය | | 270,493,976.89 | 272,033,618,71 |
| **අතිරික්තය හෝ හිඟය** | | **15,018,049.32** | **(12,697,277.87)** |

## 15. ශේෂ පත්‍රය

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

| | | 2021 | | 2020 | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | | | |
| බැංකුවේ ඇති මුදල | සටහන 16 | 27,146,690.30 | | 4,153,453.49 | |
| තොග | සටහන 17 | 5,332,586.88 | | 4,367,293.10 | |
| ඉදිරියට කල ගෙවීම් | සටහන 18 | 857,487.13 | | 363,600.62 | |
| ලැබිය යුතු ආදායම් | | 285,422.31 | | 1,565,000.00 | |
| අත්තිකාරම් | සටහන 19 | 1,782,059.50 | | 1,849,464.50 | |
| | | | **35,404,246.12** | | **12,298,811.71** |
| ණයගැති - අත්තිකාරම් | සටහන 20 | 508,812.96 | | 508,812.96 | |
| අයවිය යුතු ආපදා ණය හා උත්සව අත්තිකාරම් | සටහන 21 | 18,213,396.00 | | 13,597,659.00 | |
| WIP නව ගොඩනැගිල්ල | සටහන 22 | 18,056,142.20 | | 556,142.20 | |
| මෘදුකාංග | | - | | 928,085.00 | |
| | | | **36,778,351.16** | | **15,590,699.16** |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | සටහන 23 | 500,557,663.81 | **500,557,663.81** | 503,816,242.08 | **503,816,242.08** |
| **මුළු වත්කම්** | | | 572,740,261.09 | | 531,705,752.95 |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ණයහිමියෝ | සටහන 24 | 144,220.00 | | 168,040.00 | |
| උපචිත වියදම් | සටහන 25 | 10,763,382.12 | | 8,313,128.63 | |
| රඳවාගත් මුදල් | සටහන 26 | 196,140.00 | | 274,459.00 | |
| | | | **11,103,742.12** | | **8,755,627.63** |
| NNL පරීක්ෂණ - රියදුරු | | | 10,000,000.00 | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | සටහන 27 | 58,433,472.50 | | 61,566,421.25 | |
| ගෙවිය යුතු පාරිතෝෂික | සටහන 27 | 738,078.75 | **59,171,551.25** | - | **61,566,421.25** |
| **හිමිකම්** | | | | | |
| රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානය | සටහන 28 | 106,737,946.94 | | 90,264,946.94 | |
| ප්‍රාග්ධන වෙන්කරීම් | | 65,503,710.68 | | 65,503,710.68 | |
| ප්‍රත්‍යාගණන වෙන්කරීම් | | 463,691,481.79 | | 462,720,932.38 | |
| අවිනිශ්චිත ගිණුම | | 480,899.89 | | 480,899.89 | |
| අතිරික්තය/ ඌනතාවය | | (143,949,071.58) | | (157,586,785.82) | |
| මුළු හිමිකම් | | | **492,464,967.72** | | **461,383,704.04** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | | 572,740,261.09 | | 531,705,752.95 |

ගිණුම්වලට අදාල ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අත්‍යාවශ්‍ය කොටසකි. ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරන්නේ දෙසැම්බර් 31වන දිනට රාජ්‍ය කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දීමට බව සහතික කරමු. 2021 සහ එහි අතිරික්තය/ (හිගය) අවසන් වූ වර්ෂය සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයන් රජයේ නීති සහ රෙගුලාසිවලට අනුකූල වේ.

**අධ්‍යක්ෂ මූල්‍ය (වැඩබලන)**
**අ.ඖ.පා.ජා.ම**

**සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්**
**අ.ඖ.පා.ජා.ම**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ආදායම් ප්‍රකාශය, ශේෂ පත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ස්කන්දය වෙනස්වීමේ ප්‍රකාශය යන මූල්‍ය වාර්තා මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

**මණ්ඩලික සාමාජික**
**අ.ඖ.පා.ජා.ම**

**මණ්ඩලික සාමාජික**
**අ.ඖ.පා.ජා.ම**

## 16. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1. සංස්ථාමය තොරතුරු

### 1.1 වසතිය සහ නීත්‍යානුකූලභාවය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන පනතින් ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම ආයතනය අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

### 16.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**(සාමාන්‍ය)**

### 16.1.1 සකස් කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සඳහා බලපානු ලබන උද්ධමන සාධක සඳහා ගැලපුම් කර නොමැත. අදාළ තැන්හි භාවිත කළ විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල පැහැදිලි කර ඇත. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට ඉදිරිපත් කර ඇත.

### 16.1.2 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා පෙර වර්ෂයට අදාළ අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා ඉදිරිපත් කර තිබේ.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ ප්‍රතිවර්ගීකරණය කිරීම සංශෝධනය කර ඇතිවිට, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් ලබා දීම පිණිස ප්‍රවර්ථන වර්ෂය සමඟ අනුකූල වන පරිදි සංසන්දනාත්මක අගයන් ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

### 16.1.3 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය අගය අඩු කර දක්වා ඇත. සින්නක්කර ඉඩම් හැරුණු විට දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය අගය වෙන් කිරීම ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සමාන වාරිකවලින් ලියා හැරීම පිණිස ඒවායේ ආගණනය කළ අගය මත පහත පරිදි ගණනය කරනු ලබයි.

| | අනුපාතය (%) |
|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5 |
| ගෘහභාණ්ඩ | 10 |
| කාර්යාල උපකරණ | 20 |

| | |
|---|---|
| සවිකිරීම් | 20 |
| පුස්තකාල පොත් | 25 |
| වාහන | 25 |
| මුළුතැන්ගෙයි උපකරණ | 20 |
| ගෙවතු වගා උපකරණ | 20 |
| රසායනාගාර උපකරණ | 20 |
| වෙනත් පිරියත සහ උපකරණ | 20 |

2016 වර්ෂයට පෙර මිලදී ගත් වත්කම් සඳහා සරල මාර්ග ක්‍රමය මත වත්කම් මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම සහ ඉවත් කරන දින වන තුරු ක්ෂය කිරීම් සිදු කරනු ලබන අතර 2016 වර්ෂයේ සිට ඉදිරියට මිලදී ගත් වත්කම් සඳහා මිලදී ගත්/ ඉවත් කරන දිනය මත පදනම්ව ක්ෂය ගණනය කරනු ලැබේ.

මෝටර් වාහන, ප්‍රධාන කාර්යාලයේ ඉඩම සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයන් මත දැක්වෙන අතර අනෙකුත් සියලුම වත්කම් වර්ගීකරණ පිරිවැයට දැක්වේ.

තලංගම හා ගාල්ල මධ්‍යස්ථානවල ඉඩම් හා ගොඩනැගිලි අයිතිය සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වේ.

ව්‍යාපාරික වටිනාකමක් නොමැති නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාතික මාදක රසායනාගාරය භාරයේ තබාගෙන ඇත්තේ, නිතීය ක්‍රියාත්මක කිරීම අදාළ ආයතන සඳහා පවත්වනු ලබන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා ප්‍රදර්ශන කටයුතුවලට යොදා ගැනීමටය.

පහත වත්කම් කල්බදු පදනම මත මිලදී ගෙන ඇත.

| කල්බදු දේපළ | වටිනාකම රු. | කල්බදු කාලසීමාව |
|---|---|---|
| අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය | 4,350,000.00 | අවුරුදු 99 |
| පිටිපන ඉඩම | 4,027,518.00 | අවුරුදු 30 |
| හන්දෙස්ස ඉඩම, නුවර | 1,893,051.00 | - |
| මාහේන වතුයාය | 13,062,750.00 | අවුරුදු 30 |

අප මණ්ඩලයේ ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීම සිදු කරන බව දන්වා සිටිමු. නමුත් කොවිඩ් 19 වසංගතයේ සීඝ්‍ර ව්‍යාප්තිය හේතුවෙන් 2021.12.31 මූල්‍ය වාර්තාවට එම තොරතුරු ඇතුළත් කිරීමට අපට නොහැකි විය.

### 16.1.4 කල්බදු දේපළ

2016.03.04 සිට 2046.03.03 දක්වා වසර 30ක කාලයක් සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමඟ බදු ගිවිසුම අත්සන් කර ඇත. මෙම මුදල තුළ එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත් නොවන අතර වසර 30ක කුළී ගෙවීම්, මුද්දර ගාස්තු හා නීතිඥ ගාස්තු ඇතුළත් වේ.

පෙර වර්ෂයේ කල්බදු කුලී වසර 5ක් සඳහා ගෙවා ඇති අතර එම අගය වසර පහක් ඇතුළත සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලැබේ.

### 16.1.5 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

සේවයේ පළමු වසරින් ආරම්භ වී අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සෑම නිලධාරියෙකුගේම මූල්‍ය වර්ෂයේ අවසන් මස වැටුපෙන් අඩක් මත පදනම්ව ගණනය කරන ලද අගයකට සමානව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන මෙම මූල්‍ය ප්‍රකාශයන් මඟින් සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ අඛණ්ඩ වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත පමණක් නිලධාරියෙකුට පාරිතෝෂික ගෙවනු ලැබීමට හිමිකම් ලබනු ඇත.

### 16.1.6 වෙළඳ ලැබීම්

වෙළඳ ලැබීම් සටහන් කරනු ලබන්නේ අපේක්ෂිත ලැබිය හැකි වටිනාකමටය. වසර අවසාන වන විට පවතින සියලුම නොපියවූ මුදල් හි සමාලෝචනයක් මත පදනම්ව අඩමාන ලැබීම් සඳහා ඇස්තමේන්තුවක් සකස් කරනු ලබයි. හඳුනාගත් වර්ෂය තුළ දී බොල් ණය කපා හැරේ.

### 16.1.7 මුදල් සහ මුදල් හා සමාන අයිතම

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අරමුණු සඳහා මුදල් හා සමාන අයිතම ලෙස අතැති මුදල්, බැංකු තැන්පතු, බැංකු අයිරාවන් හි ශුද්ධ වටිනාකම අන්තර්ගත වේ. ශේෂ පත්‍රයේ ජංගම බැරකම් තුළ ණය ගැනීම යටතේ බැංකු අයිරාවන් ඇතුළත් කර ඇත.

### 16.1.8 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය ගැළපීම් සහ හෙළි කිරීම් සිදු කරනු ලබයි.

### 16.1.9 බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනට හඳුනාගත් සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කරනු ලබන අතර පවතින බවට හඳුනාගන්නා ලද එහෙත් මුදල නිවැරදිව නිශ්චය කළ නොහැකි බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසනු ලැබේ.

### 16.1.10 සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ප්‍රතිපාදන

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට දායකත්වය ලැබීමට සේවකයන් සුදුසුය. සේවකයන්ගේ දළ වැටුප මත මණ්ඩලය විසින් ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් සඳහා පිළිවෙලින් 12% සහ 3% බැගින් දායකත්වය සපයනු ඇත.

**16.1.11 ආදායම**

**16.1.11.1 පුනරාවර්ථන ස්වරූපයේ ප්‍රතිපාදන**

පුනරාවර්ථන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලද ප්‍රතිපාදන, ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර මණ්ඩලය විසින් උපයාගනු ලබන සියලු ආදායම් වෙනත් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශනවලට සෘජුවම හඳුනාගනී.

**16.1.11.2 ප්‍රාග්ධන ස්වරූපයේ ප්‍රතිපාදන**

ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලබා දෙන ප්‍රතිපාදන අදාළ වියදම් වාර්තා කිරීම මඟින් අඩුකොට ඇත.

**16.1.12 වියදම්**

වියදම ඉක්මවූ ආදායම ගණනය කිරීමේ දී මණ්ඩලය පවත්වාගෙන යාම වෙනුවෙන් දරන ලද පුනරාවර්ථන ස්වරූපයේ සියලුම වියදම් ආදායමට අය කරගෙන ඇත.

**16.1.13 භාණ්ඩ තොගය**

භාණ්ඩ තොගය පිරිවැයට හඳුනාගන්නා අතර පෙර ඇතුළු පෙර පිට ක්‍රමය යටතේ අගය කරනු ලැබේ.

**16.1.13.1 ජාතික මාදක රසායනාගාරයේ අනතුරුදායක මත්ද්‍රව්‍ය තොගය**

පහත සදහන් මත්ද්‍රව්‍ය වර්ග හඳුන්වාදීම සඳහා රසායනාගාරයේ පවති.

| වර්ගය | ප්‍රමාණය (ග්‍රෑම්) |
|---|---|
| අබිං | 537.33 |
| හෙරොයින් | 607.98 |
| ගංජා/ කංසා පැළෑටි ද්‍රව්‍ය | 461.60 |
| කොකේන් | 463.49 |
| මෙතැම්පිටමින් | 0.61 |
| එක්ස්ටසි එම්.ඩී.එම්.ඒ | 9.79 |
| බාබිටියුරේටිස් | 0.06 |
| එල්.එස්.ඩි | 0.054 |
| සයිලොසීන් එන්පිඑස් | 5.86 |
| පෙනිතිලැමයින් | 0.01 |
| ඉබෝගනීන් | 6.96 |
| කාත් පැළෑටි ද්‍රව්‍ය | 126.08 |

16.1.14 ප්‍රත්‍යාගණනය

මණ්ඩලය විසින් මෝටර් රථ සහ රාජගිරියේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉඩම සහ ගොඩනැගිල්ල තක්සේරු කර ඇත.

| වත්කම් වර්ගය | ප්‍රත්‍යාගණනය කිරීමේ දිනය | ප්‍රත්‍යාගණනය කිරීමේ පාර්ශව | ප්‍රත්‍යාගණන වටිනාකම (රු.) |
|---|---|---|---|
| ඉඩම | 2018-03-28 | පළාත් තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව | 365,000,000.00 |
| ගොඩනැගිලි | 2018-03-28 | පළාත් තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව | 81,418,000.00 |
| මෝටර් රථ | 2014-02-19 | - | |
| WP KR 4875 | | | 4,200,000.00 |
| WP KF 2801 | | | 2,300,000.00 |
| 301-9695 | | | 1,600,000.00 |
| 19-9679 | | | 1,000,000.00 |
| 64-4315 | | | 1,700,000.00 |
| 32-4515 | | | 2,000,000.00 |
| WP NB 1258 | | | 7,000,000.00 |
| 129-7344 | | | 20,000.00 |
| WP XC 8708 | | | 135,000.00 |
| 51-7214 | | | 1,400,000.00 |
| WP HQ 6503 | | | 35,000.00 |
| WP HQ 6505 | | | 40,000.00 |
| WP YU 6932 | | | 350,000.00 |
| WP YU 6934 | | | 350,000.00 |
| WP YU 6938 | | | 390,000.00 |
| WP YU 6933 | | | 375,000.00 |
| 54-0014 | | | 1,200,000.00 |
| WP PB 4613 | | | 2,500,000.00 |
| WP XC 8705 | | | 70,000.00 |

## 16.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම

### 16.2.1 ක්ෂය ප්‍රතිපත්තිය

2016 වර්ෂයේ සිට මිලදී ගත් වත්කම් සඳහා ක්ෂය ක්‍රමය, මිලදී ගත් වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමේ ක්‍රමයේ සිට මිලදී ගත් වර්ෂයේදී දින පදනම මත ක්ෂය කිරීමේ ක්‍රමයට වෙනස් වේ.

## 16.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශ

වක්‍ර ක්‍රමය උපයෝගි කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත. මුදල් හා මුදල් සමාන අයිතම සඳහා මණ්ඩලයේ බැංකු ශේෂයන් අන්තර්ගත වේ.

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්ඕ/සී /එන්ඩීඩීසීබී/ FS /2021/03

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජුලි 08 දින

සභාපති

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

| මගේ අංකය / எனது இல. / My No. | විඑච්ඕ/සී /එන්ඩීඩීසීබී/ FS /2021/03 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2022 ජූලි 08 දින |
|---|---|---|---|---|---|

සභාපති

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය ප්‍රකාරව, වත්කම ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව 2017 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.73,583,056 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවලින් මුළු පිරිවැය රු.10,447,264 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. ඒ හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුළු පිරිවැය රු.63,135,792 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එහි පිරිවැයටත් මුළු පිරිවැය රු.10,447,264 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එහි ප්‍රත්‍යාගණන අගයටත් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.195,730,952 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒසේ වුවත් මෙම වත්කම වල ඵලදායි ජීවිත කාලය පිලිබද වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ වගකීම රු.58,433,472 ක් ලෙස හෙළිදරව් කර තිබුණු නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 59 ඡේදය ප්‍රකාරව, එම වගකීම වට්ටම් කිරීමේ පදනම මත අගය කර නොතිබුණි.

(ඈ) 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.928,085 ක් වූ අස්පෘෂ්‍ය වත්කම් වෙනම අයිතමයක් ලෙස හෙළිදරව් කර නොතිබුණු අතර ඒ වෙනුවට දේපළ පිරියත හා උපකරණවල පිරිවැයට එකතු කර දක්වා තිබුණි. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 117 ඡේදය ප්‍රකාරව අස්පෘෂ්‍ය වත්කම් සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතු තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) 2021 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.480,900 ක් වුවද, එය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය රු.781,474,979 ක් වුවද, උපලේඛන අනුව පිරිවැය රු.776,241,278 ක් වූයෙන් වෙනස රු.5,233,701 ක් විය. තවද, එදිනට දේපළ, පිරියත හා උපකරණ ක්ෂය වෙන් කිරීම් රු.280,360,464 ක් වුවද, උපලේඛන අනුව එය රු.286,896,302 ක් වූයෙන් වෙනස රු.6,535,878 ක් විය. මෙම වෙනස්කම්වලට හේතු ඉදිරිපත් නොකෙරුණි.

(උ) 2021 දෙසැම්බර් 31 දිනට රු.1,782,060 ක් වූ අත්තිකාරම් ගිණුමේ හර ශේෂය වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට චලනය නොවී පවතින අතර එම ශේෂයෙහි නිරවද්‍යතාවය සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව,මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දර ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දර ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ), (ආ), (ඇ), (ඉ), (ඊ) සහ (උ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්තා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති/විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 138 | සෑම ගෙවීම් වවුචරයක්ම බලයලත් නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රු.3,260,941 ක ගෙවීම් වවුචර් 24 ක් සහතික කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයකදී නිරීක්ෂණය විය. |
| | (ii) මුදල් රෙගුලාසි 156 (5) | මුදල් පොතෙහි සහ මුදල් සම්බන්ධ ලියකියවිලිවල වෙනස්කම් සිදුකර තිබුණු නමුත් මුදල් රෙගුලාසිය ප්‍රකාරව එම පොත් හා ලියකියවිලිවල මුලින් අත්සන් කර ඇති හෝ ඒ සඳහා බලය ඇති වෙනත් නිලධාරියෙකු විසින් හෝ නම සම්පූර්ණ අත්සන යොදා සහතික කර නොතිබුණු අවස්ථා 08 ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණයකදී නිරීක්ෂණය විය. |
| | (iii) මුදල් රෙගුලාසි 225 | නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් ගෙවීම් වවුචර පිළියෙළ කර නොතිබුණු අවස්ථා 32 ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණයකදී නිරීක්ෂණය විය. |
| | (iv) මුදල් රෙගුලාසි 395 | මණ්ඩලය සතු ජංගම ගිණුම් 04ට අදාළව පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශන ගෙවන නිලධාරියා විසින් සහතික කර නොතිබුණි. |

(v) මුදල් රෙගුලාසි 446 (2) | සියලුම සටහන් සහ මුදල් ශේෂය නිවැරදි බවට සහතිකයක් ලෙස වගකිව යුතු අධීක්ෂක හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් මුදල් පොත අත්සන් කර නොතිබුණි.

(vi) මුදල් රෙගුලාසි 754 | මණ්ඩලයෙහි නවදිගන්තය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානයෙහි ඉන්වෙන්ට්‍රි ලේඛන තුලනය කර වසර අවසානයේ ශේෂය ඉදිරියට ගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

